# 1

# ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව, ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති

## 1.1 සමස්ත නිරීක්ෂණ

**ශ්‍රී ලංකා ආර්ථිකය, අවිනිශ්චිත කාලසීමාවකින් පසු 2016 වසර තුළ දී, රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සඳහා ප්‍රතිචාර දක්වමින් ක්‍රමයෙන් ස්ථායී බවට පත් වීමේ මූලික ලක්ෂණ පෙන්නුම් කළේය.** අයහපත් කාලගුණික තත්ත්වයෙහි බලපෑම හා ගෝලීය ආර්ථිකය සෙමෙන් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් පෙර වසරේ දී වාර්තා කරන ලද සියයට 4.8 ක මූර්ත ආර්ථික වර්ධනය හා සැසඳීමේ දී ශ්‍රී ලංකා ආර්ථිකය 2016 වසර තුළ දී සියයට 4.4 ක මන්දගාමී වර්ධනයක් වාර්තා කළ ද, දැඩි රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම මධ්‍යයේ පවා වසරේ දෙවැනි කාර්තුවේ සිට ක්‍රමයෙන් ශක්තිමත් වන කාර්තුමය ආර්ථික වර්ධනයක් දක්නට ලැබුණි. විශේෂයෙන්, ඉදිකිරීම් අංශය ප්‍රධාන කොටගෙන ආයෝජන වියදම ඉහළ යෑම වසර තුළ ආර්ථික වර්ධනයට මූලිකව හේතු වූ අතර, ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර වශයෙන් පරිභෝජන වියදමෙහි වර්ධනය මන්දගාමී විය. වසරේ පළමු සිව්මස තුළ අඩු මට්ටමක පැවති උද්ධමනය පසුව ක්‍රමයෙන් ඉහළ ගිය අතර, 2016 වසර අවසානය වන විට ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013 = 100) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013 = 100) යන දර්ශක අනුව මනිනු ලබන වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සියයට 4.0 ක් විය. 2016 වසරේ ඇතැම් මාස මෙන්ම, 2017 වසරේ පළමු කාර්තුව තුළ දී ඉහළ උද්ධමනයක් ඇති වීම සඳහා කාලගුණික හේතු නිසා ඇතිවූ අවහිරතාවල අයහපත් බලපෑම, රජයේ බදු සංශෝධන හා ජාත්‍යන්තර භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම හේතු වුව ද, මූලික උද්ධමනය ඉහළ මට්ටමක පැවතීම තුළින් ආර්ථිකයෙහි ඉහළ යමින් පැවති ඉල්ලුම් පීඩන පිළිබිඹු විය. දේශීය ආර්ථිකයෙහි ඇතැම් අංශ වෙතින් ආනයන සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම, සීමිත දේශීය භාණ්ඩ පැස සඳහා වන විදේශීය ඉල්ලුම දුර්වල මට්ටමක පැවතීම, විදේශීය ඍජු ආයෝජන ප්‍රවාහ ආකර්ෂණය කර ගැනීමට දිගින් දිගටම නොහැකි වීම මෙන්ම, විශේෂයෙන්ම රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ මත බලපෑම් ඇති කිරීමට හේතු වූ විදේශ පොලී අනුපාතික ඉහළ යෑමෙහි බලපෑම විදේශීය අංශයෙහි ගිණුම්වල විචලනයන් තුළින් පෙන්නුම් කළේය. සංචාරක ඉපැයීම්, වෙනත් සේවා අපනයන මෙන්ම, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ යෑම මධ්‍යයේ වුව ද, මෙම අයහපත් ප්‍රවණතා හේතුවෙන් ගෙවුම් තුලනය අඛණ්ඩව දෙවැනි වසරටත් හිඟයක් වාර්තා කළේය. වසරේ පළමු සිව්මස තුළ දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මහ බැංකුවේ ඉහළ මැදිහත්වීමක් අඛණ්ඩව පැවති අතර, එම නිසා එම කාලය තුළ විනිමය අනුපාතිකය ස්ථාවරව පැවතිණ. කෙසේ වුව ද, ඉන් පසු කාලසීමාවේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ඉවත් කරගැනීම හේතුවෙන් විනිමය අනුපාතිකය මත ඇති වන පීඩනය මැඩපැවැත්වීම සඳහා පමණක් සිදුකරන ලද මහ බැංකුවේ මැදිහත්වීම සීමා කිරීම තුළින් විනිමය අනුපාතිකය වැඩි වශයෙන් වෙළඳපොළ තත්ත්වය අනුව හැඩ ගැසීමට ඉඩ සලසනු ලැබිණ. ඉල්ලුම් පීඩන තුළින් උද්ධමනය ඉහළ යෑමට ඇති හැකියාව හේතුවෙන් මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමටත්, දැඩි මුදල් තත්ත්වයක් පවත්වා ගැනීමටත් ශ්‍රී ලංකා මහ බැංකුව වසර පුරා කටයුතු කළේය. ඒ අනුව, 2016 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලුම රුපියල් තැන්පතුවලට අදාළ

1

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2015 දෙසැම්බර් මස දී ඉහළ නැංවීම සහ තෝරාගත් සාර්ව විචක්ෂණ ඉල්ලුම් කළමනාකරණ උපකරණයක් ලෙස වටිනාකම මත උපරිම ණය අනුපාතිකයක් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව පළමුව, 2016 පෙබරවාරි මාසයේ දීත් දෙවනුව, 2016 ජූලි මාසයේ දීත් සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික දෙවතාවක දී පදනම් අංක 100 කින් ඉහළ නැංවීය. මහ බැංකුවේ විවට වෙළඳපොළ කටයුතු තුළින් ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාව දක්වා කෙටිකාලීන පොලී අනුපාතික මෙහෙයවනු ලැබූ අතර, එමගින් වෙළඳපොළ පොලී අනුපාතික ව්‍යුහය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මුදල් තත්ත්වය ක්‍රමයෙන් දැඩි වීම හේතුවෙන් පුළුල් මුදල් සැපයුම වර්ධනය වීමේ වේගය පාලනය වූ අතර, 2016 වසරේ ජූලි මස දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 28.5 ක ඉහළම වර්ධනයක් වාර්තා කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සපයන ලද ණය ප්‍රමාණයෙහි වර්ධනය ද වසර අවසානය වන විට සියයට 21.9 ක් දක්වා මන්දගාමී විය. කෙසේ වුව ද, මුදල් හා ණය ප්‍රසාරණය පහත වැටීමේ වේගය අපේක්ෂිත මට්ටමට වඩා අඩු මට්ටමක පැවතිණ. ඒ අනුව, උද්ධමන අපේක්ෂා කළමනාකරණය සඳහා වැඩි ප්‍රමුඛතාවක් සහිත ඉදිරි කාලීන දැක්මකින් යුතු මුදල් ප්‍රතිපත්ති රාමුවක් තුළ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මහ බැංකුව, මැදි කාලීන වශයෙන් උද්ධමනය මැදි-තනි අගයක පවත්වා ගැනීමේ සිය අභිලාෂය වෙළඳපොළ වෙත පෙන්නුම් කරමින්, 2017 මාර්තු මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික නැවතත් පදනම් අංක 25 කින් ඉහළ නැංවීය. මේ අතර, විදේශීය හා දේශීය යන දෙඅංශයෙහිම පවතින අභියෝගාත්මක වෙළඳපොළ තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කරමින්, ආර්ථිකයෙහි මූල්‍ය අංශය වසර තුළ දී තවදුරටත් පුළුල් විය. මේ අතර, රාජ්‍ය මූල්‍ය කටයුතුවල ආදායම් හා වියදම් යන දෙඅංශයෙන්ම යහපත් ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරමින් සමස්ත අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙහි (ද.දේ.නි.යෙහි) ප්‍රතිශතයක් ලෙස අපේක්ෂිත සියයට 5.4 මට්ටමෙහි රඳවා ගැනීමට රාජ්‍ය මූල්‍ය අංශයට හැකි විය. මෙම සුබවාදී වර්ධනය හමුවේ වුවද, සමස්ත සාර්ව ආර්ථික ප්‍රතිපත්ති රාමුව තුළ රාජ්‍ය මූල්‍ය කටයුතු මෙහෙයවීමට ඇති ඉඩකඩ ක්‍රමයෙන් ඇහිරී යෑම පිළිබිඹු කරමින් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස මධ්‍යම රජයේ ණය ඉහළ යෑම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය තිරසාර ලෙස පවත්වා ගැනීමට අඛණ්ඩව ප්‍රයත්න දැරීමේ අවශ්‍යතාව පෙන්නුම් කළේය.

**අපේක්ෂා කරනු ලබන පරිදි ශ්‍රී ලංකා ආර්ථිකය ඉහළ වර්ධන මාවතක් තුළ ස්ථාවර ලෙස රඳවා ගැනීමට නම් ආර්ථිකය තුළ දිගුකාලීනව පවතින ව්‍යුහාත්මක ගැටලු විසඳිය යුතු බව 2016 වසරේ ශ්‍රී ලංකා ආර්ථිකයෙහි ක්‍රියාකාරිත්වය තුළින් යළි අවධාරණය විය.** මෙම ගැටලු මෙන්ම ආර්ථිකයෙහි ඉස්මතු වෙමින් පවතින අභියෝග විසඳීම සඳහා ද අවශ්‍ය කරනු ලබන ප්‍රතිපත්ති සැකසීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ. අරමුදල) වැනි බහුපාර්ශ්වීය ආයතනවල ද සහයෝගය සහිතව, රජය විසින් මෑතක දී ගෙන ඇති ක්‍රියාමාර්ග පැසසිය යුතු අතර, ගෝලීය නිෂ්පාදන ජාලය සමඟ සමීපව ඒකාබද්ධ වෙමින්, ආර්ථිකයෙහි ඵලදායිතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීමටත්, සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට හා දේශීය පෞද්ගලික අංශයෙහි ආයෝජන දිරිමත් කිරීමටත් තුඩු දෙන පරිදි එම ප්‍රතිපත්ති නොපමාව හා ස්ථාවර ලෙස ක්‍රියාත්මක කළ යුතු වේ.

## 1.2 2016 වසරේ සාර්ව ආර්ථික වර්ධනයන්, ස්ථායීතාව සහ ප්‍රතිපත්තිමය ප්‍රතිචාර

### මූර්ත අංශයේ වර්ධනයන් සහ උද්ධමනය

**2016 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය, විවිධ ගෝලීය හා දේශීය අභියෝග රැසක් මධ්‍යයේ වුවද, සියයට 4.4 කින් මූර්ත වශයෙන් වර්ධනය විය.** වසර තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්වය ආර්ථික කටයුතු කෙරෙහි, මූලික වශයෙන් කෘෂිකාර්මික අංශය කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. මූල්‍ය සේවා (සියයට 12.4), රක්ෂණ (සියයට 8.5), විදුලි සන්දේශ (සියයට 8.3) මෙන්ම ප්‍රවාහන (සියයට 4.1) සහ තොග හා සිල්ලර වෙළඳාම (සියයට 2.5) යන අංශවල වර්ධනයත් සමඟ මූර්ත ද.දේ.නි.යෙන් සියයට 56.5 ක දායකත්වයක් දක්වන සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම් 2016 වසර තුළ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 4.2 කින් වර්ධනය විය. එක්ව ගත් කල ද.දේ.නි.යට සියයට 10.0 ක දායකත්වයක් දක්වන ඉදිකිරීම් සහ පතල් හා කැණීම් යන උප අංශ, පිළිවෙළින්, සියයට 14.9 කින් හා සියයට 14.4 කින් වර්ධනය වීම හේතුවෙන් මූර්ත ද.දේ.නි.යට සියයට 26.8 ක දායකත්වයක් දක්වන කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම් පෙර වසරට සාපේක්ෂව සියයට 6.7 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. කර්මාන්ත අංශය තුළ අඩංගු නිෂ්පාදන කටයුතු සියයට 1.7 ක අඩු අගයකින් වර්ධනය විය. කෘෂිකර්මාන්තය, වන වගාව සහ ධීවර කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් 2016 වසර තුළ දී සියයට 4.2 කින් අඩු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2016 වසරේ දී එම ක්‍රියාකාරකම් මූර්ත ද.දේ.නි.යට දක්වන දායකත්වය සියයට 7.1 ක් දක්වා අඩු විය. 2016 වසර තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් ප්‍රධාන වශයෙන් වී, තේ සහ රබර් යන උප අංශවල වර්ධනය පහළ ගියේය.

**වියදම් ප්‍රවේශයේ ඇස්තමේන්තු සැලකීමේ දී, 2016 වසර තුළ දී ආර්ථික වර්ධනය සඳහා ආයෝජන වියදම් පුළුල් වීම මූලික වශයෙන් හේතු විය.**

### 1.1 සංඛ්‍යා සටහන
### සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය (2012-2016)


| දර්ශකය | ඒකකය | 2012 | 2013 | 2014 | 2015 (අ) | 2016 (ආ) |
|---|---|---|---|---|---|---|
| **මූර්ත අංශය (ඇ)** | | | | | | |
| මූර්ත ද.දේ.නි. වර්ධනය | සියයට | 9.1 | 3.4 | 5.0(අ) | 4.8(ආ) | 4.4 |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. | රුපියල් බිලියන | 8,732 | 9,592 | 10,361(අ) | 10,952(ආ) | 11,839 |
| ඒක පුද්ගල ද.දේ.නි. (ඈ) | එ.ජ. ඩොලර් | 3,351 | 3,609 | 3,821(අ) | 3,843(ආ) | 3,835 |
| **විදේශීය අංශය** | | | | | | |
| වෙළඳ ශේෂය (ඇ) | ද.දේ.නි.යේ % වශයෙන් | -13.8 | -10.2 | -10.4 | -10.4 | -11.2 |
| ජංගම ගිණුමේ ශේෂය (ඇ) | ද.දේ.නි.යේ % වශයෙන් | -5.8 | -3.4 | -2.5 | -2.3 | -2.4 |
| සමස්ත ශේෂය | එ.ජ. ඩොලර් මිලියන | 151 | 985 | 1,369 | -1,489 | -500 |
| විදේශීය නිල සංචිත | එ.ජ. ඩොලර් මිලියන | 7,106 | 7,495 | 8,208 | 7,304 | 6,019 |
| **රාජ්‍ය මූල්‍ය අංශය (ඇ) (ඉ)** | | | | | | |
| වර්තන ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -0.9 | -0.7 | -1.2 | -2.3 | -0.6 |
| සමස්ත අයවැය ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -5.6 | -5.4 | -5.7 | -7.6 | -5.4 |
| මධ්‍යම රජයේ ණය | ද.දේ.නි.යේ % වශයෙන් | 68.7 | 70.8 | 71.3 | 77.6 | 79.3 |
| **මුදල් අංශය සහ උද්ධමනය** | | | | | | |
| පුළුල් මුදල් වර්ධනය ($M_{2b}$) (ඊ) | සියයට | 17.6 | 16.7 | 13.4 | 17.8 | 18.4 |
| පෞද්ගලික අංශයට ලබාදුන් ණය වර්ධනය ($M_{2b}$ හි) (ඊ) | සියයට | 17.6 | 7.5 | 8.8 | 25.1 | 21.9 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකය (උ) | සියයට | 7.6 | 6.9 | 3.3 | 2.2 | 4.0 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඈ) නවතම ජනගහන සංඛ්‍යා දත්ත අනුව ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත.
(ඉ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2017 මාර්තු 15 දින නිකුත් කරන ලද 2014 සහ 2015 සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඊ) වසර අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය
(උ) 2014 වසර දක්වා දත්ත කො.පා.මි. දර්ශකය (2006/07=100) මත පදනම් වන අතර, 2015 සිට දත්ත කො.පා.මි. දර්ශකය (2013=100) මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

ඒ අනුව, නාමික ද.දේ.නි.යට සියයට 31.5 ක දායකත්වයක් දක්වන සහ ආර්ථිකයේ ආයෝජන ක්‍රියාකාරකම් මට්ටම පිළිබිඹු කරන දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය සියයට 19.6 කින් වර්ධනය විය. වසර තුළ දී ඉදිකිරීම් ක්‍රියාකාරකම් පුළුල් වීම ඉහළ

### 1.1 රූප සටහන
### ද.දේ.නි.යෙහි වර්ධනය සඳහා ආංශික දායකත්වය




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආයෝජන වර්ධනයට මූලික වශයෙන් හේතු විය. මේ අතර, ආර්ථිකයේ විශාලතම වියදම් කාණ්ඩය වන පරිභෝජන වියදම්, නාමික වශයෙන් සියයට 4.1 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළ අතර, එය පෙර වසරේ වාර්තා කළ සියයට 10.3 ක වර්ධනය හා සැසඳීමේදී සැලකිය යුතු මධ්‍යස්ථ අගයකි. දැඩි මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් පෞද්ගලික අංශයේ පරිභෝජන වියදම අඩු වීම මෙන්ම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ඇති කිරීම සඳහා දරන ප්‍රයත්න හේතුවෙන් රාජ්‍ය අංශයේ පරිභෝජන වියදම සීමා වීම, 2016 වසරේ දී පරිභෝජන වියදම අඩු වීමට හේතු විය. 2016 වසර තුළ දී දේශීය ඉල්ලුම නාමික වශයෙන් සියයට 8.2 කින් (මූර්ත වශයෙන් සියයට 6.2 කින්) වර්ධනය වුවද, ලෝක අපනයනවලින් ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රතිශතය අඛණ්ඩව පහත වැටීම තුළින් පෙන්නුම් කෙරෙන ආර්ථිකයෙහි තරගකාරිත්වය අඩු වීම සහ මෙරට අපනයන වෙළඳපොළ තුළ පවතින දුර්වලතා හේතුවෙන්, ශුද්ධ විදේශීය ඉල්ලුම නාමික වශයෙන් සියයට 9.6 කින් (මූර්ත වශයෙන් සියයට 22.5 කින්) අඩු විය. මෙම ප්‍රවණතා මධ්‍යයේ වුවද, වසර තුළ දී පෞද්ගලික ඉතුරුම් සහ රාජ්‍ය නිර්-ඉතුරුම් යන දෙඅංශයම වර්ධනය වීමෙහි ප්‍රතිඵලයක් ලෙස දේශීය

1


### 1.2 සංඛ්‍යා සටහන
### පවත්නා වෙළඳපොළ මිල අනුව සමස්ත ඉල්ලුම සහ ඉතිරිකිරීම් - ආයෝජන පරතරය (අ)(ආ)

| ශීර්ෂය | රුපියල් බිලියන | | වර්ධනය % | | ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|---|
| | 2015 (ඇ) | 2016 | 2015 (ඇ) | 2016 | 2015 (ඇ) | 2016 |
| **1. දේශීය ඉල්ලුම** | **11,776.6** | **12,742.8** | **5.2** | **8.2** | **107.5** | **107.6** |
| 1.1 පරිභෝජනය | 8,661.9 | 9,018.9 | 10.3 | 4.1 | 79.1 | 76.2 |
| පෞද්ගලික | 7,677.1 | 8,003.8 | 10.0 | 4.3 | 70.1 | 67.6 |
| රාජ්‍ය | 984.8 | 1,015.1 | 13.4 | 3.1 | 9.0 | 8.6 |
| 1.2 ආයෝජන (දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය) | 3,114.7 | 3,723.9 | -7.0 | 19.6 | 28.4 | 31.5 |
| **2. ශුද්ධ විදේශීය ඉල්ලුම** | **-824.9** | **-903.8** | **1.4** | **-9.6** | **-7.5** | **-7.6** |
| භාණ්ඩ හා සේවා අපනයන | 2,301.1 | 2,538.7 | 5.3 | 10.3 | 21.0 | 21.4 |
| භාණ්ඩ හා සේවා ආනයන | 3,125.9 | 3,442.5 | 3.5 | 10.1 | 28.5 | 29.1 |
| **3. මුළු ඉල්ලුම (ද.දේ.නි.) (1+2)** | **10,951.7** | **11,839.0** | **5.7** | **8.1** | **100.0** | **100.0** |
| **4. දේශීය ඉතිරිකිරීම් (3-1.1)** | **2,289.8** | **2,820.1** | **-8.8** | **23.2** | **20.9** | **23.8** |
| පෞද්ගලික | 2,536.6 | 2,891.8 | -3.9 | 14.0 | 23.2 | 24.4 |
| රාජ්‍ය | -246.8 | -71.7 | -93.3 | 70.9 | -2.3 | -0.6 |
| **5. විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම (ඈ)** | **-281.3** | **-332.8** | **-19.2** | **-18.3** | **-2.6** | **-2.8** |
| **6. විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම** | **842.1** | **939.8** | **3.6** | **11.6** | **7.7** | **7.9** |
| **7. ජාතික ඉතිරිකිරීම් (4+5+6)** | **2,850.6** | **3,427.1** | **-7.7** | **20.2** | **26.0** | **28.9** |
| **8. ඉතිරිකිරීම් ආයෝජන පරතරය** | | | | | | |
| දේශීය ඉතුරුම්-ආයෝජන (4-1.2) | -824.9 | -903.8 | | | -7.5 | -7.6 |
| ජාතික ඉතිරිකිරීම්-ආයෝජන (7-1.2) | -264.1 | -296.8 | | | -2.4 | -2.5 |
| **9. විදේශීය ජංගම ගිණුම් ශේෂය (2+5+6) (ඈ)** | **-264.1** | **-296.8** | | | **-2.4** | **-2.5** |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත
(ඈ) මෙම අගය ගෙවුම් ශේෂයෙහි ඇස්තමේන්තුගත අගයෙන් වෙනස් වනුයේ ගණනය කිරීමේ දී ඇති වන කාල පමාව හේතුවෙනි.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

### 1.2 රූප සටහන
### ඉතිරිකිරීම්, ආයෝජන හා ඉතුරුම් - ආයෝජන පරතරය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ඉතුරුම් ඉහළ යෑම හේතුවෙන්, දේශීය ඉතුරුම් නාමික ද.දේ.නි.යෙන් සියයට 23.8 ක් දක්වා වර්ධනය විය. විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම අඩු වුවද, විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම ඉහළ යෑමෙහි ප්‍රතිඵලයක් ලෙස 2016 වසර තුළ දී ජාතික ඉතුරුම් ද වර්ධනය විය. ඒ අනුව, ජාතික ඉතුරුම්, නාමික ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 2015 වසරේ දී වාර්තා වූ සියයට 26.0 ට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 28.9 ක් දක්වා වර්ධනය විය. ආයෝජන සහ ඉතුරුම්වල ඉහළ යෑමත් සමඟ, 2016 වසරේ දී දේශීය ඉතුරුම්-ආයෝජන පරතරය මෙන්ම ජාතික ඉතුරුම්-ආයෝජන පරතරය ද, පිළිවෙළින්, ද.දේ.නි.යෙන් සියයට 7.6 ක් සහ ද.දේ.නි.යෙන් සියයට 2.5 ක් ලෙස පෙර වසරට සාපේක්ෂව නොවෙනස්ව පැවතුණි.

**කෘෂිකර්මාන්තය, වන වගාව සහ ධීවර කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරම්වල එකතු කළ අගය පෙර වසරේ දී වාර්තා කළ සියයට 4.8 ක වර්ධනයට සාපේක්ෂව 2016**

**වසරේ දී සියයට 4.2 කින් අඩු විය.** මෙහි ප්‍රතිඵලයක් ලෙස, ද.දේ.නි.යට මෙම අංශයෙහි දායකත්වය 2015 වසරේ දී පැවති සියයට 7.8 හා සැසඳීමේ දී 2016 වසරේ දී සියයට 7.1 ක් දක්වා තවදුරටත් අඩු විය. කෘෂිකාර්මික අංශයේ වර්ධනය අඩු වීමට වසර තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්වය විශේෂයෙන් හේතු විය. වී (සියයට -8.3), තේ (සියයට -11.0), රබර් (සියයට -10.7) සහ පොල් (සියයට -1.5) වසර තුළ දී දැඩි බලපෑමට ලක් වූ අංශ විය. 2015 වසර තුළ දී වාර්තා වූ ඉහළම අස්වැන්නෙන් පසු, 2015/16 මහ කන්නය තුළ වී නිෂ්පාදනයෙහි සියයට 0.9 ක සුළු වර්ධනයක් දැකිය හැකි වුව ද, 2016 වසරේ යල කන්නයේ දී නිෂ්පාදනය සියයට 21.9 කින් අඩු වීම, වී නිෂ්පාදනය පහළ යෑමට ප්‍රධාන හේතුව විය. ඉල්ලුම් හා සැපයුම් දෙඅංශයෙහිම බලපෑම් හේතුවෙන් 2016 වසර තුළ දී තේ නිෂ්පාදනය සැලකිය යුතු ලෙස පහත වැටුණි. 2016 වසරේ මුල් කාලයේ දී තේ වගා බිම් ආශ්‍රිතව පැවති දිගුකාලීන නියං තත්ත්වය, 2016 වසර මැද දී පැවති අඳුරු කාලගුණික තත්ත්වයන් සමඟ වෙනස් වූ කාලගුණ රටා සහ 2016 වසර අවසානය වන විට පැවති දැඩි නියං තත්ත්වය, තේ නිෂ්පාදනය අඩු වීමට හේතු විය. පොහොර සහ වල්නාශක භාවිතය අඩු වීම ද තේ නිෂ්පාදනය අඩු වීම සඳහා හේතු වන්නට ඇත. ප්‍රධාන අපනයන ගමනාන්තවලින් පැවති අඩු ඉල්ලුම් තත්ත්වය හේතුවෙන්, විශේෂයෙන්ම වසරේ පළමු භාගයේ දී ජාත්‍යන්තර වෙළඳපොළෙහි සාමාන්‍ය තේ මිල එ.ජ. ඩොලර් වටිනාකම අනුව සැලකීමේ දී ස්ථාවර මට්ටමක පැවතුණි. ඛනිජ තෙල් මිල ගණන් අඩු මට්ටමක පැවතීම හමුවේ ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ස්වභාවික රබර් මිල ගණන් පහළ යෑම හේතුවෙන් කිරි කැපීමේ බිම් ප්‍රමාණය හා කිරි කැපීම සිදු කරන දින ගණන අඩු වීම නිසා රබර් නිෂ්පාදනය පසුගිය වසර 50 තුළ පැවති අවම නිෂ්පාදන පරිමාව තෙක් පහත වැටිණි. පොල් නිෂ්පාදනය වසර තුළ දී සුළු වශයෙන් පහත වැටුණු අතර, පොල් ආශ්‍රිත කර්මාන්තවලින් පැවති ඉහළ ඉල්ලුම සහ ඉහළ අපනයන මිල ගණන්වල ප්‍රතිඵලයක් ලෙස දේශීය පොල් මිල ගණන් ඉහළ යෑමක් දක්නට ලැබුණි. වසර තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්වයෙහි බලපෑම මත අනෙකුත් ආහාර භෝග වගා කිරීම වෙනුවට එළවළු වගා කිරීම වෙත මාරු වීමත් සමඟ ප්‍රධාන වශයෙන් වගා කරන ලද බිම් ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් එළවළු නිෂ්පාදනයෙහි වර්ධනයක් දැකිය හැකි විය.

**කෘෂිකාර්මික අංශයේ වර්ධනය දිරිගැන්වීම හා ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා 2016 වසරේ දී රජය විසින් වැඩසටහන් කිහිපයක් ආරම්භ කරන ලදී.** තෝරා ගත් භෝගවලින් රට ස්වයංපෝෂිත කිරීම, ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග හඳුන්වා දීම, ගොවීන් සඳහා ආකර්ෂණීය මිල ගණන් සහතික කිරීම, තරගකාරී දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළවලට බාධාවකින් තොරව ප්‍රවේශ වීමට හැකියාව ලබා දීම, ගොවිපළ යාන්ත්‍රීකරණය කිරීම, පසු අස්වනු හානි අඩු කිරීම, සැපයුම් දාමය සවිමත් කිරීම, වගා බිම් ප්‍රමාණය පුළුල් කිරීම, ඉහළ ඵලදාවක් සහිත බීජ භාවිතය ප්‍රචලිත කිරීම සහ වැඩිදියුණු කළ ගොවිපළ කළමනාකරණ කටයුතු හඳුන්වා දීම ඇතුළත් ඉලක්ක ගණනාවක් පිළිබඳව 2016 - 2018 සඳහා වන ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන මගින් අවධානය යොමු කර ඇත. වගා කටයුතු සඳහා අධික විෂ සහිත කෘෂි රසායන භාවිතය වැළැක්වීම සහ සාම්ප්‍රදායික වී ප්‍රභේද භාවිතය යළි හඳුන්වා දීම අරමුණු කර ගනිමින් "හිතකර කෘෂිකර්මාන්තයක් - සෞඛ්‍ය සම්පන්න ජනතාවක් - වස විස නැති රටක්" යන තේමාව යටතේ තුන් අවුරුදු ජාතික වැඩසටහනක් දියත් කර ඇත. මේ අතර, ඉහළ රාජ්‍ය මූල්‍ය පිරිවැයක් දරමින් වුව ද, පොහොර සහනාධාරය ලෙස මුදල් ප්‍රදානයක් ලබා දීමේ ක්‍රමවේදය වසර තුළ දී අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් "ශ්‍රී ලංකාවේ අසුරන ලද පිරිසිදු ලංකා තේ" යන වෙළඳ නාමය යටතේ ශ්‍රී ලංකාවට ආවේණික තේ ප්‍රවර්ධනය කිරීම සඳහා උපායමාර්ගික අලෙවිකරණ ක්‍රියාමාර්ගයක් ගැනීම, "B Leaf 60" වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යෑම හා තේ කර්මාන්තශාලාවලට "උපද්‍රව විශ්ලේෂණය හා අවදානම් පාලනය කිරීමේ" (HACCP) සහතිකය ලබා ගැනීම සඳහා දිරිගැන්වීම මෙන්ම තේ කර්මාන්තශාලා නවීකරණය කිරීමේ වැඩසටහන යටතේ සහනාධාර ලබා දීම අඛණ්ඩව කරගෙන යන ලද අතර, තේ පර්යේෂණායතනය විසින් දේශගුණික විපර්යාස හා අනෙකුත් අහිතකර තත්ත්වයන්ට ඔරොත්තු දිය හැකි තේ රිකිලි ප්‍රභේද හඳුන්වා දෙන ලදී. වසර 2020 වන විට ජාතික රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 200 ක් දක්වා ඉහළ නැංවීමේ අරමුණින් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සාම්ප්‍රදායිකව රබර් වගා නොකරන ප්‍රදේශවල රබර් වගාව පුළුල් කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. තවද, ජාත්‍යන්තර රබර් මිල ස්ථායී මට්ටමක පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමට ශ්‍රී ලංකාව ද ඇතුළත්ව ස්වභාවික රබර් නිෂ්පාදනය කරන රටවල සංගමයේ සාමාජිකයන් විසින් විශේෂඥ කමිටුවක් පිහිටුවන ලදී. අදාළ ආයතන විසින් වෙන්දේසි නියාමනය කිරීම, දිසිඳි පොල් නිෂ්පාදන කටයුතු සිදු කරන නව කර්මාන්තශාලා පිහිටුවීමට උපකාරී වීම සහ නව වෙළඳපොළ අවස්ථා සොයා යෑම වැනි පොල් කර්මාන්තයේ උන්නතියට අදාළ ක්‍රියාමාර්ග රැසක් ගන්නා ලදී. සීනි කර්මාන්තය වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීම සඳහා උක් වගාව දියුණු කිරීමේ අරමුණින්

1

රජය විසින් උක් පර්යේෂණ ආයතනය හා විදේශීය පර්යේෂණ ආයතන අතර විද්‍යාත්මක සහයෝගිතාව ඇති කිරීමේ වැඩසටහනක් ආරම්භ කරන ලද අතර, කන්තලේ සීනි කර්මාන්තශාලාව යළි පිහිටුවීමට ද පියවර ගන්නා ලදී. මාතලේ, අනුරාධපුරය, පොළොන්නරුව හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් ජලය බෙදාහැරීම සඳහා කළු ගඟ ව්‍යාපෘතිය සමඟ නිවුන් ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරන ලද මෙරට විශාලතම බහුකාර්ය වාරිමාර්ග ව්‍යාපෘතිය හා මහවැලි ප්‍රධාන සැලැස්මේ අවසන් ව්‍යාපෘතිය වන මොරගහකන්ද ජලාශයේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කරන ලදී. රජය විසින් නීති විරෝධී, වාර්තා නොවන හා අවිධිමත් ධීවර කටයුතු සීමා කිරීමට පියවර ගැනීමෙහි ප්‍රතිඵලයක් ලෙස වසර එකහමාරකට අධික කාලයක් පුරා යුරෝපා කලාපයේ රටවලට මත්ස්‍ය අපනයනය තහනම් කරමින් යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාවට එරෙහිව පනවා තිබූ තහනම, 2016 ජුනි මස සිට බලපැවැත්වෙන පරිදි සම්පූර්ණයෙන් ඉවත් කරන ලදී. දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සහ කිරිපිටි ආනයනය සඳහා වන පිරිවැය අවම කිරීමේ අරමුණු ඇතිව තෝරාගත් දිස්ත්‍රික්කවල විශේෂයෙන්ම, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් භාවිතයට නොගන්නා හා ඌන උපයෝජිත ඉඩම්වල, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ කිරි නිෂ්පාදන සංවර්ධන කලාප පිහිටුවීම දිරිමත් කිරීමට රජය කටයුතු කළේය.

**කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම්වල එකතු කළ අගය, පෙර වසරේ පැවති සියයට 2.1 ට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 6.7 ක් ලෙස ප්‍රසාරණය වෙමින් ඉහළ වර්ධන මාවතකට පිවිසුණි.** කර්මාන්ත අංශයෙහි ඉහළ වර්ධනය සඳහා ඉදිකිරීම් අංශයෙහි පැවති සියයට 14.9 ක කැපී පෙනෙන වර්ධනය මෙන්ම, පතල් හා කැණීම්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන, මූලික ලෝහ හා සකස් කළ ලෝහ නිෂ්පාදන සහ යන්ත්‍රෝපකරණ හා උපකරණ නිෂ්පාදන යන අංශවල වර්ධනය ද හේතු විය. කෙසේ වුව ද, මෙම කාලපරිච්ඡේදය තුළ ආහාර නිෂ්පාදිත, ඇඟලුම්, පාන වර්ග, දුම්කොළ නිෂ්පාදිත සහ රසායනික ද්‍රව්‍ය හා රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදිත යන ප්‍රධාන උප අංශ ඍණාත්මක වර්ධනයක් වාර්තා කළේය. වසරේ මුල් භාගයේ දී පාන වර්ග උප අංශයෙහි නිෂ්පාදනය සඳහා ගංවතුර හේතුවෙන් බාධා ඇති වුවද, 2016 වසර අවසාන කාලයේ පැවති වියළි කාලගුණික තත්ත්වයෙහි බලපෑම හේතුවෙන් සිසිල් බීම හා බෝතල් කළ පානීය ජලය යනාදිය සඳහා ඉල්ලුම වැඩි වීම නිසා නිෂ්පාදනය ඉහළ ගියේය. 2015 අග භාගයේ දී දුම්වැටි මත පනවා ඇති බදු ඉහළ නැංවීම හේතුවෙන් දුම්වැටි මිල ඉහළ යෑම සහ 2016 වසරේ දී තවදුරටත් මිල ඉහළ යෑම නිසා දුම්වැටි සඳහා වූ ඉල්ලුම අඩු වීම හේතුවෙන් දුම්කොළ නිෂ්පාදිත උප අංශයෙහි පසුබෑමක් ඇති විය.

**අපනයන ප්‍රවර්ධනය ඉලක්ක කරගත් කාර්මීකරණ උපායමාර්ග මත පදනම්ව කර්මාන්ත අංශයෙහි සංවර්ධනය සඳහා සහාය ලබා දීම රජය විසින් අඛණ්ඩව සිදු කරන ලදී.** ශ්‍රී ලංකාවේ තරගකාරිත්වය වැඩිදියුණු කර ගැනීම මගින් ගෝලීය අගයදාමය හා තවදුරටත් සම්බන්ධ වීම හරහා ශ්‍රී ලංකාව, කලාපයෙහි අපනයන මූලික කරගත් ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ අරමුණින් මෙම ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලදී. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය මගින් ප්‍රාදේශීය කාර්මීකරණය නංවාලීම පිණිස ආයෝජන දිරිගැන්වීම, යටිතල පහසුකම් සැපයීම සහ ප්‍රාදේශීය වශයෙන් තාක්ෂණික සේවා සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී. අපනයන සංවර්ධන මණ්ඩලය මේ වන විට ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් ගණනාවකගේ සහයෝගයෙන් ශ්‍රී ලාංකීය නිපැයුම් ප්‍රවර්ධනය සඳහා නව නිෂ්පාදන සහ නව වෙළෙඳපොළ හඳුනා ගැනීමේ ප්‍රයත්නයක නිරතව සිටී. මීට අමතරව, 2017 වසර තුළ දී විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයෙහි ජාතික නවෝත්පාදන වැඩසටහන, ජාතික තේමාත්මක පර්යේෂණ වැඩසටහන මෙන්ම ජාතික විද්‍යා පදනමේ තාක්ෂණික අනුග්‍රාහක වැඩපිළිවෙළ ද ඒකාබද්ධ කරමින් නවෝත්පාදන වේගවත් කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලික පියවර ගෙන ඇත. රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ ඖෂධ නිෂ්පාදනය, ජාන තාක්ෂණය ආදී කර්මාන්තවල නිරත සමාගම්වලට පහසුකම් සැලසීම සඳහා ජීව තාක්ෂණ නව්‍යකරණ උද්‍යානයක් පිහිටුවීමට ද යෝජනා වී ඇත. ඒ අතරම, සියලු බලපත්‍රලාභී වාණිජ බැංකුවල ණය කළඹින් අවම වශයෙන් සියයට 10 ක ප්‍රමාණයක් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා යොමු විය යුතුය යන ජාතික ප්‍රතිපත්තිය ඇතුළත් 2017 අයවැය යෝජනාවට අනුකූල වන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව සියලු වාණිජ බැංකු වෙතින් ඉල්ලීමක් කළේය.

**සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල එකතු කළ අගය මත වටිනාකම 2015 වසරේ දී වාර්තා කරන ලද සියයට 5.7 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 4.2 කින් වර්ධනය විය.** වෘත්තීමය සේවා උප අංශය හැරුණු කොට සියලුම සේවා කටයුතු 2016 වසරේ දී වර්ධනය විය. මූල්‍ය සේවා කටයුතු සැලකිය යුතු ලෙස පුළුල් වීම සහ මගී හා භාණ්ඩ ප්‍රවාහනය මෙන්ම, ගබඩා පහසුකම් සැපයීමේ කටයුතුවල වර්ධනය, සේවා අංශයේ වර්ධනය සඳහා මූලික වශයෙන් හේතු විය.

**1.3 සංඛ්‍යා සටහන**

**කර්මාන්ත මූලය අනුව ස්ථාවර මිල (2010) යටතේ දළ ජාතික ආදායම (අ)(ආ)**

| ආර්ථික කටයුතු | වටිනාකම (රු. මිලියන) | | දළ දේශීය නිෂ්පාදිතයට (ද.දේ.නි.) සඳහා දායකත්වය % | | වෙනස්වීමේ අනුපාතිකය % | | වෙනස්වීම සඳහා දායකත්වය % | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2015 (ඇ) | 2016 | 2015 (ඇ) | 2016 | 2015 (ඇ) | 2016 | 2015 (ඇ) | 2016 |
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **670,106** | **641,943** | **7.8** | **7.1** | **4.8** | **-4.2** | **7.6** | **-7.4** |
| කෘෂිකර්මාන්තය සහ වන වගාව | 553,360 | 523,294 | 6.4 | 5.8 | 6.5 | -5.4 | 8.4 | -8.0 |
| ධීවර කර්මාන්තය | 116,746 | 118,649 | 1.4 | 1.3 | -2.6 | 1.6 | -0.8 | 0.5 |
| **කර්මාන්ත** | **2,264,673** | **2,416,276** | **26.2** | **26.8** | **2.1** | **6.7** | **11.5** | **40.1** |
| පතල් සහ කැණීම් කර්මාන්ත | 191,112 | 218,545 | 2.2 | 2.4 | -5.2 | 14.4 | -2.6 | 7.3 |
| නිෂ්පාදන කර්මාන්ත | 1,359,694 | 1,383,461 | 15.7 | 15.4 | 4.9 | 1.7 | 16.0 | 6.3 |
| විදුලිය, ගෑස්, ජලය සහ කසළ කළමනාකරණය | 118,752 | 130,665 | 1.4 | 1.4 | 8.8 | 10.0 | 2.4 | 3.2 |
| ඉදිකිරීම් | 595,115 | 683,604 | 6.9 | 7.6 | -2.7 | 14.9 | -4.2 | 23.4 |
| **සේවාවන්** | **4,883,444** | **5,087,452** | **56.6** | **56.5** | **5.7** | **4.2** | **66.5** | **54.0** |
| වෙළඳාම, ප්‍රවාහන සේවාවන්, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 1,997,097 | 2,064,738 | 23.1 | 22.9 | 4.8 | 3.4 | 23.1 | 17.9 |
| තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවාවන් | 48,892 | 52,802 | 0.6 | 0.6 | 10.9 | 8.0 | 1.2 | 1.0 |
| මූල්‍ය, රක්ෂණය හා නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම | 1,063,819 | 1,152,781 | 12.3 | 12.8 | 13.3 | 8.4 | 31.3 | 23.5 |
| වෘත්තීයමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන් | 1,023,879 | 1,030,603 | 11.9 | 11.4 | 1.8 | 0.7 | 4.5 | 1.8 |
| රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවාවන් | 749,757 | 786,529 | 8.7 | 8.7 | 3.6 | 4.9 | 6.5 | 9.7 |
| **මූලික මිලගණන් අනුව සමස්ත එකතු කළ අගය** | **7,818,224** | **8,145,671** | **90.6** | **90.4** | **4.6** | **4.2** | **85.7** | **86.6** |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු - සහනාධාර | 815,667 | 866,355 | 9.4 | 9.6 | 7.5 | 6.2 | 14.3 | 13.4 |
| **වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය** | **8,633,890** | **9,012,026** | **100.0** | **100.0** | **4.8** | **4.4** | **100.0** | **100.0** |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම | -219,993 | -250,805 | | | -18.1 | -14.0 | | |
| **වෙළඳපොළ මිල අනුව දළ ජාතික ආදායම** | **8,413,897** | **8,761,221** | | | **4.5** | **4.1** | | |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත


මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2016 වසරේ දී මූල්‍ය සේවා කටයුතු සහ මූල්‍ය අතරමැදි සේවාවල එකතු කළ අගය මත වටිනාකම සියයට 12.4 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. ද.දේ.නි.ට සියයට 10.6 ක දායකත්වයක් සපයන තොග හා සිල්ලර වෙළඳාම් උප අංශය, 2016 වසරේ දී සියයට 2.5 ක මධ්‍යස්ථ අගයකින් වර්ධනය විය. තොග හා සිල්ලර උප අංශයෙහි එකතු කළ අගය මත වටිනාකම, කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනයෙහි සහ ආනයනවල සිදු වන වෙනස්කම්වලට අනුව වෙනස්වීම්වලට භාජනය වන බැවින්, 2016 වසරේ දී කෘෂිකාර්මික හා නිෂ්පාදන අංශවල නිමැවුම් පහළ යෑම ද රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම හේතුවෙන් දේශීය ඉල්ලුම පසුබෑමකට ලක් වීම ද වසර තුළ වෙළඳ කටයුතු දැඩි පසුබෑමකට ලක් වීමට හේතු විය.

**සේවා වියුක්ති අනුපාතිකය පෙර වසරේ දී වාර්තා වූ සියයට 4.7 හා සැසඳීමේ දී 2016 වසරේ දී සියයට 4.4 ක් දක්වා අඩු වූ අතර, ආර්ථිකයේ කර්මාන්ත හා සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම් පුළුල් වීමත් සමඟ සේවා නියුක්ත පුද්ගලයන් සංඛ්‍යාව වසර තුළ දී සියයට 1.5 කින් ඉහළ ගියේය.** ස්ත්‍රී හා පුරුෂ සේවා වියුක්ති අනුපාතික, පිළිවෙළින්, 2015 වසරේ දී පැවති සියයට 7.6 හා සියයට 3.0 සමඟ සැසඳීමේ දී 2016 වසරේ දී, පිළිවෙළින්, සියයට 7.0 ක් හා සියයට 2.9 ක් දක්වා අඩු වීම, සේවා වියුක්ති අනුපාතිකයේ සමස්ත අඩු වීම සඳහා දායක විය. 2016 වසර තුළ දී සියලුම කාණ්ඩවල අධ්‍යාපන මට්ටම් අනුව සේවා වියුක්ති අනුපාතික අඩු වුවද, තරුණ කාණ්ඩ (අවුරුදු 15 - 24) අතර සේවා වියුක්ති අනුපාතිකය 2015 වසරේ දී වාර්තා වූ සියයට 20.8 සිට 2016 වසරේ දී සියයට 21.6 ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, 2016 වසරේ දී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සියයට 53.8 ක මට්ටමේ නොවෙනස්ව පැවතුණි. නුපුහුණු කාන්තාවන් විදේශගත වීම නිසා ඇති වන සමාජ බලපෑම අවම කිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිවලට ප්‍රතිචාර දක්වමින් සහ බොහොමයක් මැද පෙරදිග රටවල සහ රැකියා සපයන අනෙකුත් රටවල ආර්ථික ක්‍රියාකාරිත්වය


1

**1.3 රූප සටහන**
**සේවා වියුක්තිය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**1.4 රූප සටහන**
**මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය)**




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

දුර්වල මට්ටමක පැවතීම හේතුවෙන් 2016 වසරේ දී විදේශ රැකියා සඳහා යොමු වීමේ අඩුවක් දක්නට ලැබිණ. කෙසේ වුව ද, පුහුණු කාණ්ඩයේ තාවකාලික සංක්‍රමණිකයන්ගේ ඉහළ යෑම, ප්‍රේෂණවල මධ්‍යස්ථ වර්ධනයක් සඳහා හේතු විය. මේ අතර, 2016 වසරේ පළමු කාර්තු තුන තුළ දී ශ්‍රම ඵලදායිතාව සුළු වශයෙන් ඉහළ ගියේය. කෘෂිකාර්මික අංශයේ ශ්‍රම ඵලදායිතාව, කර්මාන්ත හා සේවා අංශවලට සාපේක්ෂව සැලකිය යුතු අඩු මට්ටමක පැවතුණි.


**2016 වසරේ මුල් භාගය තුළ දී පාරිභෝගික මිල උද්ධමනය ඉහළ ගිය ද වසරේ ඉතිරි කාලපරිච්ඡේදය තුළ දී එය තරමක් දුරට ස්ථාවර වීමක් පෙන්නුම් කළ අතර, 2016 වසරේ දී මූලික උද්ධමනය සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.** ජාත්‍යන්තර වෙළඳපොළේ භාණ්ඩ මිල ගණන් පහළ අගයක පැවතීම මත ආනයන මගින් ඇති කරන ලද අවධමනාත්මක බලපෑමෙහි ප්‍රතිඵලයක් ලෙස ජා.පා.මි.ද. (2013 = 100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, වසරේ පළමු කාර්තුවේ දී පහළ අගයක් ගන්නා ලදී. අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් දේශීය සැපයුම් අංශයේ ඇති වූ අවහිරතා සහ බදු සංශෝධනවල බලපෑම පිළිබිඹු කරමින් මතුපිට උද්ධමනය වසරේ දෙවන කාර්තුවේ දී ඉහළ යෑමක් වාර්තා කළේය. කෙසේ වුවත්, රාජ්‍ය බදු ව්‍යුහයෙහි සිදු කරන ලද සංශෝධන ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම මෙන්ම, දේශීය සැපයුම් තත්ත්වය යථා තත්ත්වයට පත් වීම හේතුකොටගෙන තුන්වන කාර්තුවේ දී උද්ධමනයෙහි යම්කිසි අඩු වීමක් දක්නට ලැබුණි. ඉන්පසුව උද්ධමනය බොහෝ සෙයින් ස්ථාවරව පැවති නමුත්, 2016 නොවැම්බර් මස සිට ක්‍රියාත්මක කරන ලද එකතු කළ අගය මත නව බදු අනුපාතික හේතුවෙන් මිල මට්ටම් මත පීඩනයක් ඇති විය. ඒ අනුව, 2016 ජූනි මස දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 6.4 ක උපරිම අගයක් වාර්තා කළ ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය, 2016 වසර අවසානය වන විට සියයට 4.2 දක්වා ක්‍රමයෙන් අඩු වී 2015 වසර අග පැවති මට්ටමට සමාන මට්ටමක පැවතිණ. කෙසේ වෙතත්, වාර්ෂික සාමාන්‍ය පදනම අනුව සැලකූ විට ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය 2015 වසර අවසානයේ පැවති සියයට 3.8 හා සැසඳීමේ දී 2016 වසර අවසානය වන විට සියයට 4.0 ක් දක්වා ඉහළ ගියේය. එවැනිම ප්‍රවණතාවක් පෙන්නුම් කරමින්, කො.පා.මි.ද. (2013 = 100) මත පදනම් වූ මතුපිට උද්ධමනය, 2016 ජූලි මස දී සියයට 5.8 ක් ලෙස ඉහළම අගයක් වාර්තා කළ ද, 2016 වසර අවසානයේ දී සියයට 4.5 ක් වූ අතර, වාර්ෂික සාමාන්‍ය පදනම මත එය වසර අවසානයේ දී සියයට 4.0 ක් විය. ආර්ථිකයෙහි යටිදැරි උද්ධමන පීඩනය මනිනු ලබන මූලික උද්ධමනය, 2016 වසරේ දී ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ නමුත්, ඇතැම් මාසවල දී යම් විචලනයන් පෙන්නුම් කළේය. මුදල් හා ණය සමස්ත ඉහළ යෑමෙන් ඇති වූ ඉල්ලුම හා ඇදුණු උද්ධමන පීඩනවල බලපෑම, ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩ මිල ගණන් සාපේක්ෂව අඩු මට්ටමක පැවතීම හා පරිපාලිත මිල ගණන් සංශෝධනය කිරීම මගින් යටපත් වුව ද, රජය විසින් බදු ව්‍යුහයෙහි කරන ලද සංශෝධන හේතුවෙන් 2016 වසරේ මුල් භාගයේ දී මූලික උද්ධමනය ඉහළ ගියේය. බදු ව්‍යුහය සඳහා සිදු කරන ලද සංශෝධන තාවකාලිකව අත්හිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස මාස කිහිපයක් පුරා මූලික උද්ධමනය ස්ථාවරව පැවතුණ ද, බදු සංශෝධන යළි ක්‍රියාත්මක කිරීම හේතුවෙන් 2016 වසර අග දී මූලික උද්ධමනය ඉහළ ගියේය. ඒ අනුව, ජා.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය, වාර්ෂික ලක්ෂ්‍යමය

පදනම මත 2015 වසර අවසානයෙහි පැවති සියයට 5.8 ඉක්මවා යමින් 2016 වසර අවසානයේ දී සියයට 6.7 ක අගයක් වාර්තා කළේය. කො.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය 2015 වසර අවසානයෙහි පැවති සියයට 6.7 ක මට්ටමේ සිට 2016 වසර අවසානය වන විට සියයට 5.8 දක්වා අඩු විය. දැඩි මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති උද්ධමනය මත ඉල්ලුම් පීඩන බොහෝ දුරට මැඩපැවැත්වීමට හේතු වුවද, පැවති නියං තත්ත්වය, බදු ව්‍යුහයේ සිදු කරන ලද සංශෝධනවල බලපෑම හා ඉහළ යමින් පවතින ජාත්‍යන්තර භාණ්ඩ මිල ගණන්, 2017 වසරේ පළමු කාර්තුව තුළ දී උද්ධමනයෙහි සිදු වූ වෙනස්වීම් කෙරෙහි බලපෑවේය.

### විදේශීය අංශයේ වර්ධනයන්

**2016 වසර තුළ දී මධ්‍යස්ථ මට්ටමකින් ලද විදේශ විනිමය ලැබීම් ඉක්මවා විදේශ විනිමය ගෙවීම් සිදු වීමත් සමග ශ්‍රී ලංකාවේ විදේශීය අංශයෙහි මන්දගාමී ක්‍රියාකාරිත්වය අඛණ්ඩව පැවතුණි.** ඇමෙරිකා එක්සත් ජනපදයෙහි මුදල් ප්‍රතිපත්තිය ක්‍රමයෙන් දැඩි කිරීම, ඇතැම් දියුණු ආර්ථිකවල සහ නැගීඑන වෙළඳපොළ ආර්ථිකයන්හි ආර්ථික තත්ත්වය මන්දගාමී ලෙස යථා තත්ත්වයට පත් වීම නිසා විදේශීය ඉල්ලුම අඩු වීම සහ මැද පෙරදිග රටවල අඛණ්ඩව පැවති භූ-දේශපාලනික අවිනිශ්චිතතාව හේතුවෙන් විදේශීය අංශයෙහි ක්‍රියාකාරිත්වය සැලකිය යුතු ලෙස පසුබෑමකට ලක් විය. සේවා වෙළඳ ගිණුමෙහි සහ ද්විතීයික ආදායම් ගිණුමෙහි අතිරික්තයක් වාර්තා වුව ද, විශේෂයෙන් ම වසරේ අවසාන කාර්තුවේ දී වෙළඳ හිඟය පුළුල් වීම සහ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය හේතුවෙන් 2016 වසරේ දී ජංගම ගිණුමේ හිඟයෙහි පිරිහීමක් දක්නට ලැබුණි. ණය නොවන ලැබීම් අඩු වීම හමුවේ ණය ආපසු ගෙවීම් වශයෙන් සිදු කරන ලද අඛණ්ඩ ගෙවීම් හේතු කොට ගෙන ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුමෙහි ක්‍රියාකාරිත්වය මන්දගාමී විය. මේ අතර, වසර තුළ දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ඉවත් කර ගැනීම සිදු වූ අතර, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමට පැවති පීඩනය අවම කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ කටයුතුවලට මැදිහත් විය. 2016 වසරේ ගෙවුම් තුලනයෙහි සමස්ත හිඟය එ.ජ. ඩොලර් මිලියන 500 ක් වශයෙන් වාර්තා වූ අතර, දළ සංචිත වත්කම් තත්ත්වය 2015 වසර අවසානයේ පැවති එ.ජ. ඩොලර් බිලියන 7.3 ක මට්ටමේ සිට 2016 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 6.0 ක් දක්වා අඩු විය. මෙම වර්ධනයන් පිළිබිඹු කරමින්, 2016 වසරේ දී එ.ජ. ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල සියයට 3.83 කින් අවප්‍රමාණය විය.

**1.5 රූප සටහන**
**ගෙවුම් තුලනය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**වසරේ පළමු මාස හතර තුළ දී සමුච්චිත පදනම මත වෙළඳ හිඟය අඩු වුව ද, වසර අවසානය වන විට එය සැලකිය යුතු ලෙස වැඩි විය.** 2015 වසරට සාපේක්ෂව අපනයන පහළ යෑම සහ වසරේ අවසාන කාර්තුව තුළ දී ආනයන විශාල ලෙස ඉහළ යෑම, වෙළඳ හිඟය පුළුල් වීමට හේතු විය. මේ අනුව, වෙළඳ හිඟය 2015 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 8,388 ට සාපේක්ෂව 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 9,090 ක් දක්වා පුළුල් වූ අතර, එය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 2015 වසරේ පැවති සියයට 10.4 සිට සියයට 11.2 දක්වා ඉහළ ගියේය.

**කෘෂිකාර්මික සහ කාර්මික අපනයන ආදායම පහළ යෑම හේතුවෙන් 2016 වසරේ දී අපනයන ආදායම අඛණ්ඩව දෙවන වසරටත් අඩු විය.** ප්‍රධාන වශයෙන්, ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩ මිල ගණන්වල පහළ යෑම, ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්තවල සිදු වූ මධ්‍යස්ථ ආර්ථික වර්ධනය සහ අපනයන අරමුණු කොට ගත් කෘෂිකාර්මික නිෂ්පාදිතවල දේශීය සැපයුම අඩු වීම, අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 10,310 ක් දක්වා සියයට 2.2 කින් අඩු වීමට හේතු විය. කෙසේ වුව ද, ඇමෙරිකා එක්සත් ජනපදය විසින් ඉරානය මත පනවා තිබූ සම්බාධක ජනවාරි මාසයේ දී ඉවත් කිරීම සහ යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාවේ මත්ස්‍ය අපනයන මත පනවා තිබූ තහනම ජූනි මාසයේ දී ඉවත් කිරීම, සමස්ත අපනයනවල අඩු වීම යම් දුරකට මගහැරවීමට හේතු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2016 වසරේ අවසානය වන විට පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අපනයන අඩු වීමේ ප්‍රවණතාව වෙනස් විය. රෙදිපිළි සහ ඇඟලුම් (සියයට 1.3) සහ මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (සියයට 60.5) අපනයන ආදායම්වල වර්ධනයක් පැවතිය ද, ප්‍රවාහන උපකරණ

1

(සියයට -46.0), ඛනිජ තෙල් නිෂ්පාදිත (සියයට -23.3), තේ (සියයට -5.3) සහ කුළුබඩු (සියයට -16.0) අපනයන ආදායම් අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස සමස්ත අපනයන ආදායම පහළ ගියේය. ප්‍රධානතම අපනයන ගමනාන්ත දහය නොවෙනස්ව පැවති අතර, මුළු අපනයනවලින් සියයට 27.3 ක් වාර්තා කරමින් ඇමෙරිකා එක්සත් ජනපදය තවදුරටත් ප්‍රධාන අපනයන ගමනාන්තය ලෙස පැවතිණ. එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය, පිළිවෙළින්, සෙසු ප්‍රධාන අපනයන ගමනාන්ත ලෙස පැවතුණි. මේ අතර, 2016 වසරේ දී සමස්ත අපනයන පරිමා දර්ශකය සියයට 0.7 කින් සුළු වශයෙන් පහළ ගිය අතර, එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද අපනයන මිල දර්ශකය සියයට 1.5 කින් පහළ ගියේය.

**විශේෂයෙන්ම, 2016 වසරේ අවසාන කාර්තුවේ දී අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන වියදම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන්, 2016 වසරේ දී සමස්ත ආනයන වියදම ඉහළ ගියේය.** ජාත්‍යන්තර වෙළඳපොළ තුළ භාණ්ඩ මිල ගණන් පහළ යෑම සහ ආනයන සීමා කිරීම සඳහා රජය සහ මහ බැංකුව විසින් ගනු ලැබූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල වාසිය, ආයෝජන භාණ්ඩ සහ ඉන්ධන නොවන අන්තර් භාණ්ඩ ආනයනය ඉහළ යෑම හේතුවෙන් තරමක් දුරට මගහැරී ගියේය. යන්ත්‍රසූත්‍ර හා උපකරණ (සියයට 20.3) සහ ගොඩනැගිලි ද්‍රව්‍ය (සියයට 16.0) ආනයන වියදම සැලකිය යුතු ලෙස වර්ධනය වීම, ආයෝජන භාණ්ඩ ආනයනය සියයට 13.8 කින් වර්ධනය වීමට හේතු වූ අතර, ඉන්ධන නොවන ආනයන වියදම සියයට 4.2 කින් වර්ධනය වීමට එය ප්‍රධාන වශයෙන් දායක විය. මීට අමතරව, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, දියමන්ති, අගනා ගල් සහ ලෝහ වර්ග වැනි අන්තර් භාණ්ඩ ආනයනවල වැඩිවීම (සියයට 2.4), ආනයන වියදමෙහි ඉහළ යෑමට සැලකිය යුතු ලෙස දායක විය. ගල්අඟුරු ආනයන වියදම ඉහළ ගිය ද, බොර තෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් සඳහා වූ ආනයන වියදම පහළ යෑම හේතුවෙන් සමස්ත ඉන්ධන ආනයන වියදම පහළ ගියේය. 2015 වසර හා සැසඳීමේ දී, මෙම වසර තුළ පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 8.4 කින් අඩු වූ අතර, ඒ සඳහා මූලික වශයෙන් පෞද්ගලික රථවාහන ආනයනය සඳහා දරන ලද වියදම සියයට 41.5 කින් සැලකිය යුතු ලෙස පහළ යෑම හේතු විය. මෙම ප්‍රවණතාවල ප්‍රතිඵලයක් ලෙස, 2016 වසර තුළ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 19,400 ක් දක්වා සියයට 2.5 කින් ඉහළ ගියේය. 2001 වසරේ සිට ඉන්දියාව ප්‍රධාන ආනයන මූලාශ්‍රය ලෙස පැවතිය ද, 2016 වසරේ දී චීනය ප්‍රධාන ආනයන මූලාශ්‍රය බවට පත් විය. මෙම වසර තුළ, සමස්ත ආනයන පරිමා දර්ශකය සියයට 7.9 කින් ඉහළ ගිය අතර, එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද ආනයන මිල දර්ශකය, ගෝලීය ආර්ථිකය තුළ පැවති අවධමන තත්ත්වයන් පෙන්නුම් කරමින් සියයට 5.1 කින් පහළ ගියේය.

**සේවා ගිණුම සහ ද්විතීයික ආදායම් ගිණුම අතිරික්තයන් වාර්තා කළ ද, වෙළඳ හිඟය සහ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය ඉහළ යෑම හේතුවෙන් 2016 වසරේ දී විදේශීය ජංගම ගිණුමේ හිඟය පුළුල් විය.** මූලික වශයෙන් සංචාරක ඉපැයීම් ඉහළ යෑම මෙන්ම ප්‍රවාහන හා විදුලි සන්දේශ, පරිගණක හා තොරතුරු සේවා අපනයන මගින් වසර තුළදී අඛණ්ඩව සේවා ගිණුමෙහි අතිරික්තයක් වාර්තා විය. 2016 වසරේ දී සේවා අපනයනවලින් ලද ආදායම එ.ජ. ඩොලර් මිලියන 7,138 ක් දක්වා සියයට 11.6 කින් වර්ධනය විය. සංචාරක පැමිණීම් ඉහළ යෑමට අමතරව, විදේශීය සංචාරකයෙකුගේ ඇස්තමේන්තුගත සාමාන්‍ය දෛනික වියදම ඉහළ යෑම සහ විදේශීය සංචාරකයෙකු විසින් මෙරට ගත කරනු ලබන ඇස්තමේන්තුගත සාමාන්‍ය කාලයෙහි ඉහළ යෑම හේතුවෙන් මෙම වසර තුළ සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 3,518 ක් දක්වා සියයට 18.0 කින් වර්ධනය විය. 2016 වසරේ දී විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවාවලින් ලද අපනයන ආදායම 2015 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 805 සිට එ.ජ.ඩොලර් මිලියන 858 දක්වා ඉහළ ගියේය. මේ අතර, ප්‍රාථමික ආදායම් ගිණුම වෙතින් එ.ජ. ඩොලර් මිලියන 2,304 ක ගෙවීම් සිදු කරන ලද අතර ඒ සඳහා ඉහළ පොලී ගෙවීම් සහ ප්‍රතිආයෝජිත ඉපැයීම් හා ලාභාංශ ගෙවීම් හේතු විය. මෙම ආපසු ගෙවීම් ඉහළ යෑම සහ සංචිත වත්කම් මගින් වන ඉපැයීම් පහළ යෑම, 2016 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය පුළුල් වීමට හේතු විය. මැදපෙරදිග පවතින භූ-දේශපාලනික අස්ථාවරභාවය සහ එම රටවල ආදායම් මට්ටම් අඩු වීම මෙන්ම, නුපුහුණු කාණ්ඩය යටතේ සිදු වන ශ්‍රම සංක්‍රමණ අධෛර්යවත් කිරීමේ දේශීය ප්‍රතිපත්ති හේතුවෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. මේ අනුව, 2016 වසරේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 7,242 ක් දක්වා සියයට 3.7 කින් මධ්‍යස්ථ ලෙස වර්ධනය විය. මෙම තත්ත්වයන් පිළිබිඹු කරමින්, 2016 වසරේ දී ජංගම ගිණුමේ හිඟය එ.ජ. ඩොලර් මිලියන 1,942 ක් දක්වා පුළුල් වූ අතර, එය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 2015 වසරේ දී පැවති සියයට 2.3 සිට සියයට 2.4 දක්වා වැඩි විය.

**2016 වසර තුළ දී මූල්‍ය ගිණුමෙහි ශුද්ධ වගකීම්වල වෙනස්වීම් මෙන්ම ශුද්ධ වත්කම් අත්කර ගැනීම් අඩු මට්ටමක පැවතුණි.** මේ අනුව, ශුද්ධ වගකීම්වල

වෙනස්වීම් 2015 වසරේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 3,223 හා සැසඳීමේ දී 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,199 ක් වූ අතර ශුද්ධ වත්කම් අත්කර ගැනීම් පෙර වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 911 ට සාපේක්ෂව 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 82 ක් විය. ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් විසින් ලබා ගන්නා ලද විදේශීය ණය ද ඇතුළත් මුළු විදේශීය සෘජු ආයෝජන, 2015 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,160 හා සසඳන විට 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,079 ක් විය. 2016 වසරේ දී කොටස් වෙළඳපොළ සඳහා වූ විදේශීය විවිධ ආයෝජන පහළ මට්ටමක පැවති අතර, රුපියල්වලින් නාමනය කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර සහ එ.ජ. ඩොලර්වලින් නාමනය කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජනවලට අදාළව ආපසු ගෙවීම් වාර්තා විය. 2016 වසරේ ජූලි මාසයේ දී ශ්‍රී ලංකාව සිය දසවන අන්තර්ජාතික ස්වෛරීත්ව බැඳුම්කරය මගින් එ.ජ. ඩොලර් මිලියන 1,500 ක් ලබා ගන්නා ලද අතර, එය ද්විත්ව කල් පිරීමේ කාලයක් සහිතව නිකුත් කළ පළමු ස්වෛරීත්ව බැඳුම්කරය විය. 2016 වසරේ දී රජය වෙත ලැබුණු විදේශීය ණය ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 2,163 ක් දක්වා ඉහළ ගියේය. එම ප්‍රමාණය, ව්‍යාපෘති ණය ලෙස වූ එ.ජ. ඩොලර් මිලියන 1,278 කින් ද, එ.ජ. ඩොලර් මිලියන 700 ක කාලීන විදේශ විනිමය මූල්‍ය පහසුකම් දෙකකින් ද, එ.ජ. ඩොලර් මිලියන 185 ක වැඩසටහන් ණය පහසුකම්වලින් ද සමන්විත විය. මේ අතර, ගෙවුම් තුලනය පිරිහීම වැළැක්වීම සහ රජයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයට සහාය ලබා ගැනීම යන අරමුණු ඇතිව ශ්‍රී ලංකාව ජා.මූ. අරමුදල වෙතින් විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) බිලියන 1.1 ක (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 1.5 ක) තුන් අවුරුදු විස්තීර්ණ ණය පහසුකමක් ඉල්ලා සිටි අතර, 2016 වසර තුළ දී එහි පළමු හා දෙවන වාරික ලෙස එ.ජ. ඩොලර් මිලියන 332 ක් ලැබිණි. 2009 වසරේ ජා.මූ. අරමුදලෙන් ලබා ගන්නා ලද සමීපස්ථ ණය පහසුකම වෙනුවෙන් වූ ගෙවීම් අඛණ්ඩව සිදු කරමින් 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 455 ක මුදලක් ආපසු ගෙවන ලදී.

**ජංගම ගිණුමේ හිඟය පුළුල් වීම සහ මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් සාපේක්ෂ වශයෙන් අඩු මට්ටමක පැවතීම පිළිබිඹු කරමින් 2016 වසරේ දී ගෙවුම් තුලනයෙහි සමස්ත ශේෂයෙහි හිඟයක් වාර්තා විය.** 2015 වසරේ දී වාර්තා වූ සමස්ත හිඟය වන එ.ජ. ඩොලර් මිලියන 1,489 ට සාපේක්ෂව 2016 වසරේ දී සමස්ත හිඟය එ.ජ. ඩොලර් මිලියන 500 ක් විය. මේ අතර, 2016 වසර අවසානය වන විට ශ්‍රී ලංකාවේ දළ සංචිත වත්කම් තත්ත්වය, භාණ්ඩ ආනයනික මාස 3.7 කට සහ භාණ්ඩ හා සේවා ආනයනික මාස 3.1 කට සමාන වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 6.0 දක්වා පහත වැටුණි. විදේශ විනිමය ණය සේවාකරණ ගෙවීම්, විදේශ විනිමය හුවමාරු ගිවිසුම් පියවීම, ජා.මූ. අරමුදලේ සමීපස්ථ ණය පහසුකමෙහි ගෙවීම් සහ විශේෂයෙන්ම, වසරේ පළමු භාගයේ දී මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළට ද්‍රවශීලතාව සැපයීම, දළ නිල සංචිතවල මෙම අඩු වීම සඳහා මූලික වශයෙන්ම හේතු විය. 2016 වසර අවසානයේ දී මුළු විදේශීය වත්කම් ප්‍රමාණය, භාණ්ඩ ආනයනික මාස 5.2 ක් හා භාණ්ඩ හා සේවා ආනයනික මාස 4.3 ක් ආවරණය කිරීමට ප්‍රමාණවත් වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 8.4 ක් විය.


**මූලික වශයෙන්, රජයේ විදේශීය ණය ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් 2016 වසර තුළ දී රටෙහි මුළු විදේශීය ණය ප්‍රමාණය ඉහළ ගියේය.** නොපියවූ විදේශීය ණය ප්‍රමාණය, 2015 වසර අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් බිලියන 44.8 (ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 55.7 ක) සිට 2016 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 46.6 ක් (ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 57.3) දක්වා ඉහළ ගියේය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම්, කාලීන විදේශ විනිමය මූල්‍ය පහසුකම් ලබා ගැනීම සහ ව්‍යාපෘති ණය ලැබීම් සමඟ රජයේ විදේශීය ණය ගැනීම් ඉහළ ගියේය. විදේශීය ණය සඳහා වූ වාරික ගෙවීම් 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 3,157 ක් ලෙස ඉහළ මට්ටමක පැවතුණ ද, එය 2015 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,435 සමඟ සැසඳීමේ දී අඩු අගයකි. වසර තුළ සිදු කරන ලද ඉහළ අගයක් ගත් ණය ආපසු ගෙවීම් ප්‍රමාණයට විදේශ විනිමය හුවමාරු පහසුකම් පියවීම සහ ජා.මූ. අරමුදලේ සමීපස්ථ ණය පහසුකම යටතේ ණය ආපසු ගෙවීම් ඇතුළත් විය. තවද, පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන මගින් සිදු කරන ලද පොලී ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් 2016 වසරේ දී නොපියවූ විදේශීය ණය සඳහා සිදු කළ පොලී ගෙවීම්, 2015 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,190 සිට එ.ජ. ඩොලර් මිලියන 1,209 ක් දක්වා ඉහළ ගියේය.

**2016 වසරේ දී ස්ටර්ලින් පවුම හැර අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය විය.** රුපියල අවප්‍රමාණය වීමට පැවති පීඩනය සඳහා ආනයන ඉහළ යෑම, අඛණ්ඩව සිදු කරන ලද ණය සේවාකරණ ගෙවීම් සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම මධ්‍යයේ දේශීය රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ආපසු

ගලා යෑම හේතු විය. වෙළෙඳපොළ ද්‍රවශීලතාව සැපයීම සඳහා මහ බැංකුව විසින් වසරේ පළමු මාස හතර තුළ දී වෙළඳපොළට විදේශ විනිමය විශාල වශයෙන් සපයන ලද අතර, ඉන් අනතුරුව විදේශ විනිමය සැපයීම අඩු වශයෙන් සිදු කරන ලදී. 2015 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,250 ක ශුද්ධ විදේශ විනිමය සැපයුමට සාපේක්ෂව මෙම වසර තුළ එ.ජ. ඩොලර් මිලියන 768 ක ශුද්ධ විදේශ විනිමය සැපයුමක් මහ බැංකුව විසින් සිදු කෙරිණ. මූලික වශයෙන් රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි ආයෝජන, විදේශීය ආයෝජකයන් විසින් ඉවත් කර ගැනීම හේතුවෙන් විනිමය අනුපාතිකය මත ඇති වූ පීඩනය අවම කිරීමට මහ බැංකුව විදේශ විනිමය වෙළඳපොළ තුළ මැදිහත් වීම මේ සඳහා හේතු විය. වසරේ පළමු මාස හතර තුළ මහ බැංකුව විසින් දේශීය විනිමය වෙළඳපොළ තුළ සිදු කරන ලද මැදිහත්වීම හේතුවෙන් සමස්තයක් ලෙස ස්ථාවරව පැවති රුපියල, වසරේ දෙවන භාගය තුළ වෙළඳපොළ ඉල්ලුම් සහ සැපයුම් තත්ත්වයන් බොහෝ දුරට පිළිබිඹු වන ලෙස විචලනය වීමට ඉඩ හැරීම හේතුවෙන්, 2016 වසර තුළ එ.ජ. ඩොලරයට එරෙහිව රුපියල සියයට 3.83 කින් අවප්‍රමාණය විය. රුපියල නාමිකව අවප්‍රමාණය වුවත්, එහි විදේශීය තරගකාරී බව පහළ යෑම පිළිබිඹු කරමින් නාමික විනිමය අනුපාතිකවල වෙනස්වීම් සහ රටවල් අතර උද්ධමන වෙනස්වීම් සැලකිල්ලට ගනු ලබන මුදල් වර්ග 5 කින් සහ මුදල් වර්ග 24 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක වසර අවසානය වන විට, පිළිවෙළින්, සියයට 2.83 කින් සහ සියයට 2.70 කින් අතිප්‍රමාණය විය.

**1.6 රූප සටහන**

**දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මහ බැංකුවේ මැදිහත්වීම හා විනිමය අනුපාතිකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


## රාජ්‍ය මූල්‍ය අංශයේ වර්ධනයන්

**රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා වන රජයේ කැපවීම හේතුකොට ගෙන බදු පදනම පුළුල් කිරීම, බදු පරිපාලනය හා සම්බන්ධ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීම තුළින් රාජ්‍ය ආදායම ඉහළ යෑම සහ රජයේ වියදම් තාර්කීකරණය කිරීම 2016 වසර තුළ රාජ්‍ය මූල්‍ය අංශයේ සිදුවූ සමස්ත වර්ධනයට දායක විය.** ආදායම මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියක් තුළින් අත්කරගත් රාජ්‍ය මූල්‍ය අංශයේ යහපත් වර්ධනය හේතුවෙන් අයවැය හිඟය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරේ වාර්තා වූ සියයට 7.6 හා සැසඳීමේ දී 2016 වසරේ ඉලක්කගත මට්ටම වූ සියයට 5.4 ක මට්ටමේ රඳවා ගැනීමට හැකි විය. ඒ හා සමගාමීව, රජයේ නිර්ඉතුරුම් පිළිබිඹු කරනු ලබන වර්තන ගිණුමේ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2015 වසරේ වාර්තා වූ සියයට 2.3 සිට 2016 වසරේ දී සියයට 0.6 දක්වා සැලකිය යුතු ලෙස අඩුවිය. සමස්ත අයවැය හිඟයෙන් පොලී ගෙවීම් ඉවත් කිරීම මගින් ගණනය කරනු ලබන ප්‍රාථමික ගිණුමේ හිඟය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2015 වසරේ වාර්තා වූ සියයට 2.9 සිට 2016 වසරේ දී සියයට 0.2 දක්වා අඩු විය. කෙසේ වෙතත්, බදු පරිපාලනයේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ පැවති මන්දගාමීත්වය රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය අඩුවීම කෙරෙහි බලපෑවේය. එසේම, පොලී ගෙවීම්, වැටුප් හා වේතන සහ ගෘහ කුටුම්බ සඳහා වන සහනාධාර හා පැවරුම් ඇතුළත් පුනරාවර්තන වියදම්වල වසර තුළ දී යම් අඩු වීමක් දැකිය හැකි වුවද, එම වියදම් ඉහළ අගයක පැවතිණි. තවද, දේශීය සහ ජාත්‍යන්තර වෙළඳපොළවල පොලී අනුපාතික ඉහළ යෑමත්, ප්‍රධාන විදේශ මුදල් වර්ගවලට එරෙහිව රුපියල අවප්‍රමාණයට ලක්වීමත් හේතුවෙන් ණය සඳහා දැරිය යුතු පිරිවැය ඉහළ යෑම නිසා රාජ්‍ය මූල්‍ය අංශය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති විය. මෙම ප්‍රවණතාව සහ කෙටිකාලීන හා මැදිකාලීන පරිණතවීම් කාලයක් සහිත විදේශීය වාණිජ ණය සැලකිය යුතු ප්‍රමාණයක් ඒකරාශී වීම තුළින් පැහැදිලි වන්නේ රාජ්‍ය මූල්‍ය හා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ නිසිකලට කඩිනමින් ක්‍රියාත්මක කිරීම තුළින් තිරසාර රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියක් සඳහා ජාතික එකඟතාවයක් අවශ්‍ය බවයි.

**2015 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 13.3 ක් වූ රාජ්‍ය ආදායම 2016 වසරේ දී සියයට 14.2 ක් දක්වා දෙවන වසරටත් ඉහළ ගිය අතර, රජයේ බදු නොවන ආදායම ඉහළ යෑම මීට ප්‍රධාන වශයෙන් හේතු විය.** 2016 වසර තුළදී, බදු ආදායම 2015 වසරේ පැවති රුපියල් බිලියන 1,355.8 සිට 2016 වසරේ දී රුපියල් බිලියන 1,463.7 දක්වා

**1.7 රූප සටහන**

**රාජ්‍ය ආදායම, වියදම සහ සමස්ත අයවැය ශේෂය (ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස)**




මූලය: මුදල් අමාත්‍යාංශය

සියයට 8.0 කින් ඉහළ ගිය ද, බදු ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරේ පැවති සියයට 12.4 මට්ටමේ පැවතිණි. එකතු කළ අගය මත බදු, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සහ ආනයන බදුවලින් ලද ආයකත්වය හේතුවෙන් බදු ආදායම ඉහළ ගිය අතර, මෝටර් රථ වාහන මත වූ නිෂ්පාදන බදු, සංස්ථාපිත හා සංස්ථාපිත නොවන ආදායම් බදු සහ රඳවා ගැනීමේ බදුවලින් ලද ආදායම පහළ ගියේය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස බදු නොවන ආදායම 2015 වසරේ වාර්තා වූ සියයට 0.9 සිට 2016 වසරේ දී සියයට 1.9 දක්වා ඉහළ ගිය අතර, නාමික වශයෙන් ද එය රුපියල් බිලියන 222.4 දක්වා දෙගුණයකටත් වඩා වැඩි අගයකින් ඉහළ ගියේය. බැංකු හා රක්ෂණ අංශ සහ ශ්‍රී ලංකා විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාව ආදියෙහි ඉහළ කාර්යසාධනයෙහි ප්‍රතිඵලයක් ලෙස රජය සතු වාණිජ ව්‍යවසාය වෙතින් ලද ලාභ හා ලාභාංශ පැවරුම් ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, බදු හා බදු නොවන ආදායමේ සිදු වූ වර්ධනයන් පිළිබිඹු කරමින්, රාජ්‍ය ආදායම 2015 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 1,454.9 හා සැසඳීමේ දී 2016 වසර තුළ දී රුපියල් බිලියන 1,686.1 දක්වා සියයට 15.9 කින් ඉහළ ගියේය. රජයේ මුළු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස බදු ආදායම සියයට 86.8 ක් වූ අතර, රාජ්‍ය බදු ආදායම සඳහා ප්‍රධානතම දායකත්වය දරන වක්‍ර බදු ආදායම බදු ආදායමෙන් සියයට 82.3 ක් විය.

**ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස මුළු වියදම හා ශුද්ධ ණයදීම් 2015 වසරේ වාර්තා වූ සියයට 20.9 සිට 2016 වසරේ දී සියයට 19.7 දක්වා අඩු වූ අතර, පුනරාවර්තන වියදම් මෙන්ම ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණයදීම්වල පහළ යෑම එමගින් පිළිබිඹු විය.** පුනරාවර්තන වියදම් තාර්කිකරණය කිරීම සහ ප්‍රාග්ධන වියදම් ප්‍රමුඛතාව මත සිදු කිරීම සඳහා දරන ලද රජයේ ප්‍රයත්නය හේතුවෙන් රජයේ වියදම් පහළ ගියේය. ඒ අනුව, පුනරාවර්තන වියදම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2015 වසරේ වාර්තා වූ සියයට 15.5 සිට 2016 වසරේ දී සියයට 14.8 දක්වා අඩු විය. කෙසේ වෙතත්, පුනරාවර්තන වියදම් නාමික වශයෙන් 2015 වසරේ පැවති රුපියල් බිලියන 1,701.7 සිට 2016 වසරේ දී රුපියල් බිලියන 1,757.8 දක්වා සියයට 3.3 කින් ඉහළ ගිය අතර, පොලී ගෙවීම් මෙන්ම වැටුප් හා වේතන සහ වර්තන පැවරුම් හා සහනාධාර සඳහා වූ වියදම් ඉහළ යෑම ඒ සඳහා මූලික වශයෙන් හේතු විය. වසර තුළ දී පොලී ගෙවීම් සඳහා වූ වියදම ඉහළ යෑමට දේශීය හා විදේශීය වෙළඳපොළ තුළ පැවති ඉහළ පොලී අනුපාතික මට්ටම්, ප්‍රධාන විදේශ මුදල් කිහිපයකට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම සහ නොපියවූ දේශීය ණය මට්ටම ඉහළ යෑම හේතු විය. ඒ අනුව, පොලී වියදම නාමික වශයෙන් 2015 වසරේ පැවති රුපියල් බිලියන 509.7 සිට 2016 වසරේ දී රුපියල් බිලියන 610.9 දක්වා සියයට 19.9 කින් ඉහළ ගියේය. වසර තුළ දී වැටුප් හා වේතන වියදම නාමික වශයෙන්, රුපියල් බිලියන 576.5 දක්වා සියයට 2.6 කින් ඉහළ ගියේය. මේ අතර, රාජ්‍ය ආයෝජන වැඩසටහන ක්‍රමවත් සහ ප්‍රමුඛතා පදනම මත සිදු කිරීම පිළිබිඹු කරමින්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රාග්ධන වියදම හා ශුද්ධ ණයදීම් 2015 වසරේ වාර්තා වූ සියයට 5.4 සිට 2016 වසරේ දී සියයට 4.9 දක්වා අඩුවූ අතර, වසර තුළ දී නාමික වශයෙන් ද එය රුපියල් බිලියන 576.1 දක්වා සියයට 2.1 ක පහළ යෑමක් වාර්තා කළේය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් වශයෙන් රාජ්‍ය ආයෝජන 2015 වසරේ පැවති සියයට 5.5 සිට 2016 වසරේ දී සියයට 5.0 දක්වා අඩු වූ අතර, නාමික වශයෙන් එය 2015 වසරේ පැවති රුපියල් බිලියන 602.8 සිට 2016 වසරේ දී රුපියල් බිලියන 594.0 දක්වා සියයට 1.5 කින් පහළ ගියේය.

**වසර තුළ දී රුපියල් බිලියන 640.3 ක් වූ සමස්ත අයවැය හිඟයෙන් වැඩි ප්‍රමාණයක් විදේශීය මූලාශ්‍රවලින් මූල්‍යනය කරන ලදී.** ඒ අනුව, සමස්ත මූල්‍යනයෙන් සියයට 61.2 ක් සඳහා විදේශීය මූලාශ්‍ර දායක වූ අතර, ඉතිරිය දේශීය මූලාශ්‍රවලින් පියවන ලදී. ශුද්ධ දේශීය මූල්‍යනය 2015 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 592.7 සිට 2016 වසරේ දී රුපියල් බිලියන 248.4 දක්වා අඩු වූ අතර, 2016 වසර තුළ දී විදේශීය මූල්‍යනය රුපියල් බිලියන 391.9 දක්වා ඉහළ ගියේය. දේශීය මූල්‍යනය සම්බන්ධයෙන් සැලකූ විට, ශුද්ධ දේශීය ණය ගැනීම්වලින් සියයට 56.3 ක් බැංකු


1

අංශයෙන් සිදු කරන ලද ණය ගැනීම් වූ අතර, එය 2015 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 291.8 සිට 2016 වසරේ දී රුපියල් බිලියන 140.0 දක්වා සියයට 52.0 කින් පහළ ගියේය. භාණ්ඩාගාර බැඳුම්කර මගින් සිදු කළ මූල්‍යනය සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද, භාණ්ඩාගාර බිල්පත් හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හරහා වාණිජ බැංකුවලින් සිදු කරන ලද ණය ගැනීම්වල සැලකිය යුතු අඩුවීමක් වාර්තා විය. කෙසේ වුවද, මහ බැංකුවෙන් සිදු කරන ලද ණය ගැනීම් පසුගිය වසරේ පැවති රුපියල් බිලියන 80.3 සිට රුපියල් බිලියන 183.1 දක්වා සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ යෑම, වාණිජ බැංකු වෙතින් ණය ගැනීම් පහළ යෑම නිෂේධනය කිරීමට හේතු විය. තවද, බැංකු නොවන අංශයෙන් සිදු කරන ලද ශුද්ධ මූල්‍යනය 2015 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 300.9 සිට 2016 වසරේ දී රුපියල් බිලියන 108.5 දක්වා අඩු විය.

**ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් වශයෙන් මධ්‍යම රජයේ ණය ප්‍රමාණය 2015 වසර අවසානය වන විට පැවති සියයට 77.6 සිට 2016 වසර අවසානය වන විට සියයට 79.3 දක්වා ඉහළ ගියේය.** ශුද්ධ ණය ගැනීම් ඉහළ යෑම සහ ආර්ථික වර්ධනය මන්දගාමී වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මධ්‍යම රජයේ නොපියවූ මුළු ණය ප්‍රමාණයෙහි නාමික අගය 2015 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 8,503.2 සිට 2016 වසර අවසානයේ දී රුපියල් බිලියන 9,387.3 දක්වා ඉහළ ගියේය. 2016 වසර අවසානයේ දී මධ්‍යම රජයේ නොපියවූ මුළු දේශීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 5,341.5 දක්වා සියයට 7.7 කින් ඉහළ ගිය අතර, නොපියවූ විදේශීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 4,045.8 දක්වා සියයට 14.2 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

**1.8 රූප සටහන**

**මධ්‍යම රජයේ ණය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)**





මූලයන්: මුදල් අමාත්‍යාංශය
ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

## මුදල් අංශයේ වර්ධනයන්

**ආර්ථිකය තුළ අධික ඉල්ලුම් පීඩන ඉහළ යෑමට ඇති හැකියාව සීමා කිරීම තුළින් ආර්ථික ස්ථායීතාව ඇති කිරීමේ අරමුණ ඇතිව 2016 වසර තුළ දී මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලදී.** 2016 වසර තුළ දී රජයට සහ පෞද්ගලික අංශයට සපයන ලද ණය ප්‍රමාණයෙහි අධික ප්‍රසාරණය හේතුවෙන් මුදල් සමස්ත පුරෝකථනය කරන ලද මට්ටමට වඩා ඉහළ වේගයකින් වර්ධනය විය. එබැවින්, ශ්‍රී ලංකා මහ බැංකුව 2015 වසර අවසානයේ සිට මුදල් ප්‍රතිපත්තිය අදියර කිහිපයකින් දැඩි කිරීමට කටයුතු කළේය. ඒ අනුව, පළමුව, දේශීය මුදල් වෙළඳපොළ තුළ පැවති අධි ද්‍රවශීලතාව ස්ථිර පදනමකින් අවශෝෂණය කිරීම සඳහා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලුම රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2016 වසරේ ජනවාරි මස 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රතිශතාංක 1.50 කින් සියයට 7.50 දක්වා ඉහළ නංවන ලදී. තවද, ඉහළ යමින් පැවති උද්ධමන පීඩනය හේතුවෙන් මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික වන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) 2016 පෙබරවාරි මාසයේ දී පදනම් අංක 50 කින්, පිළිවෙළින්, සියයට 6.50 සහ සියයට 8.00 දක්වා ඉහළ නැංවීය. දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මධ්‍යයෙහි වුවද, පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණය අඛණ්ඩව වර්ධනය වූ අතර, වැඩි වශයෙන් බදු සංශෝධනවල බලපෑම සහ සැපයුම් අංශයේ ඇතිවූ අවහිරතා හේතුකොට ගෙන උද්ධමනය ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. උද්ධමන පීඩන ඉහළ යෑම මැඩපැවැත්වීම සහ ගෙවුම් තුලනය යහපත් බවට පත්කිරීමට සහාය වීම සඳහා 2016 ජූලි මාසයේ දී නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 7.00 සහ සියයට 8.50 දක්වා පදනම් අංක 50 බැගින් ඉහළ නැංවීම තුළින් මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් දැඩි කළේය. දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සමඟ විවට වෙළඳපොළ කටයුතු සිදු කිරීම, එක්දින පොලී අනුපාතික ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාවෙහි පවත්වා ගැනීමට හේතු විය. 2015 වසර අවසාන කාලයේ දී අනුගමනය කරනු ලැබූ සාර්ව විචක්ෂණශීලී ක්‍රියාමාර්ග මෙන්ම, 2016 වසර තුළ දී විනිමය අනුපාතිකය නම්‍යශීලීව තීරණය වීමට ක්‍රමානුකූලව ඉඩහැරීම මහ බැංකුවේ දැඩි මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා උපකාරී විය. මෙම ක්‍රියාමාර්ග මධ්‍යයෙහි වුවද රාජ්‍ය බදු ව්‍යුහයේ සිදු කරන ලද සංශෝධන නැවත ක්‍රියාත්මක කිරීම මෙන්ම, සැපයුම් අංශයේ ඇතිවූ අවහිරතා හේතුවෙන් 2016 වසර

**1.9 රූප සටහන**

**නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව සහ තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතික**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අවසානය වන විට මතුපිට උද්ධමනයෙහි ඉහළ යෑමේ ප්‍රවණතාවක් දක්නට ලැබුණු අතර, මූලික උද්ධමනය ද ඉහළ ගියේය. වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය වර්ධනයෙහි යම් අඩු වීමක් පෙන්නුම් කළ ද, විශේෂයෙන්ම 2017 මුල් කාලයේ දී සැපයුම් අංශයේ අවහිරතා සහ බදු ඉහළ යෑම නිසා ඉහළ ගිය උද්ධමනය පාලනය කිරීම සඳහා මහ බැංකුව 2017 මාර්තු මාසයේ දී මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් දැඩි කළේය. මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී වැඩි වශයෙන් ඉදිරි කාලීන දැක්මකින් යුතුව කටයුතු කිරීමේ නැඹුරුවකින් යුතුව මහ බැංකුව විසින් කල්ඇතිව අනුගමනය කරන ලද මෙම ක්‍රියාමාර්ග හේතුවෙන් අහිතකර උද්ධමන අපේක්ෂා ඇති වීම වැළැක්වීමත් අහිතකර අපේක්ෂාවල පසු බලපෑම අවම කිරීමත් අපේක්ෂා කෙරේ.

**ආර්ථිකයේ පැවති දැඩි මුදල් තත්ත්වය පිළිබිඹු කරමින් 2016 වසර තුළ දී වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ ගියේය.** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2016 ජනවාරි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ඉහළ නැංවීම, 2016 පෙබරවාරි මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම සහ දේශීය මුදල් වෙළඳපොළ අතිරික්ත රුපියල් ද්‍රවශීලතාව ක්‍රමයෙන් අඩු වීම හේතුවෙන් කෙටිකාලීන පොලී අනුපාතික ඉහළ ගියේය. ඒ අනුව, වර්තමානයෙහි අනුගමනය කෙරෙන වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුවෙහි මෙහෙයුම් ඉලක්කය වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) 2015 වසර අවසානයෙහි වාර්තා වූ සියයට 6.40 හා සැසඳීමේ දී 2016 පෙබරවාරි මාසය අවසානය වන විට සියයට 7.50 දක්වා ඉහළ ගියේය. 2016 අප්‍රේල් මුල් කාලය වන විට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාව ඉක්මවා සියයට 8.15 දක්වා වැඩි වුව ද, මහ බැංකුව විසින් සිදුකරන ලද විවට වෙළඳපොළ කටයුතු කෙටිකාලීන මුදල් වෙළඳපොළ පොලී අනුපාතිකවල උච්චාවචන බොහෝ දුරට පාලනය කිරීමට උපකාරී විය. 2016 ජූලි මාසය වන තෙක් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සියයට 8.15 - 8.24 මට්ටමේ පැවති අතර, 2016 ජූලි මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීමත් සමඟ එය සියයට 8.40 දක්වා ඉහළ ගොස් ඉන්පසුව ස්ථායී විය. 2016 වසර අවසානය වන විට එය සියයට 8.42 ක් ලෙස වාර්තා විය. වසරේ දෙවන භාගය වන විට යම් මන්දගාමී වීමක් පෙන්නුම් කළ ද දැඩි මුදල් තත්ත්වය සහ අරමුදල් සඳහා රජයේ ඉහළ ඉල්ලුම පිළිබිඹු කරමින් භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික 2016 වසර තුළ දී ඉහළ ගියේය. රජයට අවශ්‍ය අරමුදල් රැස් කිරීමේ දී වෙන්දේසි ක්‍රමය හා සෘජු ස්ථානගත ක්‍රමය යන දෙආකාරයෙන් සමන්විත මිශ්‍ර ක්‍රමවේදයක් උපයෝගී කර ගනිමින් සුරැකුම්පත් නිකුත් කරනු වෙනුවට, මහ බැංකුව වෙත පමණක් සුරැකුම්පත් සෘජුව ස්ථානගත කිරීමක් සහිත වෙන්දේසි ක්‍රමය යොදා ගැනීම රජයේ සුරැකුම්පත් සඳහා ඵලදා අනුපාතික ඉහළ නැංවීමට හේතු විය. ඒ අනුව, දින 91, දින 182 සහ දින 364 භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික 2015 වසර අවසානයේ වාර්තා වූ සියයට 6.45, සියයට 6.83 සහ සියයට 7.30 හා සැසඳීමේ දී 2016 වසර අවසානය වන විට, පිළිවෙළින්, සියයට 8.72, සියයට 9.63 සහ සියයට 10.17 දක්වා ඉහළ ගියේය. දිගුකාලීන පරිණත කාලයක් සහිත රජයේ සුරැකුම්පත් ඵලදා අනුපාතික ද මීට සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. මෙම ප්‍රවණතා සමඟ 2016 වසර තුළ දී වාණිජ බැංකුවල තැන්පතු සහ ණය පොලී අනුපාතිකවල කැපීපෙනෙන ඉහළ යෑමක් දැකිය හැකි විය. ඒ අනුව, බරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතිකය 2015 වසර අවසානයේ පැවති සියයට 6.20 සිට 2016 අවසානය වන විට සියයට 8.17 දක්වා පදනම් අංක 197 කින් ඉහළ ගිය අතර, බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය ද, 2015 අවසානයේ පැවති සියයට 7.57 සිට 2016 අවසානය වන විට සියයට 10.46 ක් දක්වා පදනම් අංක 289 කින් ඉහළ ගියේය. නව තැන්පතු සඳහා පිරිනමනු ලැබූ පොලී අනුපාතික ද වසර තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයෙහි බලපෑම, හිඟ ද්‍රවශීලතා තත්ත්වය සහ තැන්පතු පොලී අනුපාතික වැඩිවීම හේතුවෙන් අරමුදල් පිරිවැය ඉහළ යෑම පිළිබිඹු කරමින් ණය පොලී අනුපාතික ද ඉහළ ගියේය. ඒ අනුව, වාණිජ බැංකු විසින් සිය ප්‍රමුඛ

1


ගනුදෙනුකරුවන් වෙත සපයනු ලබන ණය සඳහා අය කරනු ලබන පොලී අනුපාතික මත පදනම්ව සතිපතා ගණනය කරනු ලබන බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය, 2015 වසර අවසානයේ පැවති සියයට 7.53 සිට 2016 වසර අවසානය වන විට සියයට 11.52 ක් දක්වා පදනම් අංක 399 කින් ඉහළ ගිය අතර, මාසික බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය 2015 වසර අවසානයේ පැවති සියයට 7.40 සිට 2016 වසර අවසානය වන විට සියයට 11.73 ක් දක්වා පදනම් අංක 433 කින් ඉහළ ගියේය. එමෙන්ම, බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය 2015 වසර අවසානයේ පැවති සියයට 11.00 සිට 2016 වසර අවසානය වන විට සියයට 13.20 දක්වා පදනම් අංක 220 කින් ඉහළ ගියේය. තවද, බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය ද 2015 වසර අවසානයේ වාර්තා වූ සියයට 10.79 සිට 2016 වසර අවසානය වන විට සියයට 14.37 ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

**සංචිත මුදල්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2015 වසර අවසානයේ පැවති සියයට 16.5 හා සැසඳීමේ දී 2016 වසර අවසානයේ දී සියයට 27.1 ක ඉහළ වර්ධනයක් වාර්තා කළේය.** ඒ අනුව, 2016 වසර අවසානය වන විට සංචිත මුදල් රුපියල් බිලියන 856.1 දක්වා රුපියල් බිලියන 182.7 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. වගකීම් අංශය සැලකූ විට, සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය සහ මහ බැංකුව වෙතැති වාණිජ බැංකු තැන්පතුවල ඉහළ යෑම තුළින් සංචිත මුදල්වල ප්‍රසාරණය පිළිබිඹු වේ. 2016 ජනවාරි මාසයේදී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ඉහළ නැංවීමේ ප්‍රතිඵලයක් ලෙස මහ බැංකුව වෙතැති වාණිජ බැංකු තැන්පතු 2016 වසර තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. වත්කම් අංශය අනුව ගත් කල, මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් ඉහළ යෑම, සංචිත මුදල් ඉහළ යෑම සඳහා මුළුමනින්ම හේතු වූ අතර, 2016 වසර තුළ දී ශුද්ධ විදේශීය වත්කම්වල අඩු වීමක් සිදු විය. ශුද්ධ දේශීය වත්කම් ඉහළ යෑම සඳහා මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් තොගයෙහි සිදු වූ සැලකිය යුතු ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් 2016 වසර අවසානය වන විට මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් බිලියන 413.0 දක්වා රුපියල් බිලියන 183.1 කින් ඉහළ ගියේය. රජයට අවශ්‍ය අරමුදල් ලබාගැනීම සඳහා වර්තමානයේ මුළුමනින්ම වෙන්දේසි ක්‍රමය මත පදනම් වීම සහ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ දී සෘජු ස්ථානගත කිරීම මහ බැංකුව වෙත පමණක් සිදු කිරීම මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය වැඩිවීමට ප්‍රධාන හේතුව විය.

**රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයටම සපයන ලද ණය ප්‍රමාණයෙහි ප්‍රසාරණය හේතුවෙන් පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) 2016 වසර තුළ දී පුරෝකථනය කළ අගයට වඩා ඉහළ වේගයකින් අඛණ්ඩව වර්ධනය විය.** ඒ අනුව, 2015 වසර අවසානයේ දී සියයට 17.8 ක අගයක් වාර්තා කළ පුළුල් මුදල් සැපයුමේ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2016 දෙසැම්බර් මාසය අවසානය වන විට සියයට 18.4 ක් වූ අතර, පුළුල් මුදල් සැපයුමේ සාමාන්‍ය වර්ධනය සියයට 18.1 ක ඉහළ මට්ටමක පැවතිණ. පෙර වසරේ දක්නට ලැබුණු ප්‍රවණතාව වෙනස් කරමින් 2016 වසර තුළ දී පුළුල් මුදල් සැපයුමේ වර්ධනය සඳහා දායක වෙමින් බැංකු අංශයේ ශුද්ධ විදේශීය වත්කම් ඉහළ ගියේය. කෙසේ වෙතත්, සියයට 92 ක පමණ දායකත්වයක් සපයමින් බැංකු අංශයේ ශුද්ධ දේශීය වත්කම් තවදුරටත් පුළුල් මුදල් සැපයුමේ ප්‍රසාරණය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. මේ සඳහා රජය සහ පෞද්ගලික යන දෙඅංශයට සපයන ලද ණය ප්‍රමාණය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. 2016 වසර තුළ දී රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය, අයවැය මගින් ඇස්තමේන්තුගත මට්ටම ඉක්මවා යමින් 2015 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 323.6 හා සැසඳීමේ දී 2016 වසර තුළ දී රුපියල් බිලියන 212.6 කින් ඉහළ ගියේය. මහ බැංකුව විසින් රජයට සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය 2015 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 80.3 හා සැසඳීමේ දී 2016 වසර තුළ දී රුපියල් බිලියන 183.1 කින් සැලකිය යුතු ලෙස ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන හේතුව වූ අතර වාණිජ බැංකු විසින් රජය වෙත ලබාදුන් ණය ද මෙම සමස්ත ඉහළ යෑම සඳහා ධනාත්මක දායකත්වයක් සැපයීය. 2015 වසර අවසානයේ දී

**1.10 රූප සටහන**

**පුළුල් මුදල් වර්ධනය හා තුඩුදුන් සාධක**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වාර්තා වූ රුපියල් බිලියන 79.2 හා සැසඳීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් තොගය (ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු හැර) 2016 වසර තුළ දී මෙතෙක් වාර්තා වූ ඉහළම මට්ටම වන රුපියල් බිලියන 330.0 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, මහ බැංකුව විසින් රජයට සපයන ලද ශුද්ධ ණය තොගයෙහි ප්‍රධාන සංරචකයක් වන තාවකාලික අත්තිකාරම් 2015 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 151.1 හා සැසඳීමේ දී 2016 වසරේ පළමු මාස එකොළහ තුළ දී රුපියල් බිලියන 184.6 ක සාමාන්‍යයක් වාර්තා කළ ද, 2016 වසර අවසානය වන විට රුපියල් බිලියන 83.3 දක්වා තාවකාලික වශයෙන් අඩු විය. 2016 දෙසැම්බර් මාසය තුළ දී මහ බැංකුව වෙත රුපියල් බිලියන 100 ක වටිනාකමකින් යුතු භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම තුළින් ලබාගත් අරමුදල් උපයෝගී කොට ගෙන තාවකාලික අත්තිකාරම්වලින් කොටසක් රජය විසින් පියවීම මේ සඳහා හේතු විය. රජයේ මුදල් ප්‍රවාහ අවශ්‍යතා සඳහා පහසුකම් සැලසූ මෙම තාවකාලික ගනුදෙනුව 2017 ජනවාරි මාසයේ දී රජය විසින් යළි හරවන ලදී. එසේ වුව ද, විශේෂයෙන්ම, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඇතුළු රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යවසායන්හි යහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් බැංකු අංශය විසින් රාජ්‍ය සංස්ථාවලට සපයන ලද ණය ප්‍රමාණය 2016 වසර තුළ දී පහළ ගියේය. කෙසේ වෙතත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී, ශ්‍රීලංකන් ගුවන් සමාගම, මාර්ග සංවර්ධන අධිකාරිය, ලංකා පොහොර සමාගම, ලංකා නැව් සංස්ථාව සහ කොළඹ පොහොර සමාගම විසින් බැංකු අංශය වෙතින් ලබාගත් ණය ප්‍රමාණය ඉහළ ගියේය.

**2016 වසර තුළ දී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණය අඛණ්ඩව ඉහළ ගිය අතර, වසරේ අවසාන භාගය තුළ එම ණය වර්ධනයෙහි කිසියම් මන්දගාමී වීමක් දක්නට ලැබුණි.** 2015 වසර අවසානයේ සියයට 25.1 ක් වූ පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2016 ජූලි මාසයේ දී සියයට 28.5 ක ඉහළම වර්ධනයක් වාර්තා කරන ලද අතර, මහ බැංකුව විසින් අනුගමනය කරන ලද මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර දක්වමින්, 2016 වසර අවසානය වන විට සියයට 21.9 ක් දක්වා පහළ ගියේය. ඒ අනුව, පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණයෙහි ප්‍රසාරණය පෙර වසරේ පැවති රුපියල් බිලියන 691.4 හා සැසඳීමේ දී 2016 වසරේ දී රුපියල් බිලියන 754.9 ක් විය. රජය විසින් 2016 වසර තුළ දී රාජ්‍ය බැංකුවලින් ණය ලබාගැනීම සාපේක්ෂ වශයෙන් අඩු වීම හේතුවෙන් රාජ්‍ය බැංකු පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය

**1.11 රූප සටහන**

**වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සපයන ලද ණය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණයට අනුව, 2016 වසර තුළ දී ආර්ථිකයේ සියලු ප්‍රධාන අංශ සඳහා සපයන ලද ණය ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සේවා සහ කර්මාන්ත අංශ සඳහා සපයන ලද ණය ප්‍රමාණයෙහි වර්ධනය 2015 වසරේ දී, පිළිවෙළින්, සියයට 34.1 සහ සියයට 25.0 ක් වූ අතර 2016 වසරේ දී, පිළිවෙළින්, සියයට 35.4 ක් සහ සියයට 22.2 ක් විය. කර්මාන්ත අංශය සඳහා සපයන ලද ණය ප්‍රමාණය තුළ ඉදිකිරීම් උප අංශය සඳහා සපයන ලද ණය ප්‍රමාණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සියයට 26.9 ක සැලකිය යුතු අගයක් වාර්තා කළේය. කෘෂිකර්මාන්ත සහ ධීවර අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 2015 වසරේ දී වාර්තා වූ සියයට 7.5 ක වර්ධනය හා සැසඳීමේ දී 2016 වසරේ දී සියයට 17.0 කින් වර්ධනය විය. කෙසේ වෙතත්, පෞද්ගලික ණය සහ අත්තිකාරම් අංශය තුළ ඇතුළත් උකස් ණය අත්තිකාරම් අඛණ්ඩව පහළ ගිය අතර, කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ මිලදී ගැනීම, පෞද්ගලික සෞඛ්‍ය, අධ්‍යාපන සහ ණය කාඩ්පත් ශේෂ යන උප අංශ යටතේ ලබාදුන් ණය ප්‍රමාණය 2016 වසර තුළ දී ඉහළ ගියේය.

## මූල්‍ය අංශයේ වර්ධනයන්

**2016 වසර තුළ දී පැවති දැඩි මුදල් තත්ත්වය පිළිබිඹු කරමින් 2015 වසරට සාපේක්ෂව බැංකු අංශයේ වත්කම් මන්දගාමී ලෙස වර්ධනය වූ අතර, බැංකු අංශය විසින් අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතා මට්ටමට වඩා ඉහළින් ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාව පවත්වා ගනු ලැබීය.** ණය සහ අත්තිකාරම් ඉහළ යෑම හේතුවෙන් බැංකු අංශයේ වත්කම් පදනම සියයට 12.0 කින් වර්ධනය විය.

1

ප්‍රධාන වශයෙන්, විදේශ මුදලින් ලබාගත් ණය ගැනීම අඩුවීම හේතුවෙන් බැංකු අංශය විසින් ලබාගත් ණය සියයට 3.5 කින් අඩු වුවද, ඉහළ පොලී අනුපාතික වාතාවරණයක් යටතේ කාලීන තැන්පතු වර්ධනය වීම හේතුවෙන් 2016 වසර තුළ දී බැංකු අංශයේ තැන්පතු සියයට 16.5 කින් ඉහළ ගියේය. බැංකු අංශයෙහි ශුද්ධ පොලී ආදායමේ ඉහළ යෑම පිළිබිඹු කරමින් වත්කම් මත ප්‍රතිලාභ සහ හිමිකම් මත ප්‍රතිලාභ මගින් ගණනය කරනු ලබන බැංකු අංශයෙහි ලාභදායිත්වය 2016 වසර තුළ දී වර්ධනය විය. මේ අතර, බැංකු අංශය විසින් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා මට්ටම් අවම නියාමන අවශ්‍යතාවට වඩා ඉහළ මට්ටමක පවත්වා ගනු ලැබූ අතර, වසර තුළ දී විචක්ෂණශීලී ලෙස අවදානම් කළමනාකරණය අඛණ්ඩව සිදු කර ඇත. පසුගිය දශක දෙක තුළ දී අක්‍රීය ණය අනුපාතයේ වාර්තා කළ අවම අගය සනිටුහන් කරමින් 2016 වසරේදී වත්කම්වල ගුණාත්මකභාවය වර්ධනය වී ඇත. මේ අතර, නව බැංකු ශාඛා සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පහසුකම් ඇති කිරීම තුළින් බැංකු අංශය සිය මෙහෙයුම් කටයුතු පුළුල් කිරීමට කටයුතු කරන ලදී.

**2016 වසර තුළ දී බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම්වල වත්කම් සහ ශාඛා ජාලයෙහි වර්ධනයක් වාර්තා වූ අතර, අභියෝගාත්මක ව්‍යාපාරික පරිසරයක් මධ්‍යයේ අනෙකුත් බැංකු නොවන මූල්‍ය ආයතන මිශ්‍ර මෙහෙයුම් කාර්යසාධනයක් වර්තා කළේය.** බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් රථ වාහන සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ සිය ප්‍රධාන ව්‍යාපාර කටයුත්තෙන් ක්‍රමයෙන් බැහැර වී අනෙකුත් ණය උපකරණ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් 2016 වසරේදී සිය වත්කම් පදනම පුළුල් කරගෙන ඇත. නම්‍යශීලීභාවය හා පිරිවැය සලකා බලා සුළු පරිමාණ තැන්පතුවල සිට බැංකු ණය ලබාගැනීම කෙරෙහි මෙම අංශය ක්‍රමයෙන් යොමු වීම නිසා, දේශීය ණය මගින් මෙම වර්ධනය ප්‍රධාන වශයෙන් මූල්‍යනය කර ඇත. ව්‍යාපාර කටයුතුවල ප්‍රසාරණය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි වීමත් සමඟ මධ්‍යස්ථ ලෙස ඉහළ නැංවුණු ශුද්ධ පොලී ආදායම හේතුවෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම්වල ලාභදායිත්වය 2016 වසරේ දී ඉහළ ගියේය. අක්‍රීය ණය, ද්‍රවශීලතාව සහ ප්‍රාග්ධනය යහපත් මට්ටමක පැවතීම තුළින් පිළිබිඹු කෙරෙන පරිදි, එම අංශයේ අවදානම් සමස්තයක් වශයෙන් මනාව කළමනාකරණය කළ හැකි මට්ටමක පැවතුණි. මේ අතර, රාජ්‍ය සුරැකුම්පත් සඳහා වූ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සමස්ත ආයෝජන කළඹ මෙන්ම, සමස්ත වත්කම් ප්‍රමාණය ද පහළ ගියේය. කෙසේ වුවද, ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සමස්ත ප්‍රාග්ධනය සහ ලාභදායිත්වය වර්ධනය විය. 2016 වසරේ දී ඒකක භාර අංශයෙහි සමස්ත වත්කම් මෙන්ම, නිකුත් කළ ඒකක භාර සංඛ්‍යාවේ පහළ යෑමක් වාර්තා විය. ඒකක භාර විසින් රජයේ සුරැකුම්පත්වල සිදු කළ ආයෝජන සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, කොටස් වෙළඳපොළ ආයෝජන සුළු වශයෙන් පහළ ගියේය. මේ අතර, 2016 වසරේ දී රක්ෂණ අංශයේ සමස්ත වත්කම් ප්‍රමාණය ඉහළ ගිය අතර, දිගුකාලීන රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ යන ව්‍යාපාර අංශ දෙකම මේ සඳහා දායක විය. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ඉහළ වර්ධනය හේතුවෙන් රක්ෂණ අංශයේ සමස්ත ලාභ ඉපැයීම 2016 වසරේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2016 වසරේ පැවති ඉහළ වෙළඳපොළ පොලී අනුපාතික මධ්‍යයේ වුවද ආයෝජන ආදායම ඉහළ යෑම සහ දළ ලියාපදිංචි වාරික ආදායම මේ සඳහා හේතු විය. 2016 වසරේ විශ්‍රාමික අරමුදල් අංශයේ සමස්ත වත්කම්වල සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කළ අතර, මෙම වර්ධනය ආයෝජන මගින් ඉපැයූ ආදායම ඉහළ යෑම සහ සාමාජික ශුද්ධ දායක මුදල් (දායක මුදල් ලැබීම්වලින් ප්‍රතිලාභ ගෙවීම අඩු කළ පසු) ලැබීම්වල ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය.

**මූල්‍ය අංශයෙහි ශක්තිමත්භාවය සහ සුරක්ෂිතභාවය වර්ධනය කිරීම මගින් මහජනයාගේ විශ්වසනීයභාවය වැඩිදියුණු කිරීමේ අදහස පෙරදැරිව ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළු නියාමන ආයතන විසින් මූල්‍ය ආයතන සඳහා වන අධීක්ෂණ හා නියාමන රාමුව ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් ආරම්භ කරන ලදී.** බාසල් III සම්මුතිය යටතේ මහ බැංකුව විසින් 2017 ජූලි මස සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රලාභී බැංකු සඳහා වන ප්‍රාග්ධන අවශ්‍යතාව ඉහළ නංවන ලදී. නියාමන ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව සහ අවදානම් කළමනාකරණය පිළිබඳ මූලික තොරතුරු ප්‍රකාශිත මූල්‍ය ප්‍රකාශ මගින් අනාවරණය කරන ලෙසත්, මුදල් පැවැරීම්වලදී අයකරනු ලබන ගාස්තු පිළිබඳ වැඩි අනාවරණයක් ලබාදෙන ලෙසත්, සියලු බලපත්‍රලාභී බැංකුවලට නියම කරන ලදී. එසේම, සයිබර් ආරක්ෂණය සම්බන්ධව මතුවන්නා වූ අවදානම් සඳහා පිළියම් යෙදීමේ අරමුණින් සයිබර් ආරක්ෂණ සිද්ධි පිළිබඳ වාර්තා මහ බැංකුවට සපයන ලෙස සියලු බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදී. එමෙන්ම, විනිවිදභාවය සහ මිල අනාවරණය ඉහළ නැංවීම මගින් බැංකු අංශය තුළ රාජ්‍ය සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළඳපොළ ප්‍රවර්ධනයට ක්‍රියාමාර්ග ගනු ලැබීය. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් පිළිබඳ සැලකීමේ දී, මූල්‍ය පද්ධති ස්ථායීතාවය පවත්වා ගැනීමේ අරමුණින් මූල්‍යමය වශයෙන් දුර්වල තත්ත්වයේ පසුවන මූල්‍ය ආයතන යළි නඟාසිටුවීම සඳහා නියාමන ක්‍රියාමාර්ග ගන්නා අතරම දේශීය මෙන්ම විදේශීය සම්මතයන් සහ ක්‍රියාපටිපාටිවලට අනුකූලව විචක්ෂණශීලී ක්‍රියාමාර්ග ගැනීම මහ බැංකුව විසින් අඛණ්ඩව සිදුකරන ලදී. මේ අතර, නියාමනය

නොකරන ලද ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ රාජ්‍ය නොවන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය සහ අධීක්ෂණය අරමුණු කරගෙන අලුතින් නීතිගත කරන ලද 2016 අංක 6 දරන ක්ෂුද්‍ර මූල්‍ය පනතෙහි විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සඳහා නියාමන රාමුවක් 2016 වසරේ දී හඳුන්වා දෙන ලදී. රක්ෂණ ව්‍යාපාරයේ වෘත්තීය මට්ටම සහ කීර්තිනාමය ප්‍රවර්ධනය කරන අතරම, රක්ෂණ ඔප්පු හිමියන්ගේ ප්‍රතිලාභ සුරැකීම සඳහා 2016 වසරේ දී ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නියාමන ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. විශේෂයෙන්ම, අයිතිය හෝ පාලනය වෙනස්වීම් පිළිබඳ සියලු රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කරුවන් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලිඛිත අනුමැතිය ලබාගත යුතු බවට නියම කෙරුණු අතර, රක්ෂණ ඔප්පු හිමියන්ට රක්ෂණ ඔප්පුවෙහි නියමයන් සහ කොන්දේසි පරීක්ෂා කිරීමට දින 21 ක සලකා බැලීමේ කාලයක්/පිරික්සුමට කාලයක් ලබාදෙන ලෙස සියලුම දිගුකාලීන රක්ෂණ සමාගම් වෙත නියම කරන ලදී.

## 1.3 ගෝලීය ආර්ථික පරිසරය සහ ඉදිරි දැක්ම

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශිත ලෝක ආර්ථික ඉදිරි දැක්ම (World Economic Outlook)[1] අනුව, නැඟී එන වෙළඳපොළ හා සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථික ක්‍රියාකාරකම් අඛණ්ඩව දුර්වල මට්ටමක පැවතීම මධ්‍යයෙහි දියුණු රටවල ආර්ථික වර්ධන වේගය අපේක්ෂිත මට්ටමටත් වඩා ඉහළ වර්ධනයක් අත්කර ගැනීමත් සමඟ, 2016 වසරේ දෙවන භාගයේ දී ගෝලීය ආර්ථික වර්ධන ප්‍රවණතාව ඉහළ ගියේය.** බොහෝ දියුණු රටවල් සිය ආර්ථිකයන් තුළ ඉල්ලුම ඉහළ නැංවීම සඳහා අඛණ්ඩ උත්සාහයන් දරන අතරතුර, ගෝලීය මූල්‍ය වෙළඳපොළවල පැවති අසීරුතා හේතුවෙන් ඇති වූ බලපෑම මධ්‍යයේ වුවද, නැඟී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් තුළ ගෙවුම් තුලන තත්ත්ව, රාජ්‍ය මූල්‍ය තත්ත්ව සහ ආයෝජන ක්‍රියාකාරකම් යන සාධක මත පදනම්ව විවිධ ආර්ථික වර්ධන හා විනිමය අනුපාතික ප්‍රවණතා පිළිබිඹු කළේය. ඛනිජ තෙල් නිෂ්පාදනය කරන ප්‍රධාන රටවල් විසින් සිය නිෂ්පාදනය සීමා කිරීම සඳහා එළඹි ගිවිසුම හේතුවෙන් වසර තුළදී ඛනිජ තෙල් මිල ගණන් ක්‍රමයෙන් ඉහළ ගියේය. කෙසේ වුවද, මෙම මිල ගණන් යටතේ, විශේෂයෙන් එක්සත් ජනපදය වැනි රටවල් දැඩි සැපයුම් ප්‍රතිචාර දැක්වීම හරහා වෙළඳපොළට මැදිහත් වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, ඒ හේතුවෙන් ඛනිජ තෙල් බැරලයක මිල එ.ජ. ඩොලර් 60 ඉක්මවා නොයනු ඇති බව පොදු පිළිගැනීම වේ. ප්‍රධාන වශයෙන්ම, වසරේ අවසාන භාගය තුළදී, ආහාර සහ මූල ලෝහ ඇතුළු බොහෝ භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑමේ උපනතියක් පෙන්නුම් කළේය. ගෝලීය ආර්ථිකයෙහි අඛණ්ඩව පැවති අවිනිශ්චිතතා මෙන්ම ජාත්‍යන්තර දේශපාලනයෙහි පැවති කැළඹිලි සහගත බව හේතුවෙන් ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ මෙන්ම පෞද්ගලික ආයෝජකයන්ගේ ආර්ථික තීරණ මත බලපෑම් එල්ල විය.

**විශේෂයෙන්ම, 2016 වසරේ පළමු භාගයේ පැවති මන්දගාමී ආර්ථික වර්ධනය සහ අඩු උද්ධමන තත්ත්වය හේතුවෙන් වසරේ වැඩි කාලයක් පුරා ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට දියුණු ආර්ථික සහිත රටවලට සිදු විය.** කෙසේ වුවත්, එක්සත් ජනපද ආර්ථිකය අඛණ්ඩව වර්ධනයවීම හා රැකියා උත්පාදන අවස්ථාවන් පුළුල් වීම පිළිබඳ සලකුණු සමඟ එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් 2015 දෙසැම්බර් මාසයේ දී පළමු වරට පොලී අනුපාතික වෙනස් කිරීමෙන් අනතුරුව, 2016 දෙසැම්බර් මාසයේ දී සහ 2017 මාර්තු මාසයේ දී ඉලක්කගත ෆෙඩරල් අරමුදල් අනුපාතිකය (Federal Funds Target Rate) ඉහළ නංවන ලදී. එක්සත් රාජධානිය යුරෝපා සංගමයෙන් ඉවත්වීම (Brexit) සඳහා පවත්වන ලද ජනමත විචාරණය ද මූල්‍ය වෙළඳපොළ තුළ සහ ගෝලීය ආර්ථික අපේක්ෂා කෙරෙහි අවිනිශ්චිතතා ඇති කිරීමට හේතු විය. වසරේ දෙවන භාගයේ දී ඛනිජ තෙල් මිල ගණන් ඉහළ මට්ටමක ස්ථාවර වීමත් සමඟ, රුසියාව ඇතුළු ඛනිජ තෙල් නිෂ්පාදනය කරනු ලබන රටවල ආර්ථිකයන්හි කිසියම් වර්ධනයක් පිළිබිඹු විය. චීනය විසින් ආයෝජන මත වූ රැඳියාව අඩු කරමින් සහ දේශීය ඉල්ලුම ඉහළ නැංවීම තුළින් වර්ධනය යළි තුලනය කිරීම සඳහා ප්‍රතිපත්ති සානුබල භාවිතා කිරීම හේතුවෙන් ඛනිජ තෙල් සහ මූල ලෝහ වැනි ප්‍රධාන භාණ්ඩ සඳහා, චීනය ප්‍රධාන ගැනුම්කරුවකු ලෙස ක්‍රියාකරනු ලබන ජාත්‍යන්තර භාණ්ඩ වෙළඳපොළ තුළ අවිනිශ්චිතතා ඇති විය. මෙම වර්ධනයන් සහ අපේක්ෂා හේතුවෙන් ගෝලීය පොලී අනුපාතික ඉහළ යෑම මෙම කාලපරිච්ඡේදය තුළ දී නැඟී එන වෙළඳපොළ ආර්ථික වෙතින් ආයෝජන ඉවත ඇදී යෑමට හේතු විය. වසර තුළදී අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල් වර්ගවලට සාපේක්ෂව එ.ජ. ඩොලරය අතිප්‍රමාණය විය. ඛනිජ තෙල් නිෂ්පාදකයන් ඇතුළු භාණ්ඩ අපනයනය කරනු ලබන රටවල ව්‍යවහාර මුදල් අතිප්‍රමාණය වූ අතර, ස්ටර්ලින් පවුම, යුරෝ සහ ජපන් යෙන් යන මුදල් ඒකක මෙම කාලය තුළ අවප්‍රමාණය විය.

1 World Economic Outlook - April 2017 and World Economic Outlook Update - January 2017

**1.4 සංඛ්‍යා සටහන**

**ගෝලීය ආර්ථික ප්‍රවණතා සහ ඉදිරි දැක්ම (අ)**

| ශීර්ෂය | 2015 | 2016 | 2017 පුරෝකථන | 2018 පුරෝකථන |
|---|---|---|---|---|
| **ලෝක නිෂ්පාදිතය** | **3.4** | **3.1** | **3.5** | **3.6** |
| සංවර්ධිත ආර්ථික | 2.1 | 1.7 | 2.0 | 2.0 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 2.6 | 1.6 | 2.3 | 2.5 |
| යුරෝ කලාපය | 2.0 | 1.7 | 1.7 | 1.6 |
| එක්සත් රාජධානිය | 2.2 | 1.8 | 2.0 | 1.5 |
| ජපානය | 1.2 | 1.0 | 1.2 | 0.6 |
| නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථික | 4.2 | 4.1 | 4.5 | 4.8 |
| නැගී එන සහ සංවර්ධනය වන ආසියාව | 6.7 | 6.4 | 6.4 | 6.4 |
| චීනය | 6.9 | 6.7 | 6.6 | 6.2 |
| ඉන්දියාව | 7.9 | 6.8 | 7.2 | 7.7 |
| **ලෝක වෙළඳ පරිමාව (භාණ්ඩ හා සේවා)** | **2.7** | **2.2** | **3.8** | **3.9** |
| **මිල හැසිරීම** | | | | |
| පාරිභෝගික මිල | | | | |
| සංවර්ධිත ආර්ථික | 0.3 | 0.8 | 2.0 | 1.9 |
| නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථික | 4.7 | 4.4 | 4.7 | 4.4 |
| වෙළඳ භාණ්ඩ මිල (එ.ජ.ඩොලර්) | | | | |
| ඉන්ධන | -47.2 | -15.7 | 28.9 | -0.3 |
| ඉන්ධන නොවන | -17.4 | -1.9 | 8.5 | -1.3 |
| **එ.ජ.ඩොලර් තැන්පතු මත සය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ පොලී අනුපාතිකය (සියයට)** | **0.5** | **1.1** | **1.7** | **2.8** |

(අ) වෙනත් සඳහනක් නොමැති විට වාර්ෂික ප්‍රතිශත වෙනස

මූලය: World Economic Outlook (2017 අප්‍රේල්), ජා.මූ.අරමුදල

**ආයෝජන, නිෂ්පාදන සහ වෙළඳාම යන අංශ යථා තත්ත්වයට පත් වීම හමුවේ ගෝලීය ආර්ථිකයෙහි වර්ධන ප්‍රවණතාව 2017 සහ 2018 වසර තුළ දී තවදුරටත් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ආර්ථික අර්බුදයෙන් පසු පළමු වතාවට, 2017 පළමු කාර්තුව තුළ දී ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපය, ජපානය හා ප්‍රධාන නැගී එන වෙළඳපොළ ආර්ථික ගණනාවක ආර්ථික වර්ධන ප්‍රවණතා ඉහළ යෑමක් දැකිය හැකිය. දියුණු රටවල පවතින ලිහිල් මුදල් ප්‍රතිපත්ති සහ ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ එමගින් නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල් මත ඇති වන බලපෑම මෙම ආර්ථික වර්ධනයට හේතු වනු ඇත. 2017 වසරේ දී ඇමෙරිකා එක්සත් ජනපදයෙහි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය බොහෝදුරට ප්‍රසාරණාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එක්සත් රාජධානිය, යුරෝපා සංගමය සහ ජපානය වැනි අනෙකුත් දියුණු ආර්ථිකයන්හි ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති ඉදිරි වසරක හෝ දෙකක කාලය තුළ වර්ධනය සඳහා සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, ඉහළ යමින් පවතින භාණ්ඩ මිල ගණන් හේතුවෙන් ගෝලීය උද්ධමනය ඉහළ යෑමටත්, එමගින් ඇතැම් ආර්ථිකයන් මුහුණ දෙන අවධමනාත්මක පීඩන අඩු වීමට ඉඩ ඇත. කෙසේ වුවද, වෙළඳාම සම්බන්ධයෙන් එක්සත් ජනපදය විසින් හඳුන්වා දීමට පොරොන්දු වී ඇති ආරක්ෂණවාදී ප්‍රතිපත්ති මත වර්තමාන ගෝලීය වර්ධන පුරෝකථන රඳා පවතී. ඒ අනුව, ඇමෙරිකා එක්සත් ජනපදයේ වෙළඳ හවුල්කරුවන් විසින් නව දේශීය සහ ජාත්‍යන්තර වෙළඳපොළ මෙන්ම නව වර්ධන සාධක කෙරෙහි යොමු වීමත් සමඟ ඉදිරි දෙවසරක කාලය තුළ ගෝලීය වර්ධනය මෙම වෙළඳ හවුල්කරුවන්ගේ ප්‍රතිචාර මත රඳා පවතිනු ඇත. ශාන්තිකර කලාපීය රටවල් අතර වූ වෙළඳ ගිවිසුමෙන් (Trans-Pacific Partnership Agreement) ඇමෙරිකා එක්සත් ජනපදය ඉවත්වීම හේතුවෙන් අහිමි වූ වෙළඳපොළ සඳහා යළි ප්‍රවේශ වීමට ජපානය විසින් අවස්ථා සොයන අතරතුර, යුරෝපා සංගමයෙන් ඉවත්වීම හේතුවෙන් ඇති විය හැකි බලපෑම තුළින් එක්සත් රාජධානියෙහි ආර්ථික අපේක්ෂාවල ව්‍යාකූල තත්ත්වයක් ඇති වී ඇත. චීනයෙහි ඉහළ ආර්ථික වර්ධනය ප්‍රතිපත්ති සානුබල තුළින් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබුව ද, එමගින් ණය ප්‍රසාරණය සහ අයවැය සීමා මත ඇති කළ හැකි බලපෑම හේතුවෙන් ඉදිරි කාලයේ දී අනපේක්ෂිත ප්‍රතිපත්ති වෙනස් කිරීම් අවශ්‍ය වනු ඇත. ඉහළ වටිනාකමකින් යුත් මුදල් නෝට්ටු භාවිතයෙන් ඉවත් කිරීම හේතුවෙන්, ප්‍රධානතම විශාල ආර්ථිකයක් සහිත ඉන්දියාවේ වර්ධනය, 2017 වසරේ දී අපේක්ෂිත මට්ටමට වඩා අඩු වනු ඇතැයි පුරෝකථනය කර ඇත. ඛනිජ තෙල් මිල ගණන් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කළ ද, ඛනිජ තෙල් නිෂ්පාදනය අඩු මට්ටමක පැවතීම හේතුවෙන් විශේෂයෙන්ම, මැදපෙරදිග ඇතුළු ඛනිජ තෙල් ආදායම මත ආර්ථික කටයුතු රඳා පවත්නා රටවල ආර්ථික වර්ධන වේගය අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ගෝලීය ආර්ථික වර්ධනය ඉහළ යෑම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර පොලී අනුපාතික ඉහළ යෑම ශ්‍රී ලංකා ආර්ථිකය මත විවිධ වූ බලපෑම් ඇති කළ හැකිය.** ඛනිජ තෙල් මිල සහ අනෙකුත් ජාත්‍යන්තර භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම, සමස්තයක් වශයෙන් ගෙවුම් තුලනය සහ දේශීය මිල දර්ශක මත අහිතකර බලපෑමක් ඇති කළ හැකි අතර, මැදපෙරදිග කලාපයේ ආර්ථික වර්ධනය මන්දගාමී වීම තේ අපනයන ඉපැයුම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඩුවීම සඳහා හේතු විය හැකිය. ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සංචාරක ප්‍රභවයන් වන යුරෝපය, චීනය, ඉන්දියාව සහ රුසියාව යන රටවල ඉහළ ආර්ථික වර්ධනය සමඟ සංචාරක පැමිණීම් ඉහළ යෑමට ඉඩ ඇත. නැගී එන රටවල් අතර සිදුවන, එනම් දකුණු-දකුණු විදේශීය සෘජු ආයෝජන (South-South FDIs) ඉහළ යෑම හේතුවෙන් ශ්‍රී ලංකාව සහ අනෙකුත් කුඩා ආර්ථික සඳහා ලැබෙන විදේශීය සෘජු

ආයෝජන ඉහළ යා හැකිය. කලාපය තුළ හඳුන්වා දීමට යෝජිත වෙළඳ සහ ආර්ථික හවුල්කාරිත්ව ගිවිසුම් තුළින් ඉහළ ආදායම් සහිත වඩා විශාල කලාපීය වෙළඳපොළ තුළට ප්‍රවේශ වීමට ශ්‍රී ලංකාවට අවස්ථාව සැලසෙනු ඇත. මූල්‍ය වෙළඳපොළ තත්ත්ව දැඩිවීමත් සමඟ පෙර වසරවල දී ලබා ගත් ණය ආපසු පියවීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළ තුළින් ණය ලබාගැනීමේදී සහ අයවැය හිඟය පියවීම සඳහා යොදා ගන්නා විචල්‍ය පොලී අනුපාතික මත පදනම් වූ එ.ජ. ඩොලර්වලින් පවතින ණය උපකරණ මත පොලී ගෙවීමේ දී ශ්‍රී ලංකාවට විවිධ අභියෝගවලට මුහුණ දීමට සිදුවනු ඇත.

## 1.4. මධ්‍යකාලීන සාර්ව ආර්ථික දැක්ම

**අයහපත් කාලගුණික තත්ත්වයන්ගේ අහිතකර බලපෑම් මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකා ආර්ථිකය 2017 වසරේ දී සියයට 5.0 ක පමණ මධ්‍යස්ථ අනුපාතිකයකින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, ඉන්පසුව ආර්ථික වර්ධන වේගය ක්‍රමයෙන් ඉහළ යනු ඇතැයි ද 2020 වසර වන විට සියයට 7.0 ක වාර්ෂික වර්ධන වේගයක් වාර්තා කරනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.** ආර්ථිකයෙහි සහ විදේශ වෙළඳපොළවල පවතින වර්ධන අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් ආර්ථිකයෙහි අපේක්ෂිත ඉහළ වර්ධන මට්ටම ළඟාකර ගැනීම සඳහා පෞද්ගලික අංශය විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, පෞද්ගලික අංශයේ ආයෝජන ඉහළ යෑම ආර්ථික වර්ධනයට දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ අපනයන මූලික කරගත් කර්මාන්ත කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් විදේශීය ආයෝජකයන් ඉහළ ආයෝජන මට්ටමක් අත්කර ගැනීම සඳහා දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ස්ථාපනය කිරීම සඳහා සැලසුම් කර ඇති කොළඹ මූල්‍ය නගරය, බස්නාහිර කලාපීය මහා නගර ව්‍යාපෘතිය යටතේ ඇතිවන නව ඉඩ ප්‍රස්ථා හා දිවයිනේ ඊසානදිග හා නිරිතදිග කලාපවල පිහිටුවීමට යෝජිත ආර්ථික කොරිඩෝ (Economic Corridors) සහ හම්බන්තොට හා ත්‍රිකුණාමල වරාය අවට ප්‍රදේශය, පෞද්ගලික අංශයේ ආයෝජන අවස්ථා සඳහා ඉඩ ප්‍රස්ථා සලසා දෙනු ඇත. මෙම ආයෝජන අවස්ථාවන්ට අමතරව, කෘෂිකාර්මික සහ කාර්මික අංශයෙහි යාන්ත්‍රිකරණය ඇතුළු නව තාක්ෂණය මෙන්ම තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සංවර්ධනයන් ආදිය මගින් ඵලදායීතාව ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු කරමින් දේශීය ආයෝජන අඛණ්ඩව සිදු කෙරෙනු ඇතැයි අපේක්ෂිතය. මෙම ආර්ථික වර්ධන ප්‍රවණතා ඉදිරියට පවත්වා ගෙන යෑම සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට රජය විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග රුකුලක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට රාජ්‍ය මූල්‍ය සහ විදේශීය යන අංශ දෙකෙහිම ව්‍යුහාත්මක ගැලපුම් මෙන්ම විචක්ෂණශීලී සාර්ව ආර්ථික කළමනාකරණ ප්‍රතිපත්ති මගින් ද අවශ්‍ය සහාය ලැබෙනු ඇතැයි අපේක්ෂිතය. තවද, යෝග්‍ය මුදල් ප්‍රතිපත්ති පියවර තුළින් උද්ධමනය සියයට 5.0 ක පමණ සාමාන්‍ය මට්ටමක පවත්වා ගැනීමට ද අපේක්ෂිතය. ආර්ථිකයේ තරඟකාරිත්වය පවත්වා ගැනීම සඳහා මූර්ත සඵල විනිමය අනුපාතිකය දර්ශකාංක 100 දක්වා වන තෙක් නාමික විනිමය අනුපාතිකය වෙනස් වීමට ඉඩ හැරීමටත්, ඉන් පසු දර්ශකාංක 100 ට ආසන්න මට්ටමේ පවත්වා ගැනීමටත් අපේක්ෂිතය. මෙම ප්‍රතිපත්තීන් තුළින් ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාව ඉහළ යෑම මගින් දේශීය නිෂ්පාදනය ඉහළ යනු ඇතැයි අපේක්ෂිත අතර, හිතකර විදේශ වෙළඳ ප්‍රතිපත්ති නිසා වෙළඳපොළ ප්‍රවේශය පුළුල් වීම හේතුවෙන් අපනයන සිදු කිරීමට පහසු වනු ඇත. ඒ අනුව, මැදිකාලයේ දී දේශීය හා විදේශීය යන දෙඅංශයෙහිම ඉල්ලුම ඉහළ යෑම මධ්‍යයෙහි ආර්ථිකයෙහි සිදු වන වර්ධනය සඳහා සියලුම අංශවල දායකත්වය ලැබෙනු ඇතැයි ද එමගින්, ශ්‍රී ලංකාවට ඉහළ මැදි ආදායම් ආර්ථිකයක් සහිත රටක් බවට පත්වීමට ඉඩ ප්‍රස්ථා සැලසෙනු ඇතැයි ද අපේක්ෂිතය.

**විදේශීය අංශයේ ස්ථායීතාව ඇති කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන යෝග්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් විදේශීය අංශයේ ඉදිරි දැක්ම මැදිකාලයේ දී ක්‍රමයෙන් වැඩිදියුණු වනු ඇතැයි පුරෝකථනය කෙරේ.** විදේශීය අංශයේ පුරෝකථනය කරන ලද වර්ධනයන් සමඟ ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ හිඟය ක්‍රමයෙන් අඩු වෙතැයි අපේක්ෂා කෙරේ. ආනයනවලට වඩා වැඩි වේගයකින් අපනයන වැඩි වෙතැයි පුරෝකථනය කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මැදිකාලයේ දී වෙළඳ හිඟය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වරණීය වෙළඳ ගිවිසුම් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) යටතේවන සහන නැවත ලබාගැනීම ඇතුළු වෙළඳ සම්බන්ධතා වර්ධනය කර ගැනීම සහ යෝජිත ආර්ථික සහයෝගීතා ගිවිසුම් හේතුවෙන් අපනයනාභිමුඛ දේශීය නිෂ්පාදන වර්ධනය කරගැනීම තුළින් අපනයන වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කෙරේ. ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර ඛනිජ තෙල් මිල ගණන්වල අපේක්ෂිත ඉහළ යෑමත් සමඟ අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම සහ පුරෝකථනය කළ ආයෝජන වියදම් ඉහළ යෑම හේතුවෙන් ආයෝජන භාණ්ඩ සඳහා වන ඉල්ලුම වැඩිවීම හේතුවෙන් ආනයන වියදම ද අඛණ්ඩව ඉහළ යනු ඇත. මේ අතර, විශේෂයෙන්ම සංචාරක ඉපැයීම්, ප්‍රවාහන සේවා සහ විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවා යටතේ වන ලැබීම් ඉහළ යෑමත් සමඟ මැදිකාලයේ දී සේවා ගිණුමේ අතිරික්තයක් වාර්තා

කරනු ඇතැයි පුරෝකථනය කොට ඇත. වෙළඳපොළ ප්‍රවේශය ඉහළ නැංවීම සහ සේවා අපනයන විවිධාංගීකරණය අරමුණු කරගත් ක්‍රියාමාර්ග මත ලෝකයේ අනෙකුත් රටවලින් උපයාගත යුතු අපනයන ආදායම් රඳා පවතිනු ඇත. ජංගම ගිණුමේ හිඟය අඩු කිරීම සඳහා විශාල වශයෙන් දායක වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඩු වේගයකින් වුවද තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පුරෝකථනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මන්දගාමී වීම කෙරෙහි දේශීය රැකියා අවස්ථා වර්ධනය වීම හේතුවෙන් ශ්‍රම සංක්‍රමණ අඩු වීම, අර්ධ පුහුණු සහ නුපුහුණු ශ්‍රම සංක්‍රමණය අධෛර්යවත් කිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ග සහ සාම්ප්‍රදායික ලෙස විදේශ ශ්‍රමිකයන් සංක්‍රමණය වන රටවල පවතින අහිතකර ආර්ථික තත්ත්වය හේතු වී ඇත. මේ අතර, විදේශීය සෘජු ආයෝජන වැනි ණය නොවන මූලාශ්‍රවලින් වන ලැබීම් මෙන්ම, සංවර්ධන ව්‍යාපෘති සඳහා වන අඛණ්ඩ විදේශ මූල්‍යනය සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම වැනි ණය සුරැකුම්පත් සඳහා වන ලැබීම් ඉහළ යෑම හේතුවෙන් ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම වර්ධනය වේ යැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ණය මූලාශ්‍ර පදනම් කරගත් විදේශ විනිමය ලැබීම් මත වැඩි වශයෙන් රඳා පැවතීම මැදි කාලයේ දී අඩු වෙතැයි අපේක්ෂා කෙරෙන අතර, අපනයන ඉපැයුම් ඉහළ නැංවීම සහ විදේශීය සෘජු ආයෝජන ලැබීම් වැනි වඩා තිරසාර විදේශ මූල්‍ය ප්‍රවාහවල දායකත්වය මත විදේශ සංචිත ක්‍රමානුකූලව ශක්තිමත් වීම තුළින් විදේශීය අංශයෙහි ස්ථායීතාව මැදි කාලයේ දී වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**මැදිකාලීනව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ (Flexible Inflation Targeting) රාමුවකට අනුගත වීම තුළින් සිය මුදල් ප්‍රතිපත්තිය ශක්තිමත් කරනු ලබන බව ශ්‍රී ලංකා මහ බැංකුව "2017 වසර හා ඉන් ඉදිරිය සඳහා වූ මුදල් සහ මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙරදැක්ම" මගින් නිල වශයෙන් නිවේදනය කළේය.** වර්තමානය වන විට මහ බැංකුව, මුදල් ඉලක්කකරණය සහ උද්ධමන ඉලක්කකරණය යන ප්‍රවේශ දෙකෙහිම ලක්ෂණ සහිත වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුවක් යටතේ මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් සිදුකරයි. ඉදිරියේ දී මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය, මිල ස්ථායීතාව අරමුණු කරගත් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණයක් මත පදනම් වන අතර, එහිදී නම්‍යශීලී විනිමය අනුපාතික පරිසරයක් යටතේ මූර්ත අංශයෙහි ස්ථායීතාව පිළිබඳ අවධානය යොමු කෙරෙනු ඇත. පැවති අඩු උද්ධමන තත්ත්වය මෙන්ම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සඳහා ගන්නා ලද අඛණ්ඩ උත්සාහයත්, මැදිකාලීනව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණයක් වෙත යොමුවීම සඳහා උචිත පරිසරයක් නිර්මාණය කර ඇත. එසේම, මහ බැංකුව වර්තමානය වන විට ජාත්‍යන්තර ආයතන සමඟ එක්ව මෙම ක්‍රියාවලිය පහසු කරලීම සඳහා අවශ්‍ය නීතිමය සහ මෙහෙයුම් වෙනස්කම් සඳහා කටයුතු කරමින් සිටී. මෙම නෛතික වෙනස්කම් තුළින් උද්ධමන ඉලක්කකරණ රාමුවේ වගවීම සහ විශ්වසනීයත්වය තහවුරු කිරීම අපේක්ෂා කරනු ලැබේ. තවද, මේ වන විට මහ බැංකුව සිය තාක්ෂණික ශක්‍යතා වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියක ද නිරතව සිටී. ඒ අනුව, මහ බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඒකාබද්ධව ව්‍යුහාත්මක ආකෘති මත පදනම් වූ පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතියක් (Forecasting and Policy Analysis System) නිර්මාණය කිරීම සඳහා කටයුතු ආරම්භ කළ අතර, එමගින් මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම මෙන්ම, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණයක් වෙත යොමු වීම සඳහා අවශ්‍ය සහාය ද සපයනු ඇත. (විශේෂ සටහන 1: '*ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහා ආකෘති මත පදනම් වූ ප්‍රවේශයක්*' බලන්න) මෙම ආකෘති තුළින් ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමටත් එමගින් ඵලදායී ප්‍රතිපත්ති සම්පාදනයටත් ඉඩ ලැබෙනු ඇතැයි අපේක්ෂා කරන අතර, ඇති විය හැකි අවදානම් සහ එම අවදානම් මගින් ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යවල අනාගත ගමන්මගට ඇති කෙරෙන අවදානම කල් ඇතිව හඳුනා ගැනීමට ද උපකාරී වනු ඇත. තවද, රජය මගින් මේ වන විට සිදුකර ගෙන යනු ලබන රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව තුළින් විශේෂයෙන්ම, අයවැය හිඟය මූල්‍යනය සඳහා මහ බැංකුව මත රඳා පැවැතීම අවම වීම, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට පිටුබලයක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙමගින් පොලී අනුපාතිකවල අනිසි උච්චාවචන වළක්වන අතර, අපේක්ෂිත ආර්ථික වර්ධනය සහ මැදි තනි අගයක උද්ධමන මට්ටමක් පවත්වා ගැනීම සඳහා සහාය වනු ඇත. මුදල් ප්‍රතිපත්ති රාමුවක සාර්ථකත්වය, දියුණු මූල්‍ය වෙළඳපොළ හරහා මුදල් ප්‍රතිපත්තිය කාර්යක්ෂම ලෙස සම්ප්‍රේෂණය වීම මත තීරණය වන බැවින්, මැදි කාලීනව දියුණු මූල්‍ය වෙළඳපොළක් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කරන ප්‍රතිපත්ති හඳුන්වා දීම සඳහා ඉදිරියේ දී අනෙකුත් නියාමන ආයතන සහ අධිකාරීන් සමඟින් සහයෝගයෙන් කටයුතු කිරීමට මහ බැංකුව අපේක්ෂා කරයි.

**අයවැය හිඟය පියවීම සහ රාජ්‍ය ණය තිරසාර මට්ටමක පවත්වාගෙන යෑම තුළින් රාජ්‍ය මූල්‍ය අංශයෙහි ස්ථායී බව පවත්වාගෙන යෑමට සහ එමගින් ආදායම් පාදක කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය ශක්තිමත් කිරීම කෙරෙහි රජයේ මැදිකාලීන රාජ්‍ය මූල්‍ය උපායමාර්ගය යොමු වී ඇත.** මෙම ප්‍රයත්නයේ දී ආදායම් ඉහළ නැංවීමට සහ වියදම් තාර්කීකරණය කිරීම සඳහා රජය විසින් ප්‍රතිපත්තිමය

1

### 1.5 සංඛ්‍යා සටහන
### මැදිකාලීන සාර්ව ආර්ථික රාමුව (අ)

| දර්ශකය | ඒකකය | 2015 (ආ) | 2016 (ඇ) | පුරෝකථන 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|---|
| **මූර්ත අංශය (ඈ)** | | | | | | | |
| මූර්ත ද.දේ.නි. වර්ධනය | සියයට | 4.8(ඇ) | 4.4 | 5.0 | 6.0 | 6.5 | 7.0 |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. | රුපියල් බිලියන | 10,952(ඇ) | 11,839 | 12,927 | 14,260 | 15,801 | 17,583 |
| ඒක පුද්ගල ද.දේ.නි. | එ.ජ. ඩොලර් | 3,843(ඇ)(ඉ) | 3,835 | 3,938 | 4,157 | 4,485 | 4,902 |
| මුළු ආයෝජන | ද.දේ.නි.යේ % වශයෙන් | 28.4(ඇ) | 31.5 | 32.0 | 32.5 | 33.0 | 33.5 |
| දේශීය ඉතිරිකිරීම් | ද.දේ.නි.යේ % වශයෙන් | 20.9(ඇ) | 23.8 | 24.8 | 26.0 | 27.4 | 28.8 |
| ජාතික ඉතිරිකිරීම් | ද.දේ.නි.යේ % වශයෙන් | 26.0(ඇ) | 28.9 | 29.9 | 30.6 | 31.3 | 32.2 |
| **විදේශීය අංශය** | | | | | | | |
| වෙළඳ පරතරය (ඇ) | ද.දේ.නි.යේ % වශයෙන් | -10.4 | -11.2 | -11.0 | -10.6 | -10.0 | -9.3 |
| අපනයන | එ.ජ. ඩොලර් මිලියන | 10,546 | 10,310 | 11,425 | 12,796 | 14,465 | 16,414 |
| ආනයන | එ.ජ. ඩොලර් මිලියන | 18,935 | 19,400 | 20,699 | 22,354 | 24,233 | 26,415 |
| ජංගම ගිණුමේ ශේෂය (ඇ) | ද.දේ.නි.යේ % වශයෙන් | -2.3 | -2.4 | -2.1 | -1.9 | -1.7 | -1.3 |
| විදේශීය නිල සංචිත | ආනයනික මාස වශයෙන් | 4.6 | 3.7 | 4.3 | 4.5 | 4.7 | 5.3 |
| **රාජ්‍ය මූල්‍ය අංශය (ඊ)** | | | | | | | |
| සමස්ත ආදායම් සහ ප්‍රදාන | ද.දේ.නි.යේ % වශයෙන් | 13.3 | 14.3 | 15.0 | 15.5 | 16.0 | 16.5 |
| වියදම හා ශුද්ධ ණය දීම් | ද.දේ.නි.යේ % වශයෙන් | 20.9 | 19.7 | 19.6 | 19.8 | 19.8 | 20.1 |
| වර්තන ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -2.3 | -0.6 | 0.5 | 0.5 | 1.3 | 1.6 |
| සමස්ත අයවැය හිඟය | ද.දේ.නි.යේ % වශයෙන් | -7.6 | -5.4 | -4.6 | -4.3 | -3.8 | -3.5 |
| මධ්‍යම රජයේ ණය | ද.දේ.නි.යේ % වශයෙන් | 77.6 | 79.3 | 77.5 | 75.1 | 72.7 | 70.0 |
| **මුදල් අංශය සහ උද්ධමනය** | | | | | | | |
| පුළුල් මුදල් වර්ධනය ($M_{2b}$) (උ) | සියයට | 17.8 | 18.4 | 12.3 | 12.3 | 13.5 | 13.8 |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණය වර්ධනය ($M_{2b}$ හි) (උ) | සියයට | 25.1 | 21.9 | 15.0 | 14.7 | 15.0 | 15.1 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (ඌ) | සියයට | 2.2 | 4.0 | 6.0 | 5.0 | 5.0 | 5.0 |

(අ) 2017 මාර්තු මැද වනවිට පැවති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඉ) නවතම ජනගහන සංඛ්‍යා දත්ත අනුව ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත.
(ඊ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2017 මාර්තු 15 දින නිකුත් කරන ලද 2015 සංශෝධිත ද.දේ.නි ඇස්තමේන්තු මත පදනම් වේ.
(උ) වසර අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය
(ඌ) කො.පා.මි. දර්ශකය (2013 = 100) මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

ක්‍රියාමාර්ග රාශියක් හඳුන්වාදීම මගින් රජයේ කැපවීම පෙන්නුම් කර ඇත. ඒ අනුව, අයවැය හිඟය 2020 වසර වන විට ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 3.5 දක්වා අඩුකර ගැනීමට අපේක්ෂිතය. ආදායම් රැස්කරන ආයතන ස්වයංක්‍රීයකරණය කිරීම, අවදානම් පාදක කරගත් විගණනය, කාර්යක්ෂමතාව ඉහළ නංවන මිනුම් හඳුන්වා දීම, බදු නීති සරල කිරීම සහ බදු පදනම පුළුල් කිරීම වැනි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් 2020 වසර වන විට ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආදායම සියයට 16 ක් පමණ දක්වා ඉහළ නැංවීමට අපේක්ෂිතය. තවද, ඵලදායී නොවන රාජ්‍ය වියදම් තාර්කිකරණය කිරීම, වාණිජ වශයෙන් ශක්තිමත් ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යෑම සඳහා රජය සතු වාණිජ ව්‍යවසායන් ප්‍රතිසංස්කරණය කිරීම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණයෙහි විනිවිදභාවය හා වගවීම ඉහළ නැංවීම, සහනාධාර වැඩසටහන් සුදුසු පිරිස් වෙත ඉලක්කගත කිරීම වැනි ප්‍රතිපත්ති ද රජයේ මැදිකාලීන උපායමාර්ගය තුළ අන්තර්ගත වේ. අමාත්‍යාංශ සඳහා රාජ්‍ය ආයතන ඉදිරියේ දී සිදුකිරීමට එකඟ වී ඇති වියදම් හා සම්බන්ධ බැඳීම් පාලනය කිරීමේ යාන්ත්‍රණයක් (Commitment Control Mechanism) හඳුන්වා දීම, කාර්තුමය වියදම් සහ ආදායම් ප්‍රතිඵල පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම යන ප්‍රතිපත්ති රාජ්‍ය වියදම් කළමනාකරණය තවදුරටත් ශක්තිමත් කරනු ඇත. ආදායම් පාදක කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය, රාජ්‍ය මූල්‍ය අවකාශය ප්‍රසාරණය කිරීමට හේතු වන අතර, එමගින් මැදිකාලීනව වර්ධන අවශ්‍යතා සඳහා වන රාජ්‍ය වියදම් ඉහළ නැංවීමට ඉඩ සැලසේ. මෙමගින් රාජ්‍ය ආයෝජන ප්‍රමාණවත් මට්ටමක පවත්වා ගනිමින් යටිතල පහසුකම් සඳහා වන රාජ්‍ය වියදම ඉහළ නැංවීමටත් අධ්‍යාපනය, සෞඛ්‍ය, සමාජ ආරක්ෂණ වැඩසටහන් වැනි සමාජීය වියදම් ඉහළ

1

### විශේෂ සටහන 1

## ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහා ආකෘති මත පදනම් වූ ප්‍රවේශයක්

ශ්‍රී ලංකා මහ බැංකුව වර්තමානයේදී සිය මුදල් ප්‍රතිපත්ති රාමුව වැඩිදියුණු කරමින්, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ (Flexible Inflation Targeting) රාමුවකට නැඹුරු වෙමින් සිටී.[1] පුළුල් වශයෙන් ගත් කල, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය යනුවෙන් අදහස් වනුයේ, ආර්ථික ස්ථායීතාව නිසි පරිදි පවත්වා ගෙන යමින්, ඉලක්ක කරනු ලැබූ අගයක් ආසන්නයේ උද්ධමනය ස්ථායීව පවත්වා ගැනීමට හැකි වන පරිදි ප්‍රතිපත්තිමය පොලී අනුපාතික මෙහෙයවීමයි (Palmqvist, 2007). එබැවින්, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ කෙටිකාලීනව නිමැවුම සහ උද්ධමනය අතර පවතින තුලනය (Trade off) කළමනාකරණය සහ සන්නිවේදනය කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන කේන්ද්‍රීය විචල්‍ය වන්නේ උද්ධමන පුරෝකථනයයි.

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණයක් අනුගමනය කිරීමේදී අත්‍යවශ්‍ය සාධකයක් වන්නේ මහ බැංකුව වඩාත් විනිවිදභාවයකින් සහ ඉදිරි දැක්මකින් යුතුව කටයුතු කිරීමයි. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මැදිකාලීන පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ සිදු කිරීමේදී ව්‍යුහාත්මක ආකෘති (Structural Models) භාවිතය අත්‍යවශ්‍ය වේ. මෙම ආකෘති මගින් මූර්ත නිෂ්පාදනය උපරිම ධාරිතා මට්ටමෙහි ස්ථායීව පවත්වා ගනිමින්, මැදිකාලීන වශයෙන් අපේක්ෂිත මට්ටමේ උද්ධමනය පවත්වා ගැනීමට අවශ්‍ය කරනු ලබන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග තීරණය කිරීමේ හැකියාව මහ බැංකුවට ඇති කරනු ලබයි. මෙම ආකෘතිවල ප්‍රතිඵල මගින් එයට පාදක වූ උපකල්පන, අවධානම් සහ ප්‍රතිපත්තිමය ගැටලු පිළිබඳ ව්‍යුහාත්මක කතිකාවතක් සඳහා මග පාදනු ලබන අතර, ප්‍රතිපත්තිමය තීරණවල ඉහළ විනිවිදභාවය සහ සන්නිවේදනය සඳහා අවකාශ සලසනු ලබයි (Alichi and Benes, 2015).

### උද්ධමන ඉලක්කකරණය පිළිබඳ සමස්ත නිරීක්ෂණය

උද්ධමන ඉලක්කකරණයෙහි සුවිශේෂී වාසියක් වනුයේ, එය මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී "රීති (Rules)" සහ "අභිමතය (Discretion)" යන දෙඅංශයෙහිම මූලිකාංගවලින් සමන්විත ප්‍රතිපත්ති රාමුවක් වීමයි. ඒ අනුව, උද්ධමන ඉලක්කය මගින් ආර්ථික පාර්ශ්වකරුවන්ට අනාගත උද්ධමනය පිළිබඳ අපේක්ෂා නිසි මගට යොමු කර ගැනීම සඳහා යොදා ගත හැකි රීතිමය රාමුවක් සපයන අතර, මහ බැංකුවට කම්පනවලට ප්‍රතිචාර දැක්වීම සඳහා සිය අභිමතය යොදා ගැනීමට හැකියාව ලැබේ (Hammond, 2012).

උද්ධමන ඉලක්කකරණ රාමුවේ අත්‍යවශ්‍ය ලක්ෂණ කිහිපයකි. එනම්;

i. උද්ධමනය සඳහා සංඛ්‍යාත්මක ඉලක්කයක් ප්‍රකාශයට පත් කිරීම

ii. ඉදිරි දැක්මකින් යුතු මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමට ඉවහල් වන මැදිකාලීන උද්ධමන පුරෝකථන ඇතුළත් පුළුල් තොරතුරු සමුදායක් පදනම් කරගත් මුදල් ප්‍රතිපත්තිය

iii. ඉහළ මට්ටමේ විනිවිදභාවය සහ වගවීමේ යාන්ත්‍රණ සහිත වීම.

සාර්ථක උද්ධමන ඉලක්කකරණ රාමුවක් ස්ථාපනය කිරීම සඳහා අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතා කිහිපයක් හඳුනාගෙන ඇත. මිල ස්ථායීතාව ළඟා කර ගැනීම සඳහා මහ බැංකුවේ මෙහෙයුම් ස්වාධීනත්වය සහ ඒ සඳහා ඉතා පැහැදිලි බලතල පැවතීම, රාජ්‍ය මූල්‍ය ආධිපත්‍යයෙන් තොර වූ මහ බැංකුවේ ස්වාධීනත්වය, මැනවින් හඳුනා ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ මාර්ග, මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අතර මනා සම්බන්ධීකරණය, නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයක් පැවතීම, සාර්ව ආර්ථික විශ්ලේෂණය සහ පුරෝකථනය සඳහා මනා ක්‍රමවේදයක් පැවතීම සහ දියුණු මූල්‍ය පද්ධතියක් පැවතීම මෙන්ම, මහ බැංකුවේ වගවීම සහ විශ්වසනීයත්වය ගොඩනගා ගැනීම උදෙසා හේතු වන විනිවිදභාවයෙන් යුක්ත ප්‍රතිපත්ති පැවතීම යනාදිය මීට අයත් වේ (Schaechter et al., 2000).

ශ්‍රී ලංකා මහ බැංකුව ද දැනටමත් උද්ධමන ඉලක්කකරණ රාමුවක පූර්ව අවශ්‍යතා රැසක් සපුරා ඇත. මෙහෙයුම් උපකරණ තෝරා ගැනීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව සතු ස්වාධීනත්වය සහ මිල ස්ථායීතාව ළඟා කර ගැනීම සඳහා මහ බැංකුවට පැවරී ඇති වගකීම මත පදනම්ව, මුදල් ප්‍රතිපත්ති රාමුව උද්ධමන ඉලක්කකරණයක් සඳහා පරිවර්තනය කිරීම සඳහා මෑතකදී තවදුරටත් ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනයා වෙත ප්‍රසිද්ධ කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශනයක් තුළින් සිය ප්‍රතිපත්ති පැහැදිලි ලෙස දැක්වීමටත්, මහ බැංකුව තුළ සාර්ව ආර්ථික පුරෝකථන ක්‍රමවේද වැඩිදියුණු කිරීමටත්, අනාගත උද්ධමනයෙහි අපේක්ෂිත මට්ටම ප්‍රකාශයට පත් කිරීමට මෙන්ම, උද්ධමන අපේක්ෂා පිළිබඳව සමීක්ෂණයක් සිදු කිරීම ඇරඹීමටත් කටයුතු කර ඇත (ශ්‍රී ලංකා මහ බැංකුව, 2017). එමෙන්ම, මෙම කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍ය සඳහා දත්ත එක් රැස් කිරීම හා කළමනාකරණය මෙන්ම, ආකෘතිකරණය හා පුරෝකථන සඳහා පැවතිය යුතු තාක්ෂණික දැනුම වැඩිදියුණු කිරීමටත් කටයුතු කොට ඇත.

1 වැඩි විස්තර සඳහා 2007 වසරේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ විශේෂ සටහන 1 සහ 2015 වසරේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ විශේෂ සටහන 10 බලන්න.

1989 දී නවසීලන්ත සංචිත බැංකුව උද්ධමන ඉලක්කකරණ රාමුවකට අවතීර්ණ වීමෙන් පසු, උද්ධමන ඉලක්කකරණය සඳහා වූ විශිෂ්ට පරිචයන් ක්‍රමයෙන් විකාශනය වී ඇති අතර, මේ වන විට එම ක්‍රමවේදය අනුගමනය කරන මහ බැංකු විසින් දැඩි (Strict) උද්ධමන ඉලක්කකරණයට වඩා නම්‍යශීලී (Flexible) උද්ධමන ඉලක්කකරණයක් සිදු කරනු ලබයි (Palmqvist, 2007; Svensson, 2009). උද්ධමනය, එහි ඉලක්කගත අගයෙන් අපගමනය වීම මෙන්ම නිෂ්පාදනය එහි උපරිම ධාරිතා මට්ටමෙන් අපගමනය වීම මගින් මනිනු ලබන සමාජ සුභසාධන අවාසිය (Welfare Loss) අවම කිරීම සඳහා මහ බැංකුව කටයුතු කරන ආකාරය නිර්වචනය කිරීම සඳහා "නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය" යන යෙදුම, 1999 දී ස්වෙන්සන් විසින් හඳුන්වා දෙන ලදී. කෙසේ වෙතත්, ප්‍රායෝගික වශයෙන් ගත් කල, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය හා බැඳුණු නම්‍යශීලීභාවය, මූර්ත ආර්ථිකයෙහි වර්ධනයන් සැලකිල්ලට ගනිමින් පමණක් නොව, උද්ධමනයෙහි ඉලක්කගත සීමාව මෙන්ම මහ බැංකුව විසින් උද්ධමනය, එහි අපගමනයන්ගෙන් නැවත ඉලක්කගත අගය දක්වා රැගෙන ඒම සඳහා කෙතරම් ඉක්මනින් උත්සාහ දරයි ද යන්න මත අර්ථකථනය කළ හැකිය (Palmqvist, 2007).

**නම්‍යශීලී උද්ධමන රාමුවක් සඳහා ආකෘති මත පදනම් වූ පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ සිදුකිරීමේ අවශ්‍යතාව**

විශ්වසනීය මැදිකාලීන පුරෝකථන සහ මුදල් සම්ප්‍රේෂණ යාන්ත්‍රණය පිළිබඳ වන දැනුම මත නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණයක් සාර්ථකව ක්‍රියාත්මක වීම රඳා පවතී. වැඩිදියුණු කරන ලද සාර්ව ආර්ථික ආකෘති, ආර්ථිකය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීම සඳහා උපකාරී වන අතර, ඇති විය හැකි අවදානම් සහ ඒ මගින් මූලික සාර්ව විචල්‍යවල ඉදිරි හැසිරීම මත ඇති කරන බලපෑම ඇගයීමට ද උපකාරී වේ. එබැවින්, ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ සවිමත් බව වැඩිදියුණු කිරීමට මෙම ආකෘතිවලට හැකිය. තවද, සාර්ව ආර්ථික විචල්‍ය අතර පවතින සම්බන්ධතා සහ ආර්ථික පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවලින් සමන්විත සංකීර්ණ සම්ප්‍රේෂණ යාන්ත්‍රණයක් තුළින් උද්ධමනය සහ නිමැවුම කෙරෙහි මුදල් ප්‍රතිපත්තිය බලපෑමක් ඇති කරනු ලබයි. එබැවින්, ශ්‍රී ලංකා ආර්ථිකයෙහි සුවිශේෂී ලක්ෂණ සැලකිල්ලට ගනිමින් විශ්වසනීය පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ සිදු කළ හැකි මෙවලම් අත්කර ගැනීම අත්‍යවශ්‍ය වී ඇත.

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය ක්‍රියාත්මක කරනු ලබන මහ බැංකු විසින් ආර්ථිකයේ මැදිකාලීන ගමන් මග තීරණය කිරීම සඳහා ආකෘති සමුදායක් පවත්වා ගැනීම සාමාන්‍යයෙන් දක්නට ලැබේ (Black et al., 1994; Black et al., 1997; Coats et al., 2003). මින් පෙර ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සාර්ව ආර්ථිකමිතික පුරෝකථනවල නියැළුණ ද, ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ආකෘති සකස් කිරීම සඳහා මහ බැංකුවට ඇති හැකියාව තවදුරටත් ශක්තිමත් කිරීමේ අදහස පෙරදැරිව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි තාක්ෂණික සහයෝගය සහ විශේෂිත පුහුණුව සහිතව, ව්‍යූහාත්මක ආකෘති සම්පාදනය කිරීමේ කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරඹා ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ව්‍යූහාත්මක ආකෘති මත පදනම් වූ පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතියක් (Forecasting and Policy Analysis System - FPAS) මැදිකාලීනව ගොඩනැඟීම තුළින් මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ ක්‍රමවේදයක් කරා ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති රාමුව සංක්‍රමණය වීම පිණිස ඒකාබද්ධ ප්‍රයත්නයක් දරමින් සිටී.

පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීමෙහිලා මූලික පියවරක් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව තුළ ආකෘතීකරණ හා පුරෝකථන අංශයක් මේ වන විට ස්ථිර වශයෙන් ස්ථාපනය කොට ඇත. කෙටිකාලීන සහ මැදිකාලීන පුරෝකථන මෙවලම් සහ තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම මගින් උද්ධමනය පුරෝකථනය කිරීම ඇතුළු සියලුම සාර්ව ආර්ථික පුරෝකථන වැඩිදියුණු කිරීමට හැකි වන පරිදි ඊට අදාළ කාර්ය මණ්ඩලයේ තාක්ෂණික හැකියා වැඩිදියුණු කිරීම සඳහා වූ මූලික කටයුතු සිදු කෙරෙමින් පවතියි. ඒ අනුව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙනත් දෙපාර්තමේන්තුවල ද සහාය ඇතිව, පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතියෙහි දත්ත අවශ්‍යතා සඳහා ප්‍රයෝජනවත්, එමෙන්ම පර්යේෂණ සඳහා යොමු විය හැකි ක්ෂේත්‍ර හඳුනා ගැනීමට සහාය වන පුළුල් විශ්ලේෂණාත්මක දත්ත සංචිතයක් (Analytical Database) කළමනාකරණය කරනු ලබයි.

**පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය පිළිබඳ කෙටි හැඳින්වීමක්**

පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය, දත්ත සහ විනිශ්චයන් සංයුක්ත සහ තර්කානුකූල ලෙස යොදා ගත හැකි මැදිකාලීන පූර්ව ප්‍රතිපත්ති විශ්ලේෂණ ක්‍රමවේදයකි. දත්ත රැස් කිරීම, විශ්ලේෂණය හා සැකසීම මෙන්ම ආර්ථිකයේ දිගුකාලීන ස්ථායීතාව පවත්වා ගැනීමට ප්‍රමුඛත්වය ලබා දෙනු ලබන ඉදිරි දැක්මක් සහිත ප්‍රතිපත්ති සැලසුම් කිරීම සඳහා වන උපකල්පන මෙම පද්ධතිය තුළ අඩංගු වේ. එමෙන්ම, තීරණ ගැනීම සඳහා සහාය වනු ලබන ඉහළ ගුණත්වයකින් යුතු සාර්ව ආර්ථික විශ්ලේෂණ සහ පුරෝකථන ක්‍රියාවට නැංවීමේ හැකියාව කාර්ය මණ්ඩලය වෙත ලබා දෙනු ලබන මෙවලම් සහ ක්‍රියාවලි කිහිපයක් මෙම පද්ධතිය විසින් සම්බන්ධ කරනු ලබයි. නම්‍යශීලී ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතියේ මූලික පදනම

වන ව්‍යූහාත්මක ආකෘතිය මගින්, පුරෝකථන, පුරෝකථන මත ඇති අවදානම් හා විවිධ කම්පනවලට නිසි ලෙස ප්‍රතිචාර දැක්වීම යනාදියට අදාළව ඉහළ මට්ටමේ ප්‍රතිපත්තිමය සාකච්ඡා සඳහා පහසුකම් සැලසෙන අතර, විවිධ අවස්ථාවන්ට උචිත ප්‍රතිපත්ති සැලසුම් සකස් කිරීමට අවස්ථාව ලබා දෙයි. ව්‍යූහාත්මක පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතියක් මගින් තවත් ප්‍රතිලාභ කිහිපයක් අත්පත් කර ගත හැකිය. ඒවා නම්,

* ඒකමතික තීරණ කරා ළඟාවීමේ ක්‍රියාවලිය අඛණ්ඩව වැඩිදියුණු කිරීම උදෙසා වැදගත් වන සහ ඊට මග විවර කරනු ලබන පුරෝකථන හා ප්‍රතිපත්තිමය වාද විවාදවල නියැළී සිටින සියලු කාර්ය මණ්ඩල අතර සන්නිවේදනය වැඩිදියුණු වීම.
* ප්‍රධාන ප්‍රතිපත්තිමය ගැටලු වඩාත් හොඳින් හඳුනා ගැනීමට සහ සන්නිවේදනයට මග පාදමින් ඇති විය හැකි අවදානම් පිළිබඳ වඩාත් ව්‍යූහාත්මක සාකච්ඡාවක් ඇති කිරීම.
* මෙතෙක් උපයෝගී කර ගනු ලැබූ පුරෝකථන කාර්යක්ෂමව ඇගයීම මගින් පර්යේෂණ සිදු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමට දත්ත ගබඩාවක් ගොඩනැඟීම.
* සාර්ව ආර්ථික පුරෝකථනය සහ පර්යේෂණ කාර්ය මණ්ඩලයක් සහිත විශේෂඥ සංචිතයක් ගොඩනැඟීම.
* මුදල් සම්ප්‍රේෂණ යාන්ත්‍රණය සහ පැනනැඟිය හැකි කම්පන හෝ බාධාවල බලපෑම පිළිබඳ ආයතනික දැනුම ගොඩනැඟීම.
* මුදල් ප්‍රතිපත්තියෙහි පද්ධතිමය ලක්ෂණ සහ පුරෝකථන සැකසීම පිළිබඳ විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා ඇති හැකියාව (Laxton et al., 2009).

කැනඩාව, බ්‍රසීලය, ඕස්ට්‍රේලියාව, සිංගප්පූරුව, තායිලන්තය සහ ඉන්දියාව වැනි රටවල මහ බැංකු කිහිපයක් විසින් පුරෝකථන සහ විශ්ලේෂණ පද්ධති සාර්ථකව ස්ථාපනය කොට ඇති අතර, වර්තමානයේ අනෙකුත් මහ බැංකු ගණනාවක් ද එවැනි පද්ධති ගොඩනැඟීම සිදු කරමින් සිටී.[2] පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය තුළ වැදගත් අංගයක් වන්නේ කාර්තුමය පුරෝකථන ආකෘතියයි (Quarterly Projection Model). මෙය ආර්ථිකය තුළ ඉදිරි දැක්මක් සහිතව ප්‍රතිපත්ති සැකසීම සඳහා ඉවහල් කරගත හැකි විවෘත ආර්ථික පරිසරයක් තුළ විශ්ලේෂණය කෙරෙන පරතර ආකෘතියක් (Open Economy Gap Model) වන අතර, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් යටතේ අදාළ ඉලක්ක ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය කරන මැදිකාලීන ප්‍රතිපත්ති සැකැසීම සඳහා උපකාරී වේ (ඉන්දීය සංචිත බැංකුව, 2016). කෙටිකාලීන වශයෙන් සමස්ත ඉල්ලුම සහ නිමැවුම් වෙනස්වීම කෙරෙහි මුදල් ප්‍රතිපත්තිය බලපාන බවට ඇති පොදු පිළිගැනීම ද ඇතුළත් නව කේන්සියානු විවෘත ආර්ථික මූලධර්ම මත එය ගොඩනැඟී ඇත. දිගුකාලීනව ප්‍රතිපත්ති මගින් නාමික විචල්‍ය (උදා: උද්ධමනය) මත පමණක් බලපෑම් ඇති කරන අතර, මුදල් ප්‍රතිපත්තියෙහි පාලනයෙන් බැහැර සාධක (උදා: ඵලදායීතා වර්ධනය, ආදායම් ප්‍රතිව්‍යාප්තිය කෙරෙහි බලපාන රාජ්‍ය ප්‍රතිපත්ති) මූර්ත විචල්‍ය (උදා: මූර්ත ද.දේ.නිෂ්පාදිත වර්ධනය) කෙරෙහි බලපායි. එසේම, මෙම ආකෘති ක්ෂුද්‍ර-පදනමක් (Micro-foundations) හා තාර්කික අපේක්ෂා (Rational Expectations) මත ගොඩනැඟී ඇත.

ඒ අනුව, පුරෝකථන හා ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පුරෝකථන සහ මුදල් ප්‍රතිපත්තිය විශ්ලේෂණය සඳහා මූලික මට්ටමේ පවතින අර්ධ ව්‍යූහාත්මක කාර්තුමය පුරෝකථන ආකෘතියක් ගොඩ නංවා ඇත.[3] මෙම පදනම් ආකෘතියෙහි ආර්ථික ක්‍රියාකාරිත්වය පිළිබඳ වූ සමීකරණ හතරක් ඇතුළත් වන අතර, ඒවා සමස්ත ඉල්ලුම (ආයෝජන-ඉතුරුම් වක්‍රය), සමස්ත සැපයුම (පිලිප්ස් වක්‍රය), පොලී අනුපාතික සහ විනිමය අනුපාතික අතර සබඳතාව දැක්වෙන තුල්‍යතා න්‍යාය (Uncovered Interest Rates Parity) සහ මුදල් ප්‍රතිපත්ති ප්‍රතික්‍රියා ශ්‍රිතය (විනිමය අනුපාතික නියමයක් හා සමඟ සම්බන්ධ වූ ටේලර් රීතිය (Taylor Rule) මත පදනම් වූ පොලී අනුපාතික නියමයක්) වේ.

එසේම, කාර්තුමය පුරෝකථන ආකෘතිය මගින් ශ්‍රී ලංකා ආර්ථිකය මුහුණ දිය හැකි බහුවිධ කම්පන ද සලකා බලනු ලැබේ. මේවා සමස්ත ඉල්ලුම, සැපයුම, විනිමය අනුපාතික, මුදල් ප්‍රතිපත්තිය හා අවදානම් ආන්තික විසින් ඇති කරන කම්පන ආදී ලෙස පුළුල්ව වර්ගීකරණය කළ හැකිය.

ශ්‍රී ලංකා මහ බැංකුව දැනට දළ දේශීය නිෂ්පාදිතය සහ උද්ධමනය සඳහා නුදුරු කාලීන පුරෝකථන (Near Term Forecasting) සිදු කිරීමේදී ආර්ථිකමිතික ආකෘති කිහිපයක් භාවිත කරනු ලබයි. උද්ධමනය හා දළ දේශීය නිෂ්පාදිතය මත කෙටිකාලයේදී ඇති විය හැකි විශේෂිත කම්පන නිසි ලෙස ග්‍රහණය කර ගනිමින් කාර්තුමය පුරෝකථන ආකෘතියට අවශ්‍ය සහාය මෙම නුදුරු කාලීන පුරෝකථන වැඩිදියුණු කිරීම තුළින් ලැබෙනු ඇත.


මීට අමතරව, පුරෝකථනවලට පදනම් වන උපකල්පන හා විනිශ්චයන්, පුරෝකථන ළඟා කර ගැනීම පිළිබඳව ඇති අවදානම් සහ පුළුල් විශ්ලේෂණයක් සමඟින් එකී පුරෝකථිත මැදිකාලීන ගමන් මග සන්නිවේදනය කිරීමට

2 http://www.douglaslaxton.org/fpas.html

3 Amarasekara, C., Anand, R., Ehelepola, K., Ekanayake, H., Jayawickrema, V., Jegajeevan, S., Nugawela, T., Ratnavadivel, P., Remo, A., Plotnikov, S., Yatigamanna, R. An Open Economy Quarterly Projection Model for Sri Lanka. Forthcoming 2017.

**රූප සටහන වි.ස. 1.1**

**යෝජිත මුදල් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය**




සහාය වන බැවින්, පුරෝකථන හා විශ්ලේෂණ පද්ධතිය එළිදැක්වීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුව හා මහජනතාව අතර සන්නිවේදනය වැඩිදියුණු කිරීමට උපකාර වනු ඇත.

**ඉදිරි දැක්ම**

පුරෝකථන හා විශ්ලේෂණ පද්ධතියකට පූර්ණ වශයෙන් අනුගත වීම සඳහා මුදල් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ ප්‍රධාන වෙනස්වීම් ද අවශ්‍ය වේ (රූප සටහන වි.ස. 1.1). ඒ අනුව, 2017 වසරේ සිට මුදල් ප්‍රතිපත්ති කමිටුවේ (Monetary Policy Committee, MPC) රැස්වීම් සංඛ්‍යාව මීට පෙර පැවති රැස්වීම් 12 සිට 8 දක්වා අඩු කර ඇත. මෙම සංශෝධිත ක්‍රියාවලිය මගින් ආර්ථික වර්ධනයන් පිළිබඳ මනා විශ්ලේෂණයක් සිදු කිරීමට කාර්ය මණ්ඩලය සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදෙන අතර, එමගින් මුදල් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට අවශ්‍ය පුළුල්, පූර්වගාමී විවරණ සැපයීමට පහසු කෙරේ.

මහ බැංකුව විසින් මූලික සාර්ව ආර්ථික විචල්‍ය පිළිබඳ මැදිකාලීන පුරෝකථන මහජනතාව වෙත ඉදිරියේදී වඩා පැහැදිලිව සන්නිවේදනය කරනු ඇති බැවින්, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව හඳුන්වා දීමට මෙන්ම එහි සාර්ථකත්වයට හේතු වන වැදගත් කාර්යභාරයක් පුරෝකථන හා විශ්ලේෂණ පද්ධතිය විසින් ඉටු කරනු ඇත. උද්ධමන ඉලක්ක කරනු ලබන මහ බැංකු විසින් සිය මූලික සන්නිවේදන මෙවලම ලෙස උද්ධමන අපේක්ෂා කළමනාකරණය කිරීම සඳහා උද්ධමන වාර්තා (Inflation Reports) තුළින් උද්ධමන ඉලක්ක හා පුරෝකථන ප්‍රකාශයට පත් කිරීම යොදා ගනු ලැබේ. අතීතයේදී මුදල් ප්‍රතිපත්ති තීරණ ගැඹුරින් තේරුම් ගැනීම මහජනතාවට අපහසු කාර්යයක් විය. කෙසේ වෙතත්, අනාගතයේදී උද්ධමන වාර්තා ප්‍රකාශයට පත් කිරීම තුළින් ශ්‍රී ලංකා මහ බැංකුව සහ මහජනයා අතර පවතින මෙම තොරතුරු පරතරය අවම කිරීමට අපේක්ෂා කෙරේ. තවද, මෙවැනි වාර්තා මගින් නිවේදනය කරන ලද ඉලක්ක පිළිබඳ විනිවිදභාවය පවත්වා ගැනීමට පමණක් නොව වගවීම පවත්වා ගැනීමට ද ප්‍රතිපත්ති සම්පාදකයෝ පෙළඹෙති. ඉලක්ක මගහැරී යැමේදී, ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් සිය කාර්යසාධනය පිළිබඳ පැහැදිලිව සාධාරණීකරණය කිරීම අත්‍යවශ්‍ය වන අතර, එමගින් මහජනතාවට ප්‍රතිපත්තිමය අඩුලුහුඬුකම් පිළිබඳ තේරුම් ගැනීමට ද අවස්ථාව ලැබේ. නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයක් තුළ, මුදල් ප්‍රතිපත්තිය වඩාත් ස්වාධීනව මෙහෙයවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට ඇති හැකියාව ශක්තිමත් කිරීම අරමුණු කරගත් අත්‍යවශ්‍ය නෛතික සංශෝධන ද, මෙම ක්‍රියාදාමය සාර්ථක කර ගැනීම සඳහා සහාය වනු ඇතැයි අපේක්ෂිතය.

ආර්ථිකයෙහි වර්ධනයට හිතකර, අඩු උද්ධමන පරිසරයක් ඇති කිරීමට ඉවහල් වන්නා වූ ඉදිරි දැක්මක් සහිත ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීම උදෙසා, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් තුළ, ප්‍රතිපත්ති සම්පාදකයන්ට කටයුතු කිරීම සඳහා පැහැදිලි හා තාර්කික පදනමක් මත ගොඩනැගුණු පුරෝකථන හා ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය පහසුකම් සලසනු ඇත.

මූලයන්:


Alichi, A. and J. Benes. 2015. "Frontiers of Monetary Policymaking: Adding the Exchange Rate as a Tool to Combat Deflationary Risks in the Czech Republic." International Monetary Fund Working Papers 15-74.

Benes, J., K. Clinton, A. T. George, P. Gupta, J. John, O. Kamenik, D. Laxton, P. Mitra, G. V. Nadhanael, R. Portillo, H. Wang, and F. Zhang. 2016. "Inflation-Forecast Targeting For India: An Outline of the Analytical Framework." RBI Working Papers, 07.

Benes, J., K. Clinton, A. T. George, J. John, O. Kamenik, D. Laxton, P. Mitra, G. V. Nadhanael, H. Wang, and F. Zhang. 2016. "Quarterly Projection Model for India: Key Elements and Properties." RBI Working Papers, 08.

Black, R., V. Cassino, A. Drew, E. Hansen, B. Hunt, D. Rose, and A. Scott. 1997. "The Forecasting and Policy System: the Core Model." Reserve Bank of New Zealand Research Papers 43.

Black, R., D. Laxton, D. Rose, and R. Tetlow. 1994. "The Steady-State Model: SSQPM: The Bank of Canada's New Quarterly Projection Model." Bank of Canada Technical Reports 72, Part 1.

Central Bank of Sri Lanka. 2017. "Road Map: Monetary and Financial Sector Policies for 2017 and Beyond."

Coats, W., D. Laxton, and D. Rose. 2003. "The Czech National Bank's Forecasting and Policy Analysis System."

Gonçalvez, C.E.S. and J.M. Salles. 2008. "Inflation Targeting in Emerging Economies: What Do the Data Say?" Journal of Development Ecnonomics, 85, pp. 312-18.

Hammond, G. . 2012. "State of the Art of Inflation Targeting." Centre for Central Banking Studies Handbooks.

International Monetary Fund. 2015. "Evolving Monetary Policy Frameworks in Low-Income and other Developing Countries."

Laxton, D., D. Rose, and A. Scott. 2009. "Developing a Structured Forecasting and Policy Analysis System to Support Inflation-Forecast Targeting (IFT) " International Monetary Fund Working Papers, 09-65.

Palmqvist, S. 2007. "Flexible Inflation Targeting: How should Central Banks take the Real Economy into Consideration?" Sveriges Riksbank Economic Review, 2:61.

Schaechter, A., M.R. Stone, and M. Zelmer. 2000. "Adopting Inflation Targeting: Practical Issues for Emerging Market Countries." International Monetary Fund.

Svensson, L.E.O. 1999. "Inflation Targeting: Some Extensions." Scandinavian Journal of Economics, 101:3, pp. 337-61.

Svensson, L.E.O. 2009. "Flexible Inflation Targeting: Lessons from the Financial Crisis."


නැංවීමටත් අවශ්‍ය රාජ්‍ය මූල්‍ය අවකාශයක් ඇති කෙරෙනු ඇතැයි අපේක්ෂිතය. රජයේ මැදිකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය මගින් අවම පිරිවැයක් සහ අවදානමක් සහිතව රජයේ මූල්‍යන අවශ්‍යතා සපුරා ගනිමින් විචක්ෂණශීලීව ණය ගැනීම් සිදු කිරීම සඳහා යෝග්‍ය රාමුවක් සැපයීමට ද අපේක්ෂිතය. ඒ අනුව, වසර 2020 වන විට මධ්‍යම රජයේ ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 70 ක මට්ටමක් දක්වා අඩුකර ගැනීමට අපේක්ෂිතය.

## 1.5 ගැටලු සහ ප්‍රතිපත්ති

**ශ්‍රී ලංකා ආර්ථිකයෙහි ඉහළ සහ තිරසාර මූර්ත ද.දේ.නි. වර්ධනයක් පවත්වා ගෙන යෑම වළක්වාලමින් දිගු කලක් පුරා පවතින ව්‍යුහාත්මක ගැටලු සඳහා විසඳුම් සැපයීම මත අපේක්ෂිත මැදිකාලීන වර්ධන මාවත සාක්ෂාත් කර ගැනීම තීරණය වනු ඇත.** නිසිකලට අනුගමනය කරන ලද හිතකර රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මෙන්ම, ඵලදායීතාව හා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම අරමුණු කොට ගත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ආර්ථිකයේ පවතින ව්‍යුහාත්මක ගැටලු විසඳීම සඳහා අත්‍යවශ්‍ය වන අතර, එමගින් මැදිකාලීනව හා ඉන් ඉදිරියට, ආර්ථිකයෙහි උපරිම ධාරිතාව ළඟාකර ගැනීමට හැකිවන පරිදි ආර්ථික වර්ධන ගමන්මග නැවත සකස්වනු ඇත.

**ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස අපනයන ඉපැයීම් පහළ යෑම සඳහා විදේශීය ඉල්ලුමෙහි පසුබෑම යම් ප්‍රමාණයකට හේතු වුවද, එවැනි ප්‍රවණතාවක් නොකඩවා පැවැතීම කෙරෙහි අභ්‍යන්තර සාධකවල බලපෑම නොසලකා හැරිය නොහැකිය.** අපනයන ආදායම අඛණ්ඩව දෙවැනි වසරටත් 2016 වසරේ දී අඩු වූ අතර, එය වසර 5 කට පෙර වාර්තා කළ අපනයන ආදායම් මට්ටමටත් වඩා පහළ අගයක් ගෙන ඇත. ශ්‍රී ලංකාව සාපේක්ෂ වශයෙන් ඉහළ ජීවන තත්ත්වයකින් යුතු මැදි ආදායම් ලබන ආර්ථිකයක් වන අතර, අඩු එකතු කළ අගයක් සහිත එකම වර්ගයේ ප්‍රාථමික වෙළෙඳ භාණ්ඩ පසුගිය දශක දෙක පුරාම අපනයනය කිරීම සහ සංකීර්ණ හා දැනුම පදනම් කරගත් භාණ්ඩ නිපදවීම සීමාසහිත වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ අපනයන වර්ධනය සීමා වී ඇත. මෙමගින්, භාණ්ඩ හා වෙළඳපොළ යන දෙඅංශයෙහිම විවිධාංගීකරණය වීමේ අවශ්‍යතාව ඉස්මතු කෙරේ. කලාපීය සහ ගෝලීය නිෂ්පාදන ජාල සමඟ ඒකාබද්ධ වන අතර, තාක්ෂණය වැඩි වශයෙන් උපයෝගී කර ගනු ලබන වඩා සංකීර්ණ, ඉහළ එකතු කළ වටිනාකමක් සහිත භාණ්ඩ නිෂ්පාදනය කිරීම, අපනයන මූලික කොටගත් ආර්ථිකයක් වෙත පරිවර්තනය වීමේ දී මූලික වනු ඇත. දැනට ප්‍රාථමික භාණ්ඩ ස්වරූපයෙන් අපයනයන කරනු ලබන ඛනිජ ද්‍රව්‍ය යොදා ගනිමින් ඉහළ එකතු කළ වටිනාකමක් සහිත භාණ්ඩ නිෂ්පාදනය කිරීම මේ සම්බන්ධයෙන් සලකා බැලිය යුතු එක් උපාය මාර්ගයකි. ශ්‍රී ලංකාවට තරගකාරීව සැපයිය හැකි භාණ්ඩ හා සේවා හෝ ඒවායෙහි අගය දාමයේ අංග හඳුනා ගැනීම, නිෂ්පාදන අංශය නඟා සිටුවීම, විදේශීය ඍජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ වෙළඳ අවස්ථා හඳුනා ගැනීම ආදී රජයේ වත්මන් සංවර්ධන ප්‍රතිපත්ති මත පදනම් වූ මනා සම්බන්ධීකරණයක් සහිත වැඩපිළිවෙළක් මේ සඳහා ක්‍රියාත්මක කළ යුතු වේ. මේ අතර, විදේශ විනිමය සඳහා ඇති ඉල්ලුම් හා සැපයුම් තත්ත්වයන් නිවැරැදිව පෙන්නුම් කරනු ලබන වෙළඳපොළ මත පදනම් වූ විනිමය අනුපාතිකයක් පවත්වාගෙන යෑම, 1970 දශකයේ මෙන් ශ්‍රී ලංකාව

ආවෘත ආර්ථිකයක් බවට පත්කිරීම සඳහා විශාල වශයෙන් හේතු පාදක වූ තීරුබදු නොවන වෙනත් බදු අඩු කිරීම සහ අඩු හා ස්ථායී උද්ධමනයක් පවත්වාගෙන යෑම මෙන්ම වැටුප් තරගකාරී මට්ටමක පවත්වාගෙන යෑම ද ශ්‍රී ලංකාවේ අපනයන තරගකාරීත්වය සහතික කිරීම සඳහා අවශ්‍ය වනු ඇත (විශේෂ සටහන් 07 : '*අපනයන ප්‍රවර්ධනය උදෙසා ජාතික උපායමාර්ගය*' බලන්න).

**වෙළඳ භාණ්ඩ අපනයන ආදායමෙහි ඉහළ වර්ධනයක් නොමැති වීම හේතුවෙන් සාම්ප්‍රදායික නොවන සේවා අපනයනවල වැදගත්කම කැපී පෙනෙන ලෙස වර්ධනය වුවද, එහි පූර්ණ ධාරිතාවට ළඟාවීම සඳහා ඉලක්කගත ප්‍රයත්න ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.** තොරතුරු තාක්ෂණය, ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම සහ දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන කර්මාන්ත දියුණු කිරීම සේවා අපනයන ආදායම් ඉහළ නැංවීම සඳහා භාවිතා කළ හැකි ක්‍රියාමාර්ග වේ. මෙම කර්මාන්තය දියුණු කිරීම සඳහා උගත්, ඉංග්‍රීසි භාෂාව පිළිබඳව මනා ප්‍රවීණතාවක් සහ ඉහළ පුහුණුවක් සහිත මෙරට ශ්‍රම බලකාය භාවිතා කළ හැකිය. සමාන ශ්‍රම බලකායක් ඇති අනෙකුත් රටවල් හා සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ ශ්‍රම පිරිවැය අඩු බැවින්, මෙම අංශය තුළ ශ්‍රී ලංකාවට තරගකාරී වාසියක් පවතී. තරුණ ජනගහනයෙන් වැඩි පිරිසක් ගිණුම්කරණය, තොරතුරු තාක්ෂණය, ව්‍යාපාර කළමනාකරණය, නීතිය සහ ජාත්‍යන්තර භාෂා යන ක්ෂේත්‍රවල අධ්‍යාපන සුදුසුකම් ලබා ගනිමින් සිටී. මීට අමතරව, විශේෂයෙන්ම ගිවිසුම් නීතිය සහ සමාගම්වලට අදාළ නීති වැනි ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය ඉංග්‍රීසි නීතිය මත පදනම් වී ඇති බැවින් පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් වෙතින් පැමිණෙන ව්‍යාපාර සඳහා ලේකම් කටයුතු හා වෙනත් කාර්යාලයීය සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය පහසුවෙන් පුහුණු කළ හැකිය. තවද, තොරතුරු තාක්ෂණය, ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම, දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍රවලට පැවරීමට අදාළ සේවා සැපයීමට අමතරව, ශ්‍රී ලංකාවේ උපායමාර්ගික පිහිටීමෙහි ප්‍රතිලාභ අපේක්ෂිත පරිදි උපරිම තලයකට ගෙන යෑම සඳහා ඒකාබද්ධ ප්‍රයත්නයක් අවශ්‍ය වන අතර, නාවික හා ගුවන් සේවා වැනි වෙනත් සේවා අංශ දියුණු කිරීම සඳහා ජාතික උපාය මාර්ගයක් සැකසීම තුළින් එම සේවා අපනයන පුළුල් කිරීම සිදු කළ යුතුය.

**සංස්කෘතිකමය වශයෙන් සශ්‍රීක උරුමය සහ විවිධත්වයෙන් යුතු ස්වාභාවික ආකර්ෂණයන්ගේ ප්‍රතිලාභ ලබමින්, සංචාරයේ දී වැඩිපුර මුදල් වියදම් කරන විදේශීය සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම ඉලක්ක කරගත් සේවා පුළුල් කිරීමට කටයුතු කිරීම අවශ්‍ය වේ.** වාර්ෂිකව මිලියන දෙකකට අධික විදේශීය සංචාරකයන් ප්‍රමාණයක් සහ 2016 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 3.5 කට අධික සංචාරක ඉපැයීම් ප්‍රමාණයක් වාර්තා කරමින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පශ්චාත් යුද සමය තුළ වර්ධනය වී ඇත. සංස්කෘතිකමය වශයෙන් වැදගත් සහ ඓතිහාසික ස්ථාන, වනජීවී අභයභූමි, දර්ශනීය වෙරළ තීර සහ මනස්කාන්ත භූමියෙන් ද සපිරි ශ්‍රී ලංකාව සුවිශේෂ සංචාරක ගමනාන්තයක් ලෙස අද්විතීය ස්ථානයක් අත්කරගෙන ඇත. කෙසේ වුවද, විදේශීය සංචාරකයන්ගේ විවිධ අවශ්‍යතා සපුරාලීම සඳහා සංචාරක ආකර්ෂණයන්හි විවිධත්වය පුළුල් පරාසයක් දක්වා ව්‍යාප්ත කිරීමට මනා සම්බන්ධීකරණයකින් යුත් උපායමාර්ග අවශ්‍ය වේ. හුදෙක් තනි උපායමාර්ගයක් තුළින් අපේක්ෂිත ප්‍රතිඵල අත්පත් කරගත නොහැකි බැවින්, විවිධ ප්‍රධාන සංචාරක කණ්ඩායම් හඳුනා ගැනීමත්, එම කණ්ඩායම් වෙන් වශයෙන් ඉලක්ක කර ගනිමින් උපායමාර්ග ක්‍රියාත්මක කිරීමත් අත්‍යවශ්‍ය වේ. හුදෙකලා වී ඇති ආකර්ෂණීය ස්ථාන සංවර්ධනය කිරීම, ත්‍රාසජනක ක්‍රියා ජනප්‍රිය කිරීම, විනෝද උද්‍යාන පිහිටුවීම, ආයුර්වේද ප්‍රතිකාර පහසුකම් පුළුල් කිරීම, ප්‍රවාහන පහසුකම් හා අවිධිමත් නේවාසික පහසුකම් විධිමත් කිරීම යනාදිය සාමාන්‍ය විදේශ සංචාරකයන් සඳහා ශ්‍රී ලංකාවේ ආකර්ෂණීයත්වය ඉහළ නැංවීමට ගත යුතු ක්‍රියාමාර්ග වේ. සංචාරක කටයුතු සඳහා යොදාගනු ලබන කුඩා නැව් හා වරාය පහසුකම් සැපයීම සහ කුඩා පරිමාණ අධි සුඛෝපභෝගී හෝටල් ඇති කිරීම හා ඒවා ප්‍රවර්ධනය කරන අතරම, මෙම විශේෂිත වෙළඳපොළ සඳහා පහසුකම් සැපයීමට හැකි වන පරිදි විනෝද ආර්ථික කටයුතු ගොඩනැගීම තුළින් ඉහළ වියදම් චර්යාවක් සහිත විදේශීය සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා විශේෂ අවධානයක් දැක්විය යුතුය. විදේශීය සංචාරකයන් සඳහා ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු අත්දැකීම් පෙළක් ලබාදීම තුළින් ඔවුන් නැවත ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම සඳහා පෙළඹවීමක් කළ හැකි අතර, එයින් ධනාත්මක ප්‍රචාරණයකට ද ඉඩ ලැබේ. මීට අමතරව, සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීම තුළින් විදේශීය සංචාරකයෙකු මෙරට ගත කරන දින ගණන්වල සාමාන්‍යය, දැනට පවතින රාත්‍රී ගණන 10 ට වඩා ඉහළ නැංවීම සඳහා සහ සංචාරක ව්‍යාපාරය හා සම්බන්ධව අතිරේක ආදායමක් ජනනය කිරීමට හේතු වන අතර, එමගින් සෘජු හා වක්‍ර රැකියා අවස්ථා ජනනය වීම ද ඉහළ යනු ඇත.

**ආයෝජන සඳහා පහසුකම් සැලසීමට අඛණ්ඩව ප්‍රයත්න දැරුව ද දැනට ලැබී ඇති මූල්‍ය ලැබීම් අනුව සනාථ වන පරිදි, ශ්‍රී ලංකාව විදේශීය සෘජු ආයෝජන**

**ආකර්ෂණය කර ගැනීමේ දී දුර්වල ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කොට ඇත.** මෙම ප්‍රවණතාව කඩිනමින් වෙනස් කළ යුතුව ඇත. සතුටුදායක මට්ටමකට විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමට අපොහොසත්වීම හේතුවෙන් ජංගම ගිණුමේ හිඟය මූල්‍යනය කිරීම සඳහා විදේශීය ණය මත විශාල ලෙස යැපීමට සිදු වී ඇති අතර, එය ශ්‍රී ලංකාවේ දැනටමත් ඉහළ මට්ටමක පවතින ණයගැති භාවය තවදුරටත් ඉහළ යෑමට හේතුවනු ඇත. විශේෂයෙන්ම වියට්නාමය, මියැන්මාරය සහ බංග්ලාදේශය වැනි නැඟී එන වෙළඳපොළ ආර්ථික සාපේක්ෂව ඉහළ විදේශීය සෘජු ආයෝජන අත්කර ගැනීමේ පසුබිමක් තුළ, රට තුළට විදේශීය සෘජු ආයෝජන වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීම ඉලක්ක කර ගනිමින් රජය විසින් සකස් කරමින් පවතින ක්‍රමෝපාය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. විදේශීය සෘජු ආයෝජන සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමේ දී ශ්‍රී ලංකාවේ තරගකාරිත්වය ඉහළ නැංවීම ඉලක්ක කරගත් ස්ථිරසාර දේශීය ප්‍රතිපත්ති, ආයතනික සහාය ශක්තිමත් කිරීම සහ ආයෝජනය සඳහා ආකර්ෂණීය ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ පවතින ශක්‍යතා ඉස්මතු කරමින් සිදු කරනු ලබන ඉලක්කගත ප්‍රවර්ධන වැඩසටහන් හේතු සාධක වේ (විශේෂ සටහන් 02 : '*ගෝලීය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ තරගකාරිත්වය වැඩිදියුණු කිරීම*' බලන්න).

**ශ්‍රී ලංකාවේ කාර්මික අපනයන ඉහළ නැංවීම සඳහා ඉවහල් වන, නිෂ්පාදන අංශයේ නිමැවුම් වැඩිදියුණු කිරීම ඉලක්ක කරගත් ගෝලීය අගය දාම සමග ඒකාබද්ධ වූ, මනාව සම්බන්ධීකරණය කරන ලද කාර්මික ප්‍රතිපත්ති රාමුවක් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.** 1990 දශකයේ දී අනුගමනය කරන ලද කාර්මික ප්‍රතිපත්ති මගින් සමස්ත අපනයන තුළ නිෂ්පාදන අංශයේ භාණ්ඩවල දායකත්වය සැලකිය යුතු ලෙස වර්ධනය කර ගැනීමට ශ්‍රී ලංකාවට හැකි වුවද, එම අංශයෙහි නිෂ්පාදන විවිධාංගීකරණයේ දී හා ශ්‍රමය පදනම් වූ නිෂ්පාදනවල සිට අධි-තාක්ෂණික නිෂ්පාදන අංශයේ අපනයන කරා ගමන් කිරීමේ දී තරමක් අසාර්ථක වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, මෑතකාලීන වශයෙන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදන අංශයෙහි අපනයන ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා ඇඟලුම් මත පදනම් වන අතර, අපනයන අංශය තුළ විශේෂයෙන්ම, නිෂ්පාදන අපනයන වර්ධනය අසතුටුදායක මට්ටමක පවතී. ශ්‍රී ලංකාවේ කාර්මික ප්‍රතිපත්ති, ප්‍රධාන වශයෙන්ම අපනයන වෙළඳපොළ සඳහා අවසාන භාණ්ඩ සැපයීම ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කර තිබුන ද, ගෝලීය ප්‍රවණතා මේ වන විට වෙනස් වී ඇත. ගෝලීය ප්‍රවණතාව වනුයේ දේශ සීමා හරහා සිදුවන වෙළඳාම හා නිෂ්පාදනය තුළ ගෝලීය නිෂ්පාදන ජාල ප්‍රමුඛස්ථානයක් ගෙන තිබීමයි. එමගින් සාපේක්ෂ පිරිවැය වාසි මත පදනම්ව නිෂ්පාදන ක්‍රියාවලියේ විවිධ අදියර තුළ විශේෂීකරණය වීමට රටවලට ඉඩ ප්‍රස්ථා සැලසී ඇත. කලාපීය තරගකරුවන් වන විශේෂයෙන්ම චීනය, තායිවානය, දකුණු කොරියාව, තායිලන්තය, මලයාසියාව, වියට්නාමය හා ඉන්දුනීසියාව වැනි නැගෙනහිර හා අග්නිදිග ආසියානු රටවල් ගෝලීය නිෂ්පාදන ජාල හරහා ඔවුන්ගේ නිෂ්පාදන අංශයෙහි අපනයන සැලකිය යුතු ලෙස වර්ධනය කරගෙන ඇත. සාම්ප්‍රදායිකව ශ්‍රම සූක්ෂම නිෂ්පාදන අංශයෙහි අපනයන මත පදනම් වූ ඉන්දියාව, දත්ත සැකසුම් යන්ත්‍ර, විද්‍යුත් උපකරණ හා අර්ධ-සන්නායක උපාංග සඳහා අවශ්‍ය තාක්ෂණික උපාංග හා කොටස් නිපදවමින් ගෝලීය නිෂ්පාදන ජාලයන්ට සාර්ථකව සම්බන්ධ වී ඇත. කෙසේ වෙතත්, මෙම කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන අපනයනවලින් සුළු කොටසක් පමණක් ගෝලීය නිෂ්පාදන ජාලවලට සම්බන්ධ වී ඇත. එමනිසා, දේශීය නිෂ්පාදන අංශය කලාපීය හා ගෝලීය නිෂ්පාදන ජාල සමඟ ඒකාබද්ධ වීම සඳහා පහසුකම් සැපයෙන පරිදි ශ්‍රී ලංකාව සිය කාර්මික ප්‍රතිපත්තිය සංශෝධනය කළ යුතු වේ. ඒ අනුව, ගෝලීය නිෂ්පාදන ජාල සමග වැඩි වශයෙන් ඒකාබද්ධ වී ඇති රටවල් සමග වෙළඳ ගිවිසුම්වලට එළැඹීම සහ රටවල් අතර වෙළඳාම ප්‍රවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන තීරුබදු නොවන අනෙකුත් බදු සම්බාධක ඉවත් කිරීම සහ ගෝලීය නිෂ්පාදන ජාල හා සම්බන්ධ වීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රයත්නයට අනුබල සැපයෙන පරිදි දේශීය නිෂ්පාදන පිරිවැය අඩු කිරීම අවශ්‍ය වේ. තවද, අපනයනික නිෂ්පාදන අංශය තුළ ඉහළ යන ඉල්ලුම සපුරා ගැනීම සඳහා අවශ්‍ය මානව සම්පත ප්‍රමාණවත් ලෙස පුහුණු කළ යුතුය. කාර්මික ප්‍රතිපත්ති, යටිතල පහසුකම් සංවර්ධනය සමඟ මනා ලෙස ඒකාබද්ධ විය යුතුය. මීට අමතරව, ගෝලීය වශයෙන් නිෂ්පාදන හුවමාරු කර ගැනීම සඳහා දේපළ අයිතිය තහවුරු කිරීම සහ ගිවිසුම් බලාත්මක ශක්තිමත් කිරීම යනාදිය අවශ්‍ය වේ (විශේෂ සටහන 03 : '*නිෂ්පාදන කර්මාන්ත අංශය සංවර්ධනය කිරීමේ උපායමාර්ගයක් කරා*' බලන්න).

**ශ්‍රී ලංකාවේ සමස්ත ශ්‍රම බලකායෙන් අසමානුපාතික ලෙස විශාල ප්‍රතිශතයක් කෘෂිකර්මය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නිරත වන අතර, එම අංශය ඵලදායීතාව අඩු වීම, විවිධාංගීකරණය අඩු මට්ටමක පැවතීම, ඉඩම් කට්ටි කිරීම, අකාර්යක්ෂම ජල කළමනාකරණය, දුර්වල ගබඩාකරණ හා වෙළඳපොළ යාන්ත්‍රණ මෙන්ම කාලගුණික වෙනස්කම් ආශ්‍රිත ගැටලු ආදිය හේතුවෙන් බලපෑමට ලක්වී ඇත.** පොහොර සහනාධාර ලබාදීම, නොමිලේ ජලය සැපයීම, අවම ගොවිපොළ මිල ගණන් හා ඉහළ ආනයන බදු පැනවීම

හරහා කෘෂිකාර්මික අංශය සම්බන්ධව ආරක්ෂණවාදී ප්‍රතිපත්තියක් අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ. මෙම ප්‍රතිපත්තිය මගින් වඩාත් ඵලදායී වගා සඳහා වන විවිධාංගීකරණය වළක්වනු ලබන අතර, ආර්ථිකයේ වෙනත් ඵලදායී අංශ වෙත ගොවීන් යොමු වීම අධෛර්යවත් කර ඇත. පොහොර සහනාධාර වැනි කෘෂිකාර්මික සහනාධාර, රාජ්‍ය මූල්‍යමය වශයෙන් අකාර්යක්ෂම වන අතර පාරිසරික වශයෙන් තිරසාර නොවන හා ආර්ථික වශයෙන් අකාර්යක්ෂම වේ. ඒ වෙනුවට, කෘෂිකාර්මික අංශයෙහි ඵලදායීතා මට්ටම් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය උචිත ආයතනික පහසුකම් හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ විශේෂයෙන්ම වී වගා අංශය සඳහා කාර්යක්ෂම අලෙවිකරණ යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. කේවල් කිරීමේ ශක්තිය වැඩිදියුණු කිරීම, ගොවි සංවිධාන සතු හා ඔවුන් විසින් මෙහෙයවනු ලබන සැකසුම් පහසුකම් ස්ථාපිත කිරීමට සහ ඔවුන්ගේ අවසාන නිමැවුම් කාර්යක්ෂමව අලෙවි කර ගැනීම සඳහා ගොවි සංවිධාන ශක්තිමත් කිරීම සිදු කළ යුතු වේ. කෘෂිකාර්මික අංශයේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා පර්යේෂණ දැනුම ගොවීන්ගේ දැනුම බවට පත් කිරීම මූලික අවශ්‍යතාවක් වේ. තවද, තේ, රබර් හා පොල් ඇතුළුව සියලු පර්යේෂණ ආයතනවල ව්‍යාප්ති සේවා වැඩිදියුණු කිරීම කළ යුතුය. එවැනි සේවා හරහා කෘෂිකාර්මික අතුරු නිෂ්පාදනවල විකල්ප ප්‍රයෝජන පිළිබඳ දැනුම බෙදාහරිනු ලබන අතර, පලිබෝධ නාශකවලින් තොර හා අඩු පොහොර භාවිතයක් සහිත කාබනික වගා ශිල්ප ක්‍රම ප්‍රවර්ධනය කළ යුතුය. ගොවීන්ගේ මට්ටමේ දී පමණක් නොව සමස්ත අගය දාමයෙහිම ඵලදායීතාව වැඩිදියුණු කිරීම සඳහා කෘෂිකාර්මික ප්‍රතිපත්ති යොදාගත යුතු අතර, එමගින් කෘෂිකාර්මික අංශයේ එකතු කළ අගය ඉහළ නංවනු ඇත. මේ සඳහා, පර්යේෂණ ආයතන, ව්‍යාප්ති සේවා හා ගොවීන් අතර වන ඒකාබද්ධ වැඩපිළිවෙළක් තුළින් ගබඩා පහසුකම් වැඩිදියුණු කිරීම, කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා සැකසුම් යාන්ත්‍රණ වැඩිදියුණු කිරීම හා පසු-අස්වනු අපතේ යෑම් අවම කිරීම අත්‍යවශ්‍ය වේ. තවද, සාධාරණ පොලී අනුපාතික යටතේ විධිමත් මූල්‍ය අංශයෙන් ණය ලබා ගැනීමට ගොවීන්ට ඇති ඉඩකඩ ඉහළ නැංවීමට පවතින ප්‍රතිපත්ති තවදුරටත් ශක්තිමත් කිරීම සිදු කළ යුතුය. අගය එකතු කිරීම, අලුත් යාන්ත්‍රණ හා ශක්තිමත් අලෙවිකරණ උපායමාර්ග, කෘෂිකාර්මික අපනයන ඉහළ නැංවීම සඳහා අත්‍යවශ්‍ය වේ. තවද, කෘෂිකර්මය හා ආහාර සුරක්ෂිතතාව කෙරෙහි බලපාන කාලගුණික වෙනස්වීම්වල අහිතකර ප්‍රතිවිපාක අඩු කිරීම සඳහා වූ දිගුකාලීන දැක්මකින් යුතුව, සියලු අංශ සඳහා තිරසාර පාරිසරික ප්‍රතිපත්ති සහ පරිචයන් සඳහා ප්‍රමුඛතාව දිය යුතු වේ.

**රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය සඳහා රජයේ දැඩි කැපවීම මධ්‍යයේ වුවද, රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයේ ව්‍යුහාත්මක දුර්වලතා කිහිපයක් දැකිය හැකිය.** රජයේ පුනරාවර්තන වියදම පියවා ගැනීමටවත් ප්‍රමාණවත් නොවන රාජ්‍ය ආදායම් රැස්කිරීමේ දුර්වල කාර්යසාධනය ප්‍රධානතම අභියෝගය බවට පත්ව ඇත. මෑතකාලීන වර්ධනයන් හැරුණු කොට, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම් රැස්කිරීම පහළ මට්ටමක පැවතීම කෙරෙහි බදු පරිපාලනයෙහි ඇති දුර්වලතා, බදු පැහැර හැරීම් සහ බදු නිදහස් කිරීම් ආදිය හේතුවෙන් බදු රැස්කිරීමේ පවතින දුර්වලතා විශාල වශයෙන් හේතු වී ඇත. වියදම් අංශය සලකා බැලීමේදී, පුනරාවර්තන වියදමෙන් තුනෙන් දෙකකටත් වඩා වැඩි ප්‍රමාණයක් පොලී ගෙවීම් සහ වැටුප් හා වේතන වියදම් සඳහා වැය කරනු ලබයි. තවදුරටත්, පැවරුම් හා සුභසාධන වියදම් ඉහළ මට්ටමක පැවතීම අඛණ්ඩව රජයේ අයවැය මත පීඩනයක් ඇති කරනු ලබයි. මෙම ප්‍රවණතා හේතුවෙන් රජයේ හදිසි ප්‍රමුඛතා සඳහා ඉඩ සැලසීමට පවතින රාජ්‍ය මූල්‍ය අවකාශය සීමිත වන අතර, එමගින් පවතින සමාජ ආර්ථික වාතාවරණය තුළ නව අභියෝග ඇති කෙරේ. අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය තුළ අවශ්‍යතා ප්‍රමුඛතාගත කිරීම හෝ කපා හැරීම සිදු නොකළහොත් ආර්ථිකයේ පැන නගින අවශ්‍යතා හේතුවෙන් අයවැය මත තවදුරටත් පීඩනයක් ඇති විය හැකිය. රාජ්‍ය මූල්‍ය ඉලක්ක අපේක්ෂිත මට්ටමෙන් විතැන් වීම තුළින් ආදායම අඩුවීම, වියදම ඉක්මවා යෑම, ඉහළ අයවැය හිඟය, රජයේ ණය හා ණය සේවාකරණ ගෙවීම් ඉහළ යෑම සහ රාජ්‍ය ආයෝජන සඳහා වන වියදම පහළ යෑම වැනි විෂම චක්‍රීය ප්‍රතිවිපාක ඇති වෙයි. එමනිසා, මෑතකාලීන ප්‍රතිපත්ති ප්‍රකාශවල සඳහන් කර ඇති පරිදි, අයවැය කටයුතු පිළිබඳ ප්‍රතිසංස්කරණ නිසි කලට සිදු කිරීම, රජයට මෙම විෂම චක්‍රයෙන් මිදීම සඳහා ඉවහල් වේ. ඉහළ යමින් පවතින විදේශ වාණිජ ණය තොගය මගින් ද විචක්ෂණශීලී සහ ඉදිරි දැක්මකින් යුත් ණය කළමනාකරණ ක්‍රියාවලියක් ඇති කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරයි.

**අඩු මට්ටමක පවතින බදු අනුකූලතාව සහ බදු පදනම පටුවීම හේතුවෙන් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රජයේ ආදායම සාපේක්ෂව අඩුවීමේ තත්ත්වයක් තුළ, බදු දැල තුළට අවිධිමත් ආර්ථිකය අන්තර්ගත කිරීම සහ ඍජු බදුකරණය ඉහළ නැංවීම අරමුණු කරගත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තුළින් දිගුකාලීන වශයෙන් සැලකිය යුතු ප්‍රතිලාභ ලැබිය හැකිවේ.** වර්තමානයේ මුළු බදු ආදායමෙන් සියයට 80 කටත් වැඩි ප්‍රමාණයක් එකතු කළ අගය මත බදු සහ ආනයන බදු වැනි වක්‍ර බදුවලින් සමන්විත වේ. වක්‍ර බදු හේතුවෙන් වෙළඳපොළ බලවේග තුළින් සිදු වන

විශේෂ සටහන 2

## ගෝලීය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ තරගකාරිත්වය වැඩිදියුණු කිරීම

### වර්තමාන වාතාවරණය තුළ ශ්‍රී ලංකාවේ බාහිර තරගකාරිත්වය

වඩා තරගකාරී වූ ගෝලීය වෙළඳපොළක් තුළ, යම් රටක තරගකාරිත්වය ප්‍රධාන වශයෙන්ම රඳා පවතිනුයේ ගෝලීය අගය දාමයෙහි ස්ථානගත වීමට එරටට ඇති හැකියාව සහ භාණ්ඩ හා සේවා වෙළඳාම, ආයෝජන සහ මානව ප්‍රාග්ධනය යන අංශ තුළ වැඩි කොටසක් අත්කර ගැනීම පිණිස සාර්ථකව තරග කිරීමට ඇති හැකියාව වැනි ඉහළ වර්ධන ප්‍රවණතාවක් පවත්වා ගැනීම සඳහා තීරණාත්මකව බලපාන සාධක මතය. ලෝකයේ රටවල් වඩා අභියෝගාත්මක වූත්, අසීරු වූත් ගෝලීය වෙළඳපොළක් තුළ තරග කරන වාතාවරණයක් තුළ, රටක බාහිර තරගකාරිත්වය, දියුණු රටවල මෙන්ම නැගී එන වෙළඳපොළ ආර්ථිකයන්හි ද අර්ථශාස්ත්‍රඥයන් හා ප්‍රතිපත්ති සම්පාදකයන් අතර සාකච්ඡාවට බඳුන් වූ ප්‍රධාන මාතෘකාවක් බවට පත්ව ඇත. ලෝක ආර්ථික සමුළුව විසින් නිර්වචනය කරන ආකාරයට රටක තරගකාරිත්වය යනු ‘‘රටක ඵලදායීතා මට්ටම තීරණය කරනු ලබන ආයතන, ප්‍රතිපත්ති හා සාධක සමූහය’’ යි. ආර්ථික වර්ධනය පිළිබඳව ඉදිරිපත් කර ඇති ආකෘති මගින් රටක හා එහි පුරවැසියන්ගේ දිගුකාලීන සෞභාග්‍ය මට්ටම තීරණය කරනු ලබන වඩාත්ම වැදගත් සාධකය ලෙස ඵලදායිතාව හඳුනාගෙන ඇත.[1]

දශක තුනක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ පැවති අභ්‍යන්තර ගැටුම්කාරී වාතාවරණය රටේ තරගකාරිත්වය කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කළ අතර, අභ්‍යන්තර ගැටුම් අවසන් වී වසර ගණනාවකින් පසුව ද, කැපී පෙනෙන වර්ධනයක් නොමැති විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය හා අඩු ඵලදායී වර්ධන තත්ත්වය හමුවේ ශ්‍රී ලංකා ආර්ථිකයට එහි උපරිම ධාරිතාවට ළඟා වීමට නොහැකි වී ඇත. පසුගිය කාලයේ දී ආර්ථිකයේ ඇති වූ ඉහළ වර්ධනය, තිරසාර හා සමානාත්මක නොවන ආකාරයට සිදු කෙරුණු රාජ්‍ය අංශයේ පරිභෝජන සහ ආයෝජනවල සමස්ත ප්‍රතිඵලයක් ලෙස වෙළඳ භාණ්ඩ නොවන අංශ (ප්‍රධාන ලෙසම ඉදිකිරීම් හා දේපළ වෙළඳාම් අංශ) ඔස්සේ අත්කර ගන්නා ලද්දකි. 1970 දශකයේ අග භාගයේ දී ශ්‍රී ලංකාව ආසියානු කලාපය තුළ වඩාත්ම විවෘත ආර්ථිකයන්ගෙන් එකක්ව පැවතිය ද, පසුව බලයට පත් රජයන්ගේ අභ්‍යන්තරාභිමුඛ දැඩි වෙළඳ ප්‍රතිපත්ති ස්ථාවරය හේතුවෙන්, අඩු එකතු කළ අගයක් හා ශ්‍රම සූක්ෂ්ම නිෂ්පාදන සහිත සාම්ප්‍රදායික නිෂ්පාදන පැසක් වෙතින් බැහැර නොවීම නිසා ශ්‍රී ලංකාවට වෙනත් අඩු වියදමින් නිෂ්පාදනය කරන රටවල් සමඟ දැඩි තරගයකට මුහුණ පෑමට සිදු වී ඇත. අපනයන සඳහා තාක්ෂණය අඩුවෙන් භාවිත කිරීමේ සහ අඩු කුසලතාවකින් නිපදවිය හැකි භාණ්ඩ අපනයනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ උගත් ශ්‍රම බලකාය ඌන උපයෝජනයකට ලක් වී ඇත. බදු සහන සහ පිරිවැය පිහිටාධාර ඇතුළු රජය මගින් ගනු ලැබූ උපායමාර්ග, විදේශීය සෘජු ආයෝජන සහ අපනයන සඳහා ගමනාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාවට අඛණ්ඩව සාර්ථක වීම උදෙසා ඵලදායීව දායක වී නොමැත.

වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ ආයෝජන වාතාවරණය දුර්වල වීමට ප්‍රතිපත්තිවල අවිනිශ්චිතභාවය, දුර්වල නියාමනය සහ දූෂණය වැනි ආයතනික ව්‍යුහයේ පවත්නා දුර්වලතා සහ යටිතල පහසුකම් වැඩිදියුණු නොවීම වැනි සාධක ගණනාවක් බලපා ඇත.[2] මෙහි ප්‍රතිඵලයක් ලෙස සම මට්ටමේ පහළ මැදි ආදායම් ආර්ථිකයන්ට සාපේක්ෂව ශ්‍රී ලංකාව ආකර්ෂණය කර ගන්නා විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස ගත් විට අඩු අගයක පවතී. මෙහි අවසන් ප්‍රතිඵල වූ, ස්ථාපිත සමාගම්වල වර්ධන විභවතාව, නවෝත්පාදන හා ඵලදායිතාව සීමාසහිත වීම සහ අලුතින් කර්මාන්ත ආරම්භ කිරීම අධෛර්යවත් වීම රටේ ජාත්‍යන්තර තරගකාරිත්වයට බාධා පමුණුවයි. සාර්ව ආර්ථික අසමතුලිතතා, විදේශීය ආයෝජන සිදු කිරීමේ දී මුහුණ දීමට සිදුවන නෛතික හා කාර්ය පටිපාටිමය බාධක, නෛතික හා නියාමන රාමුවල අනුකූලතාව අඩු බව සහ විදේශීය ආයෝජන ආකර්ෂණය, රඳවා ගැනීම හා ඒකාබද්ධ කිරීම සඳහා මනාව සම්බන්ධීකරණය කරන ලද යාන්ත්‍රණයක් නොමැති වීම යනාදි කරුණු තුළින් ශ්‍රී ලංකාවට වේගයෙන් පුළුල් වන ජාත්‍යන්තර වෙළඳාමේ ඵල මුළුමනින්ම අත්කර ගැනීමට ඇති හැකියාවට දිගින් දිගටම බාධා එල්ල වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මෙරටට හිමි වෙළඳපොළ පදනම අනෙකුත් තරගකාරී රටවලට හිමිවනු ඇත.


ලෝක ආර්ථික සමුළුවේ 2016/17 ගෝලීය තරගකාරිත්ව දර්ශකයට අනුව රටවල් 138 ක් අතුරින් ශ්‍රී ලංකාව 71 වැනි ස්ථානයට ශ්‍රේණිගත කර ඇති අතර, එය 2015/16 ගෝලීය තරගකාරිත්ව දර්ශකයේ ශ්‍රේණිගත කිරීම අනුව හිමි කර ගත් තත්ත්වයේ සිට ස්ථාන තුනක පහත වැටීමක් විය. එසේ වුව ද, ඉන්දියාව, මලයාසියාව හා සිංගප්පූරුව වැනි කලාපයේ අනෙකුත් ආර්ථිකයන් පසුගිය දශක කිහිපයේදීම ඔවුන්ගේ ගෝලීය තරගකාරිත්වය ඉහළ නංවාගැනීම සම්බන්ධව කැපීපෙනෙන දියුණුවක් ළඟා කර ගෙන ඇති අතර, 2016/17 ගෝලීය තරගකාරිත්ව දර්ශකයේ ශ්‍රේණිගත කිරීම අනුව පිළිවෙළින් 39 වැනි, 25 වැනි හා 2 වැනි

1 ලෝක ආර්ථික සමුළුව සහ හාවඩ් විශ්වවිද්‍යාලය. (1996). ගෝලීය තරගකාරිත්ව වාර්තාව. ජිනීවා: ලෝක ආර්ථික සමුළුව

2 ලෝක බැංකුව. (2016). ශ්‍රී ලංකාවේ තරගකාරිත්වය ඉහළ නැංවීම. ලෝක බැංකුව, වොෂිංටන්, ඩී.සී. https://openknowledge.worldbank.org/handle/10986/24927

**රූප සටහන වි.ස. 2.1**

**රටවල් කිහිපයක තරගකාරිත්වය සංසන්දනය ගෝලීය තරගකාරිත්ව දර්ශකය 2016/17**




සටහන : පහළ අගයන් මගින් අඩු තරගකාරිත්වය දැක්වේ.


මූලය : ගෝලීය තරගකාරිත්ව දර්ශකය, ලෝක ආර්ථික සමුළුව

ස්ථානවලට පත්ව ඇත. පකිස්ථානය, බංග්ලාදේශය, නේපාලය හා භූතානය වැනි අනෙකුත් කලාපීය අසල්වාසී රටවල් පිළිවෙළින් 122 වැනි, 106 වැනි, 98 වැනි හා 97 වැනි ස්ථානවලට පත්ව ඇත. රූප සටහන වි.ස. 2.1 මගින් සිංගප්පූරුව, මලයාසියාව හා ඉන්දියාව යනාදි ප්‍රමුඛ පෙළේ රටවල්වලට සාපේක්ෂව ප්‍රධාන තරගකාරිත්ව නිර්ණායක 12 ක් යටතේ ශ්‍රී ලංකාවේ කාර්ය සාධනය ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකාව අපේක්ෂා කරන ආර්ථික විවිධාංගීකරණ මට්ටමට ළඟා වීම සඳහා විදේශීය ඍජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමෙහි අත්‍යවශ්‍යභාවය සැලකූ විට, ශ්‍රී ලංකාවට විදේශීය ඍජු ආයෝජන ආකර්ෂණය කර ගන්නා ප්‍රධාන රටක් ලෙස නැගී සිටීමට හැකිවන ආකාරයේ ශක්තිමත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවක් පවතී. කෙසේ වෙතත්, සියලුම විදේශීය ඍජු ආයෝජන එක හා සමාන නොවන අතර, එමගින් ආර්ථිකය මත ඇති වන ඍජු හා වක්‍ර බලපෑම්වල සැලකිය යුතු වෙනස්කම් පවතී. එබැවින්,

**රූප සටහන වි.ස. 2.2**

**ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පවත්වාගෙන යෑමට ඇති බාධක**




මූලය : ව්‍යාපාරික මත පිළිබඳ සමීක්ෂණය 2016, ලෝක ආර්ථික සමුළුව

ශ්‍රී ලංකාව වෙත විදේශීය ඍජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා සකස් කෙරෙන ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග, රටට අවශ්‍ය කුමන ආකාරයේ විදේශීය ඍජු ආයෝජන ද යන්න පිළිබඳ පැහැදිලි දැක්මක් සහිතව සකස් කළ යුතුය. කෙසේ වුව ද, ස්ථාවර පදනමක් නොමැති පසුබිමක ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා ප්‍රයත්න දැරීම පමණක් ප්‍රමාණවත් නොවේ. යටිතල පහසුකම් යහපත් මට්ටමක පැවතීම හා ගෝලීය වෙළඳපොළට සම්බන්ධ වීමට ඇති හැකියාවට අමතරව, ආයෝජකයන් විසින් තම ආයෝජන සිදු කරන රටෙහි සාර්ව ආර්ථික සහ දේශපාලන ස්ථාවරත්වය හා බැඳි ස්ථාවර ආයෝජන වාතාවරණයක් ද අපේක්ෂා කරනු ලැබේ. 2016/17 ගෝලීය තරගකාරිත්ව දර්ශක වාර්තාව තුළ, ව්‍යාපාර ප්‍රජාව විසින් මෙරටෙහි තරගකාරිත්වය කෙරෙහි ඇති බාධක ලෙස හඳුනාගත් සාධක, රූප සටහන වි.ස. 2.2 මගින් නිරූපණය කෙරෙයි. එබැවින්, ශ්‍රී ලංකාවට විදේශීය ඍජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම හා රඳවා ගැනීම සඳහා රට තුළ ආයෝජන අවස්ථා පුළුල් කිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිවල ප්‍රමුඛතා අනුපිළිවෙළ තීරණය කිරීම පිණිස විදේශීය ආයෝජකයන් විසින් හඳුනා ගෙන ඇති මෙම සාධක යොදාගත හැකිය.

**ශ්‍රී ලංකාවේ තරගකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා ගත යුතු පියවර**

වර්තමානයේ දී ශ්‍රී ලංකාවට 'පහළ මැදි ආදායම් ලබන ආර්ථිකයක' තත්ත්වයේ සිට 'ඉහළ මැදි ආදායම් ලබන ආර්ථිකයක' තත්ත්වය දක්වා සැලකිය යුතු කාල පමාවකින් තොරව ප්‍රවිෂ්ට වීම සඳහා, මෙරට තරගකාරිත්වය වර්ධනය කර ගැනීම අරමුණු කර ගත් ප්‍රතිපත්තිමය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ පුළුල් අවශ්‍යතාවක් පවතී. ගෝලීය තරගකාරිත්ව දර්ශකවලට අනුව ශ්‍රී ලංකාවේ කාර්ය සාධනය විශ්ලේෂණය කිරීමේ දී, රටෙහි බාහිර තරගකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ පහත දැක්වෙන කරුණු ප්‍රමුඛ ප්‍රතිපත්ති ලෙස හඳුනාගෙන ඇත.

1. **ස්ථාවර ජාතික සංවර්ධන ප්‍රතිපත්තියක අවශ්‍යතාව**

සංවර්ධනය වෙත නැඹුරු වූ ස්ථාවර ජාතික ප්‍රතිපත්තියක් පැවතීම හේතුවෙන් දියුණු සහ නැගී එන ආර්ථිකයන් ගණනාවකටම විදේශීය ඍජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම හා ජාත්‍යන්තර වෙළඳාමෙන් සැලකිය යුතු කොටසක් අත්කර ගැනීම හරහා ගෝලීය වෙළඳපොළ තුළ සාර්ථකව තරග කිරීමට හැකියාව ලැබී ඇත. කෙසේ වුව ද, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සැලකීමේ දී, සියලු දෙනා එකඟ වූ ජාතික සංවර්ධන ප්‍රතිපත්තියක් රටට නොමැති වන්නේ දේශපාලන පක්ෂවල න්‍යාය පත්‍රවලට අනුව කලින් කලට ජාතික සංවර්ධන ප්‍රතිපත්ති වෙනස් වන බැවිනි. එබැවින්, ගෝලීය වෙළඳපොළ තුළ තරග කිරීම සඳහා, බලයට පත්වන රජයන්ගේ දේශපාලන ප්‍රතිපත්තිවලට ස්වාධීනව, ස්ථාවරභාවයෙන් හා විනිවිදභාවයෙන් යුතු දිගුකාලීන


1

ප්‍රතිපත්ති සැකසීමට සහ ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. ප්‍රතිත්තිමය අස්ථාවරභාවය මගින් වෙළඳපොළ අවදානම් තත්ත්වය ඉහළ නංවන අතර, එමගින් ආයෝජකයන්ගේ විශ්වාසය පලුදු විය හැකිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, විදේශීය ඍජු ආයෝජන ලැබීම පහළ යා හැකි අතර, පෞද්ගලික අංශය විසින් කරන දේශීය ආයෝජන ද අඩු වනු ඇත. එබැවින්, දේශීය ආර්ථිකය පිළිබඳ ආයෝජකයන්ගේ විශ්වාසය ගොඩනැගීම සඳහා අතීතයේ පැවතුණු කඩින් කඩ ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති සහිත සංස්කෘතියෙන් ඉවත් වීම වැදගත් වන අතර, ඒ වෙනුවට පැහැදිලි ජාතික සංවර්ධන ප්‍රතිපත්තියක් දැඩි කැපවීමකින් ක්‍රියාවට නැංවිය යුතුව ඇත.

2. යටිතල පහසුකම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම

මෑත කාලයේ දී ශ්‍රී ලංකාව සිය යටිතල පහසුකම් පදනමෙහි සැලකිය යුතු වර්ධනයක් අත්කර ගෙන ඇත. කෙසේ වුව ද, ඉදිරියේ දී මෙරට ආයෝජනය කිරීමට අපේක්ෂා කරන්නන් විසින් යටිතල පහසුකම් මගින් සපයනු ලබන සේවාවල ගුණාත්මකභාවය පිළිබඳ වැඩි සැලකිල්ලක් දක්වන බැවින්, හුදෙක් යටිතල පහසුකම් පදනම වැඩිදියුණු කිරීම පමණක් තරගකාරිත්වය ඉහළ දැමීමට ප්‍රමාණවත් නොවනු ඇත. උදාහරණ වශයෙන්, ශ්‍රී ලංකාව සැලකිය යුතු ඉහළ විදුලිබල සැපයුම් මට්ටමකට ළඟා වී සිටිය ද, විදුලිබල සැපයුමෙහි ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ගැටලු පවතින අතර, විදුලිය සඳහා තරගකාරී ලෙස මිල නියම කිරීමක් ද සිදු වී නොමැත. 2014 වසරේ දී සේවා සැපයුම් කාර්ය සාධන දර්ශකයට අනුව (රූප සටහන වි.ස. 2.3 බලන්න) කලාපයේ සම මට්ටමේ රටවල් හා සැසඳීමේ දී ශ්‍රී ලංකාවට පහළ ශ්‍රේණිගත කිරීමක් හිමිව ඇත. මෙමගින් වත්මන් යටිතල පහසුකම් පදනමෙහි පවතින අඩුපාඩු පෙන්නුම් කෙරෙයි. යටිතල පහසුකම්වල ගුණාත්මකභාවය සහ පිරිවැය සිය ලාභයට බලපාන බැවින් රට තුළ ආයෝජනය කිරීමට අපේක්ෂා කරන ආයෝජක ප්‍රජාව තම ආයෝජන තීරණ ගැනීමේ දී එවැනි ශ්‍රේණිගත කිරීම් කෙරෙහි අවධානය යොමු කරති. දේශීය නිෂ්පාදකයන් ද මෙම අපහසුතා අත් විඳින අතර, එහි ප්‍රතිඵලයක් ලෙස යටිතල පහසුකම් සඳහා පහසුවෙන් ප්‍රවේශ විය හැකි බස්නාහිර පළාත තුළ මූලික වශයෙන්ම තම ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යෑම කෙරෙහි ඔවුහු සිය අවධානය යොමු කරති. යටිතල පහසුකම්, රටක තරගකාරිත්වයේ ප්‍රධාන සාධකයක් වන බැවින් පුළුල් ජාතික සංවර්ධන ප්‍රතිපත්තිය අනුව යමින් බස්නාහිර පළාත තුළ මෙන්ම ඉන් පිටත ද යටිතල පහසුකම් හා සම්බන්ධ සේවාවන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීම කෙරෙහි රජය සිය අවධානය යොමු කළ යුතුය.

රූප සටහන වි.ස. 2.3
සේවා සැපයුම් කාර්ය සාධන දර්ශකය (2014)




සටහන : පහළ අගයන් මගින් අඩු කාර්ය සාධනය දැක්වේ.

මූලය : කාර්ය සාධන දර්ශකය 2014, ලෝක බැංකුව

3. නිලධාරිවාදී සීමා කිරීම්


නිලධාරිවාදී සීමා කිරීම් නිරතුරුවම පෞද්ගලික අංශයේ ව්‍යාපාර ඵලදායී ලෙස පවත්වාගෙන යෑම සඳහා බාධාවක් ලෙස සැලකේ. එබැවින්, පෞද්ගලික අංශය මගින් සිය ව්‍යාපාරික තීරණ ගැනීමේ දී අනුකූලතා පිරිවැය පිළිබඳව වැඩි සැලකිල්ලක් දක්වන නිසා, රජය විසින් නිලධාරිවාදී සීමා කිරීම් අඩු කිරීම හරහා පෞද්ගලික අංශය වෙත පහසුකම් සැලසිය යුතුව ඇත. සමාන තත්ත්වයක් පවතින කලාපීය රටවල් හා සසඳන විට නව ව්‍යාපාර ඇරඹීමේ දී, ගිවිසුම් බලගැන්වීමේ දී, දේපළ ලියාපදිංචි කිරීමේ දී හා ණය ලබාගැනීමේ දී පවතින අධික නිලධාරිවාදී ක්‍රියාපටිපාටි හේතුවෙන් 'ව්‍යාපාර පවත්වාගෙන යාමේ දර්ශකය' තුළ ශ්‍රී ලංකාව සැලකිය යුතු අවාසිදායක තත්ත්වයකට පත්ව ඇත. තවද, විවිධ රෙගුලාසි සහ අනුකූලතාව දැක්වීම හා බැඳුනු ඉහළ පිරිවැය හේතුවෙන් නව සමාගම් බිහිවීම අධෛර්යවත් වීම, පවතින සමාගම්වල වර්ධනය සීමා වීම, අවිධිමත්ව ක්‍රියාත්මක වීමට ව්‍යවසායකයන් නැඹුරු වීම, මූල්‍යන හා ව්‍යාපාර ක්‍රියාවලීන්ට ප්‍රවේශ වීම සීමා කිරීම සහ නාස්තිය හා දූෂණය ආදියට මග සැලසේ. පවතින ක්‍රියාපටිපාටි සහ ඒ හා බැඳුණු පද්ධති සරල කිරීම මගින් ජාත්‍යන්තර මට්ටමේ ව්‍යාපාර බවට පරිවර්තනය වීමේ හැකියාවකින් සහ නව්‍යතාවකින් යුතු ව්‍යාපාර ආරම්භ කිරීමට ව්‍යවසායකයන් දිරිමත් වනු ඇත. විශේෂයෙන්ම බදු පරිපාලනය හා රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් රජය හිතකර පියවර රැසක් ගෙන තිබුණ ද, රටෙහි නෛතික හා බදු පරිසරය තුළ වේගවත් ප්‍රතිසංස්කරණ තවදුරටත් අවශ්‍යව ඇත.

4. පර්යේෂණ හා සංවර්ධනය සහ නවෝත්පාදනය

නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය, රටක තරගකාරිත්වය ඉහළ නංවන ප්‍රධාන සාධක ලෙස දැක්විය හැක. ඒ අනුව, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ යන

**රූප සටහන වි.ස. 2.4**

**2016 වසරේ තෝරාගත් රටවල්වල ව්‍යාපාරකරණ ශ්‍රේණිගත කිරීම්**




සටහන : ඉහළ ශ්‍රේණිගත කිරීම් මගින් දුර්වල ව්‍යාපාර කරන තත්ත්වයන් දැක්වේ.

මූලය : ලෝක බැංකු ව්‍යාපාරකරණය, 2016

දෙඅංශය තුළම ඉහළ අගය එකතු කිරීමකින් යුතු භාණ්ඩ හා සේවා සාර්ථකව නිපැයීමට හා අලෙවි කිරීමට හැකි, දැනුම පාදක කරගත් ව්‍යවසායයන් ධෛර්යවත් කිරීමට ශ්‍රී ලංකාව කටයුතු කළ යුතුය. මේ සඳහා, ශ්‍රී ලංකාවේ (i) අපනයනාභිමුඛ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නඟා සිටුවීම, (ii) ආර්ථික වර්ධනය අරමුණු කරගත් නව ව්‍යාපාර පිහිටුවීම හා වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සහ (iii) පර්යේෂණ හා සංවර්ධන අංශ යාවත්කාලීන කිරීම සහ ප්‍රතිසංවිධානය කිරීම යනාදිය සඳහා වූ ප්‍රතිපත්ති වැදගත් වේ. මෙම උපායමාර්ග තුන සඳහා එකිනෙකට සුවිශේෂී මෙන්ම එකිනෙකට අනුපූරක වන, ගෝලීය ආර්ථිකය තුළ සිටින තරගකරුවන් අතර ලංකාවේ තරගකාරිත්වය ඉහළ නංවාලන ආර්ථිකය නවීකරණය කිරීමේ ක්‍රියාවලියක් සඳහා වූ, ප්‍රතිපත්තිමය පියවර පෙළක් අත්‍යවශ්‍ය වේ. අපනයන ඉලක්ක කරගත් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා, තාක්ෂණය උපයෝගී කර ගැනීමට දිරිමත් කිරීම, ජාත්‍යන්තර වෙළඳපොළට සහ සැපයුම් දාමවලට ප්‍රවේශ වීමට ඇති අවස්ථා වර්ධනය කිරීම, ජාතික මට්ටමේ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම හා සාම්ප්‍රදායික හා නැඟී එන කර්මාන්ත යන දෙඅංශයම සක්‍රීය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික කුසලතාවන්හි අඩුපාඩු පිරවීම අවශ්‍ය වේ. ආර්ථික පරිවර්තනය සඳහා බලපෑමක් ඇති කළ හැකි, ආර්ථික වර්ධනය අරමුණු කරගත් නව ව්‍යවසායයන්, සෑමවිටම නිර්මාණශීලී ව්‍යාපාර ආකෘති හා නිෂ්පාදන සහ සේවාවන්හි මූලය වේ. නව නිපැයුම් සඵල කර ගැනීම සඳහා, නවෝත්පාදන ව්‍යාපාර ආකෘති ස්ථාවර කිරීමට මූල්‍ය පහසුකම් ලබාදීම සහ නව ව්‍යාපාර වාණිජකරණය හා ව්‍යාප්ත කිරීමට අවශ්‍ය ප්‍රාග්ධනය ලබාගැනීමට අවස්ථාව ලබාදීම අතිශය වැදගත් වේ. බොහෝ රටවල් පුළුල්, නව ව්‍යාපාර හිතකාමී පරිසර පද්ධති ප්‍රවේශයන් ඔස්සේ, සිය නව ව්‍යාපාර ප්‍රජාවන්ගේ හැකියාව වර්ධනය කිරීම මගින් මේ වන විට ද නවෝත්පාදන තරගයේ ඉදිරියෙන් සිටියි. ශ්‍රී ලංකාව, කලාපීය හෝ ගෝලීය වෙළඳපොළ අරමුණු කරගත් නව ව්‍යාපාර ආකර්ෂණය කර ගැනීමට හා පවත්වා ගෙන යෑමට අපේක්ෂා කරයි නම් ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කරනු ලබන, නව්‍යතා දිරිමත් කරන ප්‍රතිපත්ති සම්මිශ්‍රණයක් මගින් සරල හා පහසුකම් සලසන ලද ව්‍යාපාර පරිසරයක් නිර්මාණය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

ශ්‍රී ලංකාවේ පර්යේෂණ හා සංවර්ධනය සඳහා වූ ආයෝජන එතරම් සතුටුදායක මට්ටමක නොපවතී. එහෙත්, සුවිශේෂී රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයක් වන ශ්‍රී ලංකා නැනෝතාක්ෂණ ආයතනය (SLINTEC), කාර්මික තාක්ෂණ ආයතනය (ITI) සහ මොරටුව විශ්වවිද්‍යාලය වැනි ආයතන සියල්ලක්ම ශ්‍රී ලාංකික ව්‍යවසායකයන්ට වැඩි අගයක් ලබා දීම උදෙසා පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීමේ සැලකිය යුතු දියුණුවක් අත්පත් කරගෙන ඇත. ශ්‍රී ලංකාව, පර්යේෂණ හා සංවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා දේශීය ආර්ථිකය තුළ මෙවැනි ක්‍රියාමාර්ග තවදුරටත් දිරිගැන්විය යුතුව ඇත. ආයතන මගින් තාක්ෂණික කටයුතු ව්‍යාප්ත කිරීම සපුරාලීමට, ශ්‍රී ලංකාව තුළ සුදුසුකම් සහිත ශ්‍රම බලකායක් සූදානම් කර ගැනීම අත්‍යවශ්‍ය වේ. මෙම අවශ්‍යතාව සපුරාලීම වෙනුවෙන් අධ්‍යාපනික ප්‍රතිපත්ති යොමු කළ යුතු වේ.

### 5. සාර්ව ආර්ථික ස්ථායීතාව වැඩිදියුණු කිරීම

උද්ධමනය ඉහළ යෑම මගින් නිර්මාණය වන අවිනිශ්චිතභාවය, මූර්ත විනිමය අනුපාතිකය අධි ප්‍රමාණය වීම, දිගින් දිගටම පවත්නා අයවැය හිඟය, ඉහළ රාජ්‍ය ණය මට්ටම සහ විදේශ ජංගම ගිණුමේ අඛණ්ඩ හිඟය හේතුවෙන් සාර්ව ආර්ථිකය පිළිබඳ අස්ථාවර භාවයක් ඇතිවිය හැකි අතර, එමගින් ආයෝජකයන්ගේ විශ්වාසය පලුදු වේ. ශ්‍රී ලංකාව වසර අටක් මුළුල්ලේ අඛණ්ඩව අඩු උද්ධමන තත්ත්වයක් පවත්වාගත් අතර, මෙය 2016/17 ගෝලීය තරගකාරිත්ව දර්ශකයෙහි ධනාත්මකව පිළිබිඹු වී ඇත. කෙසේ වෙතත්, රාජ්‍ය අයවැය පරතරය, රාජ්‍ය ණය මට්ටම් හා ණය ශ්‍රේණිගත කිරීම යන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ තරගකාරිත්වය දුර්වල බව හඳුනා ගෙන ඇත. ආදායම පාදක කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සහ ණය වැඩි වීම පාලනය කිරීම මගින් රාජ්‍ය මූල්‍ය හිඟය අඩු කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති රජය මගින් ක්‍රියාවට නංවා ඇත. රජයේ අයවැය පරතරය අඩු කිරීම තුළින් ඉහළ පොලී අනුපාතික යටතේ විදේශීය මූල්‍යනය කිරීමේ අවශ්‍යතාව අඩු කරනු ලබන අතර, එමගින් විදේශීය අංශයේ ඇතිවන අවදානම් තත්ත්වය අවම කෙරෙයි. මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, විදේශ ආයෝජකයන්ගේ විශ්වාසය ගොඩනැගීමට උපකාරී වන ලෙස, සිය මුදල් ප්‍රතිපත්තිය සහ විදේශ විනිමය ප්‍රතිපත්තිය පැහැදිලි ලෙස ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකාවේ වත්මන් සාර්ව ආර්ථික අසමතුලිතතාවන්ට

1

මූලික වන හේතුව රටේ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය හා බොහෝ දුරට සම්බන්ධ බැවින්, ආදායම මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සඳහා ගත් පියවර උපරිම දේශපාලන කැපවීමකින් යුතුව අඛණ්ඩව පවත්වා ගෙන යෑම අවශ්‍ය වේ.

**ඉදිරි දැක්ම**

ශ්‍රී ලංකාව සංවර්ධිත රටක් බවට පත්වීමට තිබූ බොහෝ අවස්ථා අතපසු කර ගෙන ඇති හෙයින් ගෝලීය වෙළඳපොළ තරගකාරිත්වය නැවත අත්කර ගැනීමට තවදුරටත් ප්‍රමාද විය නොහැකිය. රජය මෙම අවශ්‍යතාව මේ වන විට හඳුනා ගෙන ඇතත්, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. මේ සඳහා, සියලුම පාර්ශ්වකරුවන්ගේ සහාය ලැබෙන පුළුල් ක්‍රියාකාරී සැලසුමක් ශ්‍රී ලංකාවට අවශ්‍ය වේ.තරගකාරිත්වය වර්ධනය කිරීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සහ ඒවා ඉදිරියට පවත්වා ගෙන යෑම සඳහා ශක්තිමත් දේශපාලන සහායක් අවශ්‍ය වන අතර, ජාතික සැලසුම් ක්‍රියාත්මක කිරීමට මහජනතාවගේ සහාය ද ලබා ගැනීම වැදගත් වේ. මේ සඳහා මහජන මතය යහපත් ආකාරයට සකස් කර ගැනීම ද අත්‍යවශ්‍ය වේ.

ප්‍රශස්ත සම්පත් බෙදාහැරීමට බාධා පමුණුවන අතර, අත්‍යවශ්‍ය භාණ්ඩ මත පනවන වක්‍ර බදු අඩු ආදායම් ලබන කුටුම්බ මත අහිතකර ලෙස බලපාන අතර, ආර්ථිකය තුළ ආදායම් සහ වියදම් විෂමතා ඇති කරයි. එමනිසා, සෘජු බදු හා වක්‍ර බදු අතර අනුපාතය ඉහළ නංවමින් තිරසාර පදනමින් ආදායම් වර්ධනය කිරීමට හේතුවන පරිදි විශේෂයෙන් ආදායම් බදු වැනි බදු රැස් කිරීම ශක්තිමත් කිරීම පිළිබඳව රජය විසින් අඛණ්ඩ අවධානය යොමු කළ යුතුය. තවද, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස මෑතකාලීනව බදු ආදායම අඩුවීම සඳහා හේතුවූ සාධක අතුරින් බදු පැහැර හැරීම හා මගහැරීම යන සාධක ප්‍රධාන වේ. මෙම තත්ත්වය තුළ ප්‍රධාන වශයෙන් ඉහළ පරිපාලන පිරිවැය හේතුවෙන් අවිධිමත් ආර්ථික අංශය සඳහා සෘජු බදු පැනවීම මගින් ඇති වන ආදායම් ප්‍රතිලාභ මුල් අවස්ථාවේ සීමාසහිත වුවද, ද.දේ.නි. තුළ විශාල දායකත්වයක් සපයන අවිධිමත් අංශය බදු දැල තුළට ගෙන ඒම සඳහා වන යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීම මැදිකාලයේ සිට දිගුකාලීනව රාජ්‍ය ආදායම් මූලාශ්‍රයක් වශයෙන් වැදගත් විය හැකිය. තවද, අවිධිමත් අංශයෙන් බදු අය කිරීම තුළින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරවල වර්ධනය ඉහළ නැංවීමට ද හැකි වන බවට සාක්ෂි පවතී. අවිධිමත් අංශය තුළ පවතින ආයතන විසින් බදු ගෙවීම, එම ආයතන රජය සමඟ සම්බන්ධ වීමේ මගක් වන අතර, එමඟින් එම ආයතනවල නීත්‍යානුකූලභාවය සහ යහපාලනය ඉහළ නැංවීමට ද, එම ආයතන මූල්‍ය පද්ධතිය සමඟ පවත්නා ඒකාබද්ධතාව ඉහළ නැංවීමට ද හේතු වේ. බදු ව්‍යුහය සරල කිරීම, ආරවුල් විසඳීමේ යාන්ත්‍රණ කඩිනම් කිරීම, ව්‍යාපාර සඳහා ලියාපදිංචිය අනිවාර්ය කිරීම වැනි ක්‍රම මගින් අවිධිමත් අංශය බදු දැල තුළට ගෙන ඒම සිදු කළ හැකිය. අවිධිමත් අංශය වෙතින් ආදායම් එක්රැස් කිරීම ඉහළ නැංවීම සඳහා ස්වේච්ඡා බදු අනුකූලතාව ඉහළ නංවනු ලබන ප්‍රතිපත්ති යොදා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. තවද, බදු ගෙවීමේ හැකියාව ඇති සියලු දෙනා බදු දැල තුළට ග්‍රහණය කිරීම සඳහා වන ක්‍රියාමාර්ග රජයේ බදු ප්‍රතිසංස්කරණ තුළ අන්තර්ගත කළ යුතු අතර, බදු අනුකූලතාව ධෛර්යවත් වන පරිදි බදු ගෙවන්නන් හට හිතකාමී පරිසරයක් නිර්මාණය කෙරෙන බදු ප්‍රතිපත්තියක් ඇති කළ යුතුය. බදු ආදායමේ ඵලදායී භාවිතය පෙන්නුම් කිරීම සඳහා රජයේ වියදම්වල විනිවිදභාවය ද වැදගත් වන අතර, එමගින් බදු ගෙවීම සඳහා ජනතාව දිරිගන්වනු ඇත.

**ලාභ සහ ආදායම් මත වන බදු රැස් කිරීම ඉහළ නැංවීම සඳහා අවධානය යොමු කරන අතරම, ඉඩම් හා දේපළ වැනි නිශ්චල දේපළ මත වන බදු පුළුල් කිරීම තුළින් බදු ව්‍යුහයේ අනුක්‍රමික ස්වභාවය ඉහළ නැංවීම හා සෘජු බදු තුළින් ආදායම ඉහළ නැංවීම සඳහා රජය දරන ප්‍රයත්නයට සහාය විය හැකිය.** වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ දේපළ මත බදු, පළාත් පාලන ආයතන මගින් නිශ්චල දේපළ මත පනවන තක්සේරුකරණ බදු හෝ අනුපාතික මත සහ දේපළ ගනුදෙනු සඳහා වන මුද්දර ගාස්තු මත පදනම් වේ. මේ අතර, පළාත් පාලන ආයතනවල ගාස්තු එක් එක් පළාතේ සේවාවලට අදාළව අය කරන අතර, මුද්දර ගාස්තු දේපළ ගනුදෙනු වටිනාකම හා ප්‍රමාණය මත තීරණය වේ. තවද, මුද්දර ගාස්තු වැනි ගනුදෙනු මත පදනම් වන අයකිරීම් ආර්ථික ක්‍රියාකාරකම අනුව සමපාත නොවෙයි. මෙම තත්ත්වය තුළ, සංවර්ධනය නොකළ නේවාසික ඉඩම් වටිනාකම් මත බදු පැනවීම තුළින් පුරෝකථනය කළ හැකි සහ ස්ථාවර රාජ්‍ය ආදායම් ප්‍රවාහයක් සැපයීමට හැකියාව ලැබේ. සාපේක්ෂ වශයෙන් අඩු බදු අනුපාතයක් පවත්වා ගැනීම මගින් ඉඩම් වටිනාකම් මත බදු අයකර ගැනීම පුළුල් පදනමකින් කර ගැනීමට හැකියාව ලබාදෙන අතර, රජය විසින් ඉඩම් වටිනාකම තක්සේරු කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ සපයන නිල තක්සේරුකරණ දත්ත පද්ධතියක් පවත්වාගෙන යෑම තුළින් ඉඩම් තක්සේරුකරණය හා සම්බන්ධ ආවේණික ගැටලු අවම කර ගැනීමට හැකිවේ. තවද, ඉහළ වටිනාකමකින් යුත් ඉඩම් සඳහා ඉහළ බදු අය කෙරෙන බැවින් ඉඩම්

වටිනාකම් බදු මගින් බදු ව්‍යුහයේ අනුක්‍රමික ස්වභාවය ඉහළ නංවනු ලබයි. තවද, ආදායම් බදු වැනි වත්කම් ප්‍රවාහයන්ගෙන් අය කරනු ලබන ඍජු බදුවලට සාපේක්ෂව ඉඩම් දේපළ වැනි වත්කම් සඳහා අය කරන ඍජු බදු පැහැරහැරීම් අඩුය. ඒ අනුව, පුළුල් පදනමකින් යුතුව ඉඩම් වටිනාකම් බදු ක්‍රියාත්මක කිරීම සඳහා වන සාමූහික ප්‍රයත්න, රජය විසින් අපේක්ෂා කරන පරිදි ඍජු බදු ආදායම ඉහළ නැංවීම සඳහා ඉතා වැදගත් වන අතර, ආර්ථිකයේ වෙළඳපොළ අකාර්යක්ෂමතා සහ ආදායම් විෂමතා අඩු කිරීමට ද එය හේතු වේ.

**රාජ්‍ය මූල්‍ය අංශය තුළ පවත්නා සීමිත සම්පත්වලින් උපරිම ප්‍රතිලාභ ලැබිය හැකි පරිදි රජයේ වර්තන පැවරුම් සහ සහනාධාර වැඩසටහන් නිසි පරිදි ඉලක්කගත කිරීම අවශ්‍ය වේ.** මෑතකාලීනව, ආර්ථිකමය වශයෙන් දුෂ්කරතාවලට මුහුණ දෙන කොටස් සහ අඩු ආදායම්ලාභී කුටුම්බවල ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා රජය විසින් ද.දේ.නි.යෙන් සියයට 3-4 ත් අතර ප්‍රමාණයක් වැය කරන ලදී. නමුත්, රජයේ ඇතැම් වර්තන පැවරුම් සහ සහනාධාර වැඩසටහන්වලින් වැඩි කොටසක් ඉහළ ආදායම්ලාභී කුටුම්බ විසින් ලබාගැනීම හේතුවෙන් දරිද්‍රතාව සහ අසමානතාව අඩු කිරීම සම්බන්ධයෙන් එම වැඩසටහන් ඵලදායී නොවන බවට විවාදයක් පවතී. උදාහරණයක් වශයෙන්, සමෘද්ධි සහනාධාර ලාභීන්ගෙන් වැඩි කොටසක් සත්‍ය වශයෙන්ම වැඩසටහන මගින් ඉලක්කගත ආදායම් කාණ්ඩයට අන්තර්ගත නොවන අතර, වසර 14 කට පසුව 2002 අංක 24 දරන සුබසාධන ප්‍රතිලාභ පනත ක්‍රියාවට නැංවීම තුළින් ආරක්ෂණ වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. තවද, ඛනිජ තෙල් නිෂ්පාදන සහ විදුලිය භාවිතා කරන්නන් සඳහා රජය විසින් ඍජු සහනාධාර ලබා නොදුන්නද, රාජ්‍ය ව්‍යවසායවල මූල්‍ය අලාභ රජයේ අයවැය මත මෙන්ම සාමාන්‍ය ජනතාව මත ද පීඩනයක් ඇති කරනු ලබයි. ඩීසල් භාවිතා කරන්නන් සැබෑ වශයෙන්ම අඩු ආදායම්ලාභීන් නොවුණ ද, සාමාන්‍යයෙන් ඛනිජ තෙල් මිලකරණයේ දී පෙට්‍රල් භාවිතා කරන්නන්ට ඉහළ මිලක් ද, ඩීසල් සහ භූමිතෙල් භාවිතා කරන්නන්ට පහළ මිලක් ද නියම වේ. එලෙස ම, විදුලි පරිභෝජනය ඉහළ මට්ටමක පවතින කුටුම්භ සඳහා ඉහළ මිල ගණන් හා අඩුවෙන් විදුලිය පරිභෝජනය කරන කුටුම්බ සඳහා පහළ මිල ගණන් අය කළ ද, සහනාධාරය තුළින් නිශ්චිත වශයෙන්ම අඩු ආදායම්ලාභීන් ඉලක්ක නොකෙරේ. මීට අමතරව, නිෂ්පාදන සහනාධාර ඉලක්කගත කිරීම් ඵලදායී නොවන විට එය සම්පත් බෙදීයෑම අකාර්යක්ෂම කිරීමට හේතු වේ. උදාහරණයක් වශයෙන්, පසුගිය වසර දෙක තුළ ක්‍රමවත් කරන ලද පොහොර සහනාධාරය, පෙරදී නිශ්චිත ඉලක්කගත යාන්ත්‍රණයකින් තොරව ලබා දීම නිසා සහනාධාර බෙදාහැරීමේ දී ඇති වූ අකාර්යක්ෂමතා සහ පොහොර අධිභාවිතය හේතුවෙන් ආර්ථිකයට අපේක්ෂිත ප්‍රතිලාභ අත්නොවීය. විවිධ රජයන් විසින් පොහොර සහනාධාරය ලබාදීම, කෘෂිකාර්මික අංශයේ අඛණ්ඩව අඩු ඵලදායීතාවක් පැවතීමට හේතු වූ අතර, එය වෙනත් ඵලදායී අංශවලට සම්පත් ගලා යෑම වළකාලමින් එම අංශයේම ශ්‍රමය රඳවා තැබීමටත් හේතු විය. මෑතකාලීනව සිදු කරන ලද පොහොර සහනාධාරය ක්‍රමවත් කිරීම හා සමානව, අපේක්ෂිත ප්‍රතිලාභ අත් කර ගැනීම සඳහා සහනාධාර හා පැවරුම් වැඩසටහන් නිසි ලෙස ඉලක්කගත කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම සමාජ ආරක්ෂණ වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන්ගේ ආදායම් තත්ත්වය පිළිබඳ නිරන්තර පරීක්ෂාව ද අවශ්‍ය වේ. පොදු උපයෝගීතා සහ ඛනිජ තෙල් නිෂ්පාදන සැපයීම සම්බන්ධව පවතින භාණ්ඩ සහනාධාර ක්‍රමය වෙනුවට ද ඍජු මුදල් පැවරුම් ක්‍රමයක් භාවිතා කිරීමේ හැකියාව පවතී.

**ජනගහනය වියපත් වීම සහ පසුගිය වසර 12 තුළ රාජ්‍ය සේවයෙහි නියුතු සේවකයන් සංඛ්‍යාව සැලකිය යුතු ලෙස ඉහළ යෑම තුළින් රාජ්‍ය මූල්‍ය අංශය මත වන බලපෑම ඉහළ යෑම පිළිබඳව සලකා බලා රාජ්‍ය අංශයේ විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි තිරසාර බව තහවුරු කළ යුතු අතර, සමස්ත ශ්‍රම බලකායෙහි අවශ්‍යතා සපුරාලීම පිණිස වෙළඳපොළට නැඹුරු වූ විශ්‍රාම වැටුප් හා පාරිතෝෂිත ක්‍රම සඳහා අනුබල දිය යුතුය.** දැනට පවතින විශ්‍රාම වැටුප් ක්‍රමය, අනාගත පරපුර මත දැඩි පීඩනයක් එල්ල කරමින් කෙමෙන් විශාල වන රාජ්‍ය මූල්‍ය ව්‍යසනයක් බවට පත්විය හැකි බවට තර්ක කළ හැකිය. ජනගහනය වේගවත් ලෙස වියපත්වන සහ රාජ්‍ය සේවා නියුක්තිකයන් සංඛ්‍යාව ඉහළ යන වාතාවරණයක් තුළ, ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයෙහි මූල්‍යනය නොකරන ලද විශ්‍රාම වැටුප් වගකීම්, රාජ්‍ය මූල්‍ය අංශය වෙත සැලකිය යුතු පීඩනයක් ඇති කළ හැකිය. විශ්‍රාමිකයන් සංඛ්‍යාව ඉහළ යන අතරතුර ක්‍රමයෙන් වියපත් වන ජනගහනය හා වැඩිවන ආයු අපේක්ෂාව සහ ඉහළ යන විශ්‍රාම දීමනා රජයේ වර්තන වියදම මත සැලකිය යුතු පීඩනයක් ඇති කරයි. රජය විසින් විශ්‍රාම වැටුප් වගකීම් ගෙවීමේදී, කාලයක් තිස්සේ දායකත්වය තුළින් පවත්වාගෙන යනු ලබන වෙනම අරමුදලක් උපයෝගී කරගනු වෙනුවට වර්තන වියදම තුළින් එම වගකීම් පියවීම නිසා රජයේ නිශ්චිත විශ්‍රාම වැටුප් වගකීම පිළිබඳව පැහැදිලි අවබෝධයක් නොමැත. එමනිසා, රජයේ අනාගත විශ්‍රාම වැටුප් වගකීම් ඇස්තමේන්තු කිරීම ඉතා අත්‍යවශ්‍ය වේ. එවැනි ඇස්තමේන්තු, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන ප්‍රමිති ඇතුළු ජාත්‍යන්තර සංඛ්‍යාන ක්‍රමවේද තුළින් ද

නිර්දේශ කර ඇත. බොහෝ දියුණු ආර්ථිකයන්හි නොපියවා ඉතිරිව ඇති රාජ්‍ය අංශයේ විශ්‍රාම වැටුප් වගකීම් ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට සියය ඉක්මවා ඇතැයි ඇස්තමේන්තු කර ඇත. විශ්‍රාම වැටුප් වගකීම්වල විශාලත්වය සලකා බලා, දියුණු ආර්ථික සහ නැඟී එන වෙළඳපොළ ආර්ථිකවල රජයන් විසින් විශ්‍රාම වැටුප් අරමුදල් පිහිටුවා ඇති අතර, එම විශ්‍රාම වැටුප් අරමුදලෙහි වත්කම් ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ, අනාගතයේ විශ්‍රාම වැටුප් වගකීම් පියවීමට යොදාගත හැකිය. ශීඝ්‍රයෙන් වෙනස්වන ජනවිකාශ සංයුතිය සහ රාජ්‍ය සේවා නියුක්තිකයන් සංඛ්‍යාව සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් රජය අපේක්ෂා කළ පරිදි ශ්‍රී ලංකාව ද ඉතා කඩිනමින් විශ්‍රාම වැටුප් අරමුදලක් පිහිටුවීම පිළිබඳව සලකා බැලීම අත්‍යවශ්‍ය වේ. රාජ්‍ය අංශයේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙහි තිරසාරභාවය ඉහළ නැංවීමට ගත හැකි තවත් පියවරක් වන්නේ රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම යෑමේ වයස් සීමාව ක්‍රමයෙන් ඉහළ නැංවීමයි. මේ අතර, ශ්‍රම බලකායෙන් බහුතරයක් සේවයෙහි නිරතව සිටින විධිමත් සහ අවිධිමත් පෞද්ගලික අංශයෙහි සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන් සලකා බලන කල, ජනගහනය වියපත්වීමේ අභියෝගයට මුහුණදීම සඳහා, විශ්‍රාම ප්‍රතිලාභ යෝජනාක්‍රම සහ සෞඛ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ ශක්තිමත් කිරීම තුළින් දිගුකාලීන දැක්මක් සහිත විසඳුම් ඉදිරිපත් කළ යුතු වේ. විශේෂයෙන්ම, දැනට පවතින වෙළඳපොළ පොලී අනුපාතික ව්‍යුහය හේතුවෙන් විශ්‍රාම වැටුප්, රක්ෂණ හා පාරිතෝෂික ක්‍රම සඳහා ඇති ඉල්ලුම අඩු වුවද, ඉලක්කගත රාජ්‍ය මූල්‍ය දිරිගැන්වීම්වල සහාය ඇතිව දිගුකාලීන දැක්මක් ඇති තිරසාර විශ්‍රාම වැටුප්, රක්ෂණ හා පාරිතෝෂික ක්‍රම සංවර්ධනය කිරීම සඳහා මූල්‍ය වෙළඳපොළ යොමු කිරීම ද අත්‍යවශ්‍ය වේ.

**රජය සතු වාණිජ ව්‍යවසායයන් මුහුණ දෙන දැනටමත් හඳුනාගෙන ඇති ගැටලු සහ අභියෝග අවම කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන් කාර්යක්ෂම ලෙස ක්‍රියාවට නැංවීම සහ උපායමාර්ගික නොවන හා ඌන උපයෝජිත රාජ්‍ය වත්කම් සුදුසු බාහිර පාර්ශ්වයන් වෙත පැවරීමට ඇති හැකියාව සලකා බැලීම, මැදි කාලයේ සිට දිගු කාලය දක්වා රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය තහවුරු කිරීම සඳහා ඉතා වැදගත් වේ.** රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ අලාභ සැලකිය යුතු ලෙස ඒකරාශී වීම ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපෑ අතර, රජය සතු විශාල වාණිජ ව්‍යවසායයන්ගේ දුර්වල මූල්‍ය තත්ත්වය තුළින් රටෙහි බැංකු අංශය වෙත ද අහිතකර බලපෑම් එල්ල විය හැකිය. එබැවින්, මෙම රාජ්‍ය ව්‍යවසායයන් නැවත නගාසිටුවීම සඳහා මෑතක දී කෙටුම්පත් කරන ලද ආයතනික අභිප්‍රාය ප්‍රකාශ ක්‍රියාවට නැංවීම තුළින් රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ දුර්වලතාවන්ට හේතු වී ඇති කරුණු සඳහා විසඳුම් ලබා දිය යුතුය. විශේෂයෙන්ම බලශක්තිය ආශ්‍රිත නිෂ්පාදන සමඟ කටයුතු සිදු කරන රජය සතු වාණිජ ව්‍යවසායයන් සඳහා මිල සූත්‍රයක් මත පදනම් වූ මිල නියම කිරීම මගින් අනාගතයේ දී ජාත්‍යන්තර වෙළඳපොළ තුළ බලශක්ති මිල වෙනස්වීම් මගින් ඇතිවිය හැකි සාර්ව ආර්ථික බලපෑම අවම වනු ඇත. ජාත්‍යන්තර වෙළඳපොළ තුළ මිල විචලනයෙහි බලපෑම දේශීය පාරිභෝගිකයන් වෙත විනිවිදභාවයකින් යුක්තව ගලා යෑමට සැලැස්වීම සඳහා අවශ්‍ය යාන්ත්‍රණයක් නිර්මාණය කරන අතර, පිරිවැය පිළිබිඹු කරන මිල යාන්ත්‍රණ වෙත යොමුවීම මගින් රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ වාණිජ ශක්‍යතාවය ශක්තිමත් වනු ඇත. මේ අතර, රජය සතු ඇතැම් වාණිජ ව්‍යවසායයන් සඳහා රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව ආකෘතීන් හඳුන්වාදීම තුළින් පෞද්ගලික අංශයේ ආයෝජන ඉහළ නංවා ගත හැකි අතර, එය රාජ්‍ය මූල්‍ය මත ඇති පීඩනය අඩු කිරීමට ද උපකාරී වනු ඇත. තවද, සාර්ථක රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වයන් ඉහළ වටිනාකමක් සමඟ වඩා සඵල සහ කාර්යක්ෂම සේවා සැපයීමකට මග පාදමින් නව තාක්ෂණය සහ කළමනාකාරිත්වය පිළිබඳ දැනුම ව්‍යාප්ත කරනු ඇත. මේ අතර, හෝටල් වැනි උපායමාර්ගික නොවන රාජ්‍ය වත්කම් බාහිර පාර්ශ්වයන් වෙත පැවරීම මගින් රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යවසායයන් කෙරෙහි අවධානය යොමු කිරීමට රජයට අවකාශ සැලසෙනු ඇත. උපායමාර්ගික නොවන සහ/හෝ ඌන උපයෝජිත රාජ්‍ය වත්කම් වෙත විදේශීය කොටස් හිමිකම් ආයෝජනය සඳහා ඉඩහැරීම මගින් රටෙහි විදේශීය අංශය ද ශක්තිමත් වනු ඇත. එමෙන් ම, දැනටමත් ඉදිකර ඇති යටිතල පහසුකම් ආශ්‍රිතව පෞද්ගලික අංශය විසින් මූලිකත්වය ගනු ලබන වාණිජ ක්‍රියාකාරකම් දිරිමත් කිරීම අවශ්‍ය වන අතර, එමගින් ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම සඳහා අනුබලයක් සැපයෙනු ඇත. කෙසේ නමුත්, විශේෂයෙන් ම, සුදුසු මහජන උපදේශන ක්‍රියාවලි හරහා පාර්ශ්වකරුවන් සහ පොදු ජනතාව වෙත අදාළ ක්‍රියාමාර්ගවල ඇති තාර්කිකභාවය පැහැදිලිව සන්නිවේදනය කර, රටෙහි සමාජ ආර්ථික පසුබිමට ගැළපෙන පරිදි රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ ප්‍රතිසංස්කරණ සිදු කළ යුතුය.

**ආර්ථිකයේ වර්ධන ප්‍රවණතාව තිරසාර පදනමින් පවත්වා ගැනීම සඳහා භෞතික යටිතල පහසුකම් මත අඛණ්ඩව ආයෝජනය කිරීම අත්‍යවශ්‍ය වන අතර, එවැනි ආයෝජන සඳහා විකල්ප මූල්‍යන පහසුකම් සෙවීම සක්‍රීයව සිදු කළ යුතුය.** පශ්චාත් යුද සමය තුළ භෞතික

යටිතල පහසුකම්වල ගුණාත්මකභාවය සහ සුලබතාව සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද, ආදායම් මට්ටම වර්ධනය වීම සහ නාගරීකරණ ප්‍රවණතා හේතුවෙන් සියළුම ආකාරයේ යටිතල පහසුකම් සඳහා වන ඉල්ලුම ඉහළ යා හැකි බැවින් නව යටිතල පහසුකම් සඳහා වන ආයෝජන අඛණ්ඩව සිදු කළ යුතු අතර, පවත්නා යටිතල පහසුකම් අඛණ්ඩව නඩත්තු කිරීම අවශ්‍ය වේ. සාම්ප්‍රදායිකව, යටිතල පහසුකම් මූල්‍යනය කිරීමේ දී ඉහළ දායකත්වයක් දක්වා ඇත්තේ රාජ්‍ය අංශයයි. කෙසේ වෙතත්, රාජ්‍ය මූල්‍ය අවකාශය සීමාසහිත බැවින් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන දිරිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. ජාත්‍යන්තර අත්දැකීම් අනුව, ගාස්තු අය කරන අධිවේගී මාර්ග, පොදු ප්‍රවාහනය, විදුලිබල උත්පාදනය සහ බෙදාහැරීම, විදුලි සංදේශ, වරාය, ජලසම්පාදන හා පිරිපහදුව සහ කසල බැහැර කිරීම වැනි අංශ පෞද්ගලික ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ හැකියාවක් සහිත අංශ ලෙස පෙනී යයි. විදුලි සංදේශ, වරාය, ගුවන් සහ බලශක්ති යන ක්ෂේත්‍රවල මීට පෙර ක්‍රියාත්මක වූ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති සාර්ථක වුවද, එවැනි රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන්හි සම්පූර්ණ ප්‍රතිලාභ ශ්‍රී ලංකාව විසින් තවදුරටත් අත්කර ගත යුතුව ඇත. යටිතල පහසුකම් සඳහා පෞද්ගලික ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයේ අවශ්‍යතාව හඳුනා ගනිමින්, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය බලගැන්වෙන පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාවට නංවා ඇත. ප්‍රතිපත්තිවල පරස්පර විරෝධීභාවය සහ දේශීය වශයෙන් ශක්‍යතාවයෙහි පවතින දුර්වලතා යනාදියෙන් පිළිබිඹු වන පරිදි සැලසුම්කරණය සහ ව්‍යාපෘති නිර්මාණය, ශක්‍යතා අධ්‍යයන සහ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට අදාළව දැකිය හැකි දැනට පවතින නියාමන සහ ආයතනික පරතරයන් සඳහා විසඳුම් සෙවීම මෙන්ම, මෙම අංශවල දැනට සිටින සේවකයන්ගේ සහ මහජනතාවගේ දැනුම්වත්භාවය ඉහළ නැංවීම, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා ඇති ආකර්ෂණීයත්වය වැඩි කිරීමට හේතුවනු ඇත. බහුපාර්ශ්වික සංවර්ධන බැංකු මූල්‍ය සහායයන් පමණක් නොව තම පුළුල් ජාත්‍යන්තර අත්දැකීම් සමඟ දියුණු තාක්ෂණයන් මෙන්ම තාක්ෂණික හැකියාවන් ද රට තුළට ගෙන එන හෙයින් එවැනි බහුපාර්ශ්වික සංවර්ධන බැංකු සමග සක්‍රීයව සම්බන්ධවීම අඛණ්ඩව කළ යුතුය.

**ආර්ථික වර්ධනය ඉහළ නැංවීම, දරිද්‍රතාවය හා අසමානතාව අඩු කිරීම, හදිසි කම්පනවල බලපෑම අවම කිරීම සඳහා ආර්ථික නියෝජිතයන් ශක්තිමත් කිරීම සහ සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා මූල්‍ය අංශය තවදුරටත් වැඩිදියුණු කිරීමට සහයෝගය දැක්වීම අත්‍යවශ්‍ය වේ.** පසුගිය කාලය මුළුල්ලේ බැංකු, අන්‍යෝන්‍ය අරමුදල්, ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්, රක්ෂණ සමාගම් සහ බැංකු නොවන වෙනත් මූල්‍ය ආයතන රාශියක් ඇතුළත් වන පරිදි ගෝලීය මූල්‍ය අංශය අතිශය දියුණු, බහුවිධ මූල්‍ය පද්ධතියක් කරා ශීඝ්‍රයෙන් විකාශනය වී ඇත. මූල්‍ය අංශයේ සිදු වූ මෙම සංවර්ධනයන් ආර්ථික නියෝජිතයින්ට සිය ඉතුරුම් විවිධාංගීකරණය කිරීමට සහ ඵලදායී අරමුණු සඳහා අරමුදල් සපයා ගැනීමට පහසුකම් සපයා ඇත. මෙම මූල්‍ය සේවාවන් සඳහා වන ප්‍රවේශය සහ එම සේවාවල කාර්යක්ෂමතාව, ආර්ථික සෞභාග්‍යය මට්ටම ඉහළ යෑම සහ එසේ ඉහළ යන අනුපාතය තීරණය කිරීම සඳහා උපකාරී වේ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල, ණය වෙළඳපොළ සහ පෞද්ගලික කොටස් සහ ව්‍යවසායික ප්‍රාග්ධන කර්මාන්ත සංවර්ධනය සඳහා විවිධ රජයන් විසින් අඛණ්ඩව ගනු ලැබූ උත්සාහයන් හමුවේ වුව ද, එවැනි වෙළඳපොළ සහ කර්මාන්ත තවදුරටත් ගැටලු සහගත තත්ත්වයක පවතී. ශ්‍රී ලංකා ආර්ථිකය වර්ධනය වෙමින් පවතින හෙයින්, ජාත්‍යන්තර ප්‍රශස්ත පරිචයන් මත පදනම් වූ ගතික නියාමන රාමුවක් තුළ සංවර්ධනය කරන ලද සංකීර්ණ මූල්‍ය උපකරණ භාවිතයට යොමු වීම සඳහා මුදල්, මූල්‍ය ව්‍යුත්පන්න සහ භාණ්ඩ වෙළඳපොළ සඳහා සැලකිය යුතු මට්ටමේ වැඩිදියුණු කිරීම් සිදු කිරීම අවශ්‍ය වේ. එසේම, දේශීය සහ විදේශීය ආයෝජකයින්ගේ වෙළඳපොළ සහභාගිත්වය ඉහළ නැංවීම තුළින් මැදි කාලීනව දියුණු සහ ද්‍රවශීල සාංගමික ණය සහ කොටස් වෙළඳපොළ සංවර්ධනය කිරීම අවශ්‍ය වේ. තවදුරටත්, මූල්‍යන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශ වීම වැනි මෙතෙක් ළඟා කර නොගත් විශේෂිත අවශ්‍යතා සපුරාලීම තුළින් ආර්ථික වශයෙන් පසුගාමී සහ නොවැදගත් ලෙස සලකන ලද ප්‍රදේශයන් ද මූල්‍ය පද්ධතියේ ප්‍රධාන ධාරාවට සක්‍රීයව ඒකාබද්ධ කර ගැනීම කළ යුතු වේ.

**ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් ලබන ආර්ථිකයක් කරා ගමන් කිරීමේ දී මූල්‍ය අංශයේ ඒකාග්‍රතාවය පිළිබඳ නැවත වරක් සිතා බැලිය යුතු අතර, එහිදී බැංකු නොවන ආයතන සහ කුඩා රාජ්‍ය බැංකුවලට වැඩි අවධානයක් ලබා දෙමින් ශක්තිමත් මෙන්ම ගතික මූල්‍ය අංශයක් නිර්මාණය කළ යුතුය.** වර්තමානය වන විට, ශ්‍රී ලංකාව තුළ මහ බැංකුව විසින් නියාමනය වන බලපත්‍රලාභී බැංකු 32 ට අමතරව බලපත්‍රලාභී මුදල් සමාගම් 46 ක් සහ විශේෂ කල් බදු සමාගම් 7 ක් පවතී. මෙම ආයතනවල විශාලත්වයේ පවතින අසමානතා මෙන්ම කුඩා ආයතන බොහොමයක් පැවතීම ද, මෙම ආයතන නියාමනය සහ අධීක්ෂණය කිරීම සංකීර්ණ කරුණක් බවට පත් කර ඇති අතර, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සඳහා අහිතකර බලපෑම් ඇති කරමින් එම

1

ආයතනවල කම්පන සඳහා ඔරොත්තු දීමේ හැකියාව ද අඩු මට්ටමක පවතී. වෙළඳපොළ මත පදනම් වූ මූල්‍ය අංශ ඒකාග්‍රතාවයකට අනුබල දීමෙන් මූල්‍ය ආයතනවලට ජාත්‍යන්තර වෙළඳපොළෙන් අරමුදල් එක් රැස් කර ගැනීම, මෙහෙයුම් පරිමාණයන්හි වාසි අත්කර ගැනීම, තාක්ෂණය යාවත්කාලීන කරගැනීම මගින් කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම, අතරමැදි පිරිවැය අඩු කර ගැනීම සහ එමගින් සිය ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කර ගැනීම සඳහා ද අවකාශ සැලසෙයි. එමෙන්ම, විශාල ප්‍රාග්ධන අවශ්‍යතාවන් මැදිකාලීනව කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ බැංකුවලට ඒකාබද්ධ වීමට අනුබලයක් වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතරම, සමස්ත බැංකු අංශය සතු වත්කම්වලින් සියයට 2.5 කට පමණක් හිමිකම් කියන රජය සතු කුඩා පරිමාණ බැංකු පහක් ඉදිරියේ දී විශාල බැංකු සමඟ එක් වීම තුළින් වඩා අර්ථවත් ලෙස ආර්ථිකය වෙත දායක වනු ඇතැයි බලාපොරොත්තු වේ. ඊට සමගාමීව, නියාමන සහ අධීක්ෂණ රාමුව ද තවදුරටත් ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරෙයි.

**මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අපේක්ෂා කරනු ලබන නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණයක් වෙත සාර්ථකව ප්‍රවේශ වීම සඳහා දැනට පවතින බාධකවලට විසඳුම් ලබා දීම අවශ්‍ය වේ.** නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණයක සාර්ථකත්වය, මහ බැංකුවේ ස්වාධීනත්වය තවදුරටත් තහවුරු වීම, උද්ධමනය පාලනය කිරීමට මහ බැංකුවේ ඇති හැකියාව පිළිබඳ මහජන විශ්වාසය ඉහළ යෑම සහ මුදල් ප්‍රතිපත්තිය සම්ප්‍රේෂණය වීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු වීම මත රඳා පවතී. ගෝලීය වශයෙන් ගත් කල, උද්ධමන ඉලක්කකරණයට අදාළ නෛතික රාමුව තුළින් මහ බැංකුවකට ස්වකීය මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා විනිවිදභාවය පවත්වා ගැනීම හා වගවීම පිළිබඳ ප්‍රතිපාදන ද ඇතුළත්ව ඉහළ ස්වාධීනත්වයක් තහවුරු කරනු ලැබේ. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල, මුදල් නීති පනත යටතේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම තුළින් ආර්ථික සහ මිල ස්ථායීතාව පවත්වා ගෙන යෑමට ශ්‍රී ලංකා මහ බැංකුවට බලතල ලැබෙන අතරම, මහ බැංකුව වෙත සැලකිය යුතු ආයතනික ස්වාධීනත්වයක් ද ලබා දී ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණයක් වෙත ගමන් කිරීමේ දී, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සඳහා වන අඛණ්ඩ උත්සාහයන්හි සහාය ද සහිතව අදාළ නෛතික සහ ආයතනික රාමුව තවදුරටත් ශක්තිමත් කළ යුතු වේ. අයවැය හිඟය මූල්‍යනය කිරීම තුළින් උද්ධමනාත්මක පීඩන පැනනැගිය හැකි බැවින් නැගී එන ආර්ථිකයන්හි මහ බැංකු ද ඇතුළත්ව උද්ධමන ඉලක්කකරණය අනුගමනය කරන බොහෝ මහ බැංකුවල නෛතික රාමු තුළ අයවැය හිඟය මූල්‍යනය කිරීම පැහැදිලිවම සීමා කර හෝ තහනම් කර ඇත. මිල ගවේෂණය සඳහා පහසුකම් සපයන අතර, රජය වෙනුවෙන් අරමුදල් ඉපැයීම සඳහා සුරැකුම්පත් සෘජුවම මහ බැංකුව වෙත පමණක් අලෙවි කිරීම සිදු කෙරෙන, මූළුමනින්ම වෙන්දේසි මත පදනම් කොට ගෙන දැනට පවතින සුරැකුම්පත් අලෙවි පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. එවැනි වැඩිදියුණු කිරීම් තුළින් වෙළඳපොළ සහභාගිවන්නන්ගේ සමපේක්ෂණ හැසිරීම මහ බැංකුවට මෙන්ම, මහජනතාවට අමතර පිරිවැයක් නොවන පරිදි පාලනය කර ගැනීමට හැකි වනවා මෙන්ම, ඒ තුළින් මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණයෙහි දැනට පවතින දුර්වලතා මඟහරවා ගැනීමට ද හැකි වනු ඇත. එය, ශ්‍රී ලංකාව වැනි ඌන සංවර්ධිත මූල්‍ය වෙළඳපොළක කෙටිකාලීන ප්‍රතිපත්ති වෙනස්කම්වලට ප්‍රතිචාර වශයෙන් ඵලදා වක්‍රයේ කෙටිකාලීන අන්තය මෙන්ම විචලතාවකින් යුතු දිගුකාලීන අන්තයට ද බලපෑම් කළ හැකි මූල්‍ය උපකරණ හඳුන්වා දීම සඳහා උපකාරී වනු ඇත. එමෙන්ම, ශ්‍රී ලංකාව මුදල් වර්ධනය සහ විනිමය අනුපාතිකය වැනි උද්ධමනය පාලනයට උපයෝගී කර ගන්නා සාම්ප්‍රදායික විචල්‍යවලින් බැහැරව උද්ධමන ඉලක්කකරණය සඳහා යොමු වන බැවින්, තරගකාරී මූර්ත සඵල විනිමය අනුපාතිකයක් පිළිබිඹු කෙරෙන පරිදි විනිමය අනුපාතිකය තීරණය වන පරිසරයක් තුළ, අඩු සහ ස්ථායී උද්ධමන තත්ත්වයක් පවත්වා ගැනීම සඳහා උද්ධමන අපේක්ෂා පාලනය කිරීම අත්‍යවශ්‍ය වේ.

**ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්තිවල සඵලතාව තවදුරටත් වැඩිදියුණු කිරීමට කටයුතු කරන අතර, අත්‍යවශ්‍ය භාණ්ඩ සැපයුම මත ඇතිවන බලපෑම් හේතුවෙන් දේශීය පාරිභෝගික මිල ගණන් ඇඩි ලෙස උච්චාවචනය නොවන සේ සැපයුම් අංශය කළමනාකරණය කිරීම සඳහා වූ ප්‍රතිපත්ති වෙත අවධානය යොමු කිරීම ද ඉතා වැදගත් වේ.** අයහපත් කාලගුණික තත්ත්ව හේතුවෙන් ඇතිවිය හැකි සැපයුම් තත්ත්වය අඩු වීම හා ජාත්‍යන්තර වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් තාවකාලිකව මිල මට්ටම්හි වෙනස්වීම් ඇති විය හැකි අතර, එමගින් උද්ධමනය හා ගෙවුම් ශේෂය මත පසු බලපෑම් ඇති වීමෙහි හැකියාවක් පවතී. එබැවින්, බාහිර කම්පන හේතුවෙන් ඇතිවන ආනයනික භාණ්ඩ පදනම් කරගත් උද්ධමන තත්ත්වය පාලනය කර ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම මෙන්ම, දේශීය මිල ගණන් මත බලපෑම් ඇති කරනු ලබන අහිතකර සැපයුම් තත්ත්ව පාලනය කිරීම සඳහා අදාළ කෙටිකාලීන හා දිගුකාලීන ක්‍රියාමාර්ග

රජය විසින් අනුගමනය කිරීම ඉතා වැදගත් වේ. ආහාර භෝග වගා කටයුතු පුළුල් කිරීම සඳහා උපයෝගී කළ හැකි ඉඩම් ප්‍රමාණය සීමිත වන බැවින්, මැදිකාලීනව ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා කෘෂි ඵලදායීතාව ඉහළ නැංවීම උදෙසා කෙටිකාලීන ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. තවද, ඇතැම් දේශීය ආහාර භෝග වගාවල අස්වැන්න වසර ගණනාවක් මුළුල්ලේ සතුටුදායක නොවන මට්ටමක පවතී. එමනිසා, ඉහළ කාර්යක්ෂමතාවක් සහිත හා ජෛව සාධක පදනම් කරගත් අහිතකර තත්ත්ව (කෘමි හානි හා රෝග) මෙන්ම, අජෛවීය සාධක පදනම් කරගත් අහිතකර තත්ත්වවලට (නියඟ, පෝෂණ ඌනතා) ඔරොත්තු දෙන ප්‍රභේද මගින් අස්වනු ප්‍රමාණය ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය. මේ අතර, මූල්‍ය වෙළඳපොළ හා කෘෂිකාර්මික අංශය අතර සම්බන්ධතාව ශක්තිමත් කිරීම සහ ඉදිරි වෙළඳ ගිවිසුම් වැනි මූල්‍ය උපකරණ ප්‍රචලිත කිරීම ආර්ථිකයෙහි සැපයුම් තත්ත්වය වැඩිදියුණු කිරීමෙහිලා ඉතා වැදගත් සාධක වේ. තව ද, මේ වන විටත් රජය විසින් වාණිජමය කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර රැසක් ක්‍රියාවට නංවා ඇති අතර, ගොවිපළ කටයුතු යාන්ත්‍රීකරණය, නිෂ්පාදන තත්ත්ව කළමනාකරණය සහ කාර්යක්ෂම පාංශු තත්ත්ව කළමනාකරණය වැනි ක්‍රියාමාර්ග තුළින් නිෂ්පාදනය ඉහළ නැංවීමෙන් සැපයුම් අංශය ශක්තිමත් වනු ඇත.

**දේශගුණික විපර්යාස තුළින් නිතර ඇති වූ කාලගුණික බාධා හේතුවෙන් ප්‍රතිපත්ති සම්පාදනය වඩාත් සංකීර්ණ වී ඇති අතර, ආර්ථිකයේ සියලුම අංශ සඳහා බලපානු ලබන එවැනි බාධා අවම කිරීමට ආපදා සඳහා මුහුණ දීමට විධිමත් පෙර සූදානමක් පැවතීමේ අවශ්‍යතාව පෙන්නුම් කර ඇත.** පසුගිය වසර කිහිපය තුළ දී, මෝසම් කාලගුණික තත්ත්ව මගින් ප්‍රමාණවත් වර්ෂාපතනයක් නොලැබුණු අතර, වර්ෂාපතනය ඉතා කෙටි කාලයක් තුළ කේන්ද්‍රගතවීම තුළින් රට පුරා දැඩි නියං මෙන්ම, ගංවතුර හා නායයෑම් තත්ත්ව ද ඇති විය. අයහපත් කාලගුණික තත්ත්ව හේතුවෙන් සිදු වූ මෙම වෙනස්කම් ආහාර මිල ගණන් හා නිෂ්පාදනය, පානීය ජල සැපයුම, වාරිමාර්ග කටයුතු හා ජලවිදුලි උත්පාදනය සඳහා බෙහෙවින් බලපෑම් ඇති කොට ඇත. එබැවින්, දේශගුණික විපර්යාස හේතුවෙන් ඇතිවන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා මැදිකාලීන හා දිගුකාලීන දැක්මකින් යුතු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කල් ඇතිව ක්‍රියාවට නැංවීම අවශ්‍ය වේ. කෘෂිකාර්මික අංශය තුළ ජල භාවිතයෙහි කාර්යක්ෂමතාව ඉහළ නැංවිය යුතු අතර, නියඟයට ඔරොත්තු දෙන හා ඉහළ අස්වැන්නක් ලබාදෙන වී ප්‍රභේද ප්‍රවර්ධනය කළ යුතුය. කෘෂිකාර්මික ප්‍රජාව අතර අවදානම වෙනත් පාර්ශ්වයකට පැවරීමේ ක්‍රමවේදයක් ලෙස කෘෂි භෝග රක්ෂණ ක්‍රමය ප්‍රවර්ධනය කළ හැකිය. මීට අමතරව, පුළුල් වශයෙන් ස්ථාවර මිල ගණන් යටතේ රට පුරා ඒකාකාර වූ සැපයුම් තත්ත්වයක් පවත්වා ගැනීම සඳහා ප්‍රධාන ධාන්‍ය වර්ග සඳහා ආරක්ෂණ තොග පවත්වා ගැනීම අවශ්‍ය වේ. තවද, ප්‍රධාන විදුලිබල සැපයුම මත රඳා පැවැතීම අඩු කිරීම සඳහා සූර්ය බලශක්තිය වැනි සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභව ප්‍රවර්ධනය කිරීම සඳහා දිරිගැන්වීම් ලබාදීම ද අවශ්‍ය වේ. පුද්ගල ජීවනෝපාය සඳහා කාලගුණික බාධාවලින් සිදුවන බලපෑම අවම කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය නිලධාරීන්ගේ සහ අන්තර්ජාතික සංවර්ධන නියෝජිත ආයතනවල සහභාගිත්වය ඇතිව, ආපදා අධීක්ෂණ හා කළමනාකරණ යාන්ත්‍රණය ශක්තිමත් කළ යුතුව ඇත.

**ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්තිය, මැදි ආදායම් ලබන ආර්ථිකයක වෙනස් වන අවශ්‍යතා සපුරාලිය හැකි පරිදි යළි සකස් කළ යුතු වේ.** රජය විසින් අඛණ්ඩව අධ්‍යාපනය වෙනුවෙන් ආයෝජනය කිරීම, රටේ මානව ප්‍රාග්ධන පදනම වඩාත් පුළුල් කිරීමට හේතු වී ඇත. නිදහස් අධ්‍යාපනය හේතුවෙන් සියයට 93.2 ක සාක්ෂරතා අනුපාතයක් අත්කර ගැනීමටත්, ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන මට්ටම සම්පූර්ණ කිරීමේ ඉහළ අනුපාතයක් වාර්තා කිරීමටත් මෙන්ම, ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශ්වයටම සම අධ්‍යාපන මට්ටම් හිමි වීමත් සිදු වී ඇත. කෙසේ වුවද, අධ්‍යාපනය වෙනුවෙන් සිදු කරනු ලබන ආයෝජනවල බොහෝ ආර්ථික ප්‍රතිලාභ ලැබෙනුයේ පාසල් අධ්‍යාපනය ලබන වසර ගණනට වඩා ශිෂ්‍යයන් උකහා ගන්නා දැනුම හා කුසලතා මතය. කුසලතා සංවර්ධනය එකිනෙක මත පදනම් වන අදියරවලින් සමන්විත සමුච්චිත ජීවන චක්‍ර ක්‍රියාවලියක් බැවින්, මූලික ඥානය ලබා ගැනීමේ ඇති දුර්වලතා හේතුවෙන් රැකියා නිශ්චිත කුසලතා අත්පත් කර ගැනීම ඇතුළුව පශ්චාත් ප්‍රාථමික අධ්‍යාපනයෙහි සාර්ථකත්වයට බලපෑම් ඇති වේ. විද්‍යාව හා තාක්ෂණවේදය, ගණිත හැකියාව, භාෂා සහ සාක්ෂරතාව පිළිබඳ සිසුන්ට ශක්තිමත් පදනමක් සහතික කිරීම සඳහා පෙර පාසල්, ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ අදාළත්වය වැඩිදියුණු කිරීම මෙමගින් නැවතත් අවධාරණය කෙරේ. මෙය වඩාත් පුහුණු කළ හැකි සහ නම්‍යශීලී ශ්‍රම බලකායක් ගොඩනැගීමට උපකාරී වනු ඇත. පන්ති කාමර පරිසරය වඩාත් උසස් මට්ටමකට පත් කිරීමේ දී පාසල් සහ ගුරුවරුන් මුහුණ දෙන ගැටලු තුළින් පැනනගින ඉගෙනීම සඳහා වන බාධකවලට පිළියම් යෙදීමේ දී ඉගැන්වීමේ ක්‍රමවේද සඳහා මැදිහත්වීම තුළින් ගුණාත්මකභාවය වැඩි කිරීමේ ඉහළ ඉඩකඩක් පවතී. මේ සඳහා පාඩම්වල සඵලදායී බව ඉහළ නැංවීම, විෂය මාලාව හා ඉගෙනුම් රටාව සංශෝධනය, අමතර ද්‍රව්‍යාත්මක පහසුකම් සැපයීම,

1

නව තාක්ෂණය හඳුන්වා දීම හා පුහුණු සැසි, දිරි දීමනා හා බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය මගින් ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම යනාදිය වැදගත් වේ. අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය ගුරුවරුන්ගේ ගුණාත්මකභාවය මත රැඳී පවතින බැවින්, නිපුණතා සහිත උපාධිධාරීන් අතර ගුරු වෘත්තීය ජනප්‍රිය කරවීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් දිගුකාලීන උපායමාර්ග සැකසීම අත්‍යවශ්‍ය වේ. මනා අධ්‍යාපනයක් ලබා දීමෙහිලා පාසල්වල සාර්ථකත්වය තීරණය කිරීම සඳහා විදුහල්පතිවරුන්ගේ ගුණාත්මකභාවය බොහෝදුරට වැදගත් වන බව ජාත්‍යන්තර පර්යේෂණ මගින් හෙළි වී ඇත. එම නිසා, විදුහල්පතිවරුන්ගේ ගුණාත්මකභාවය නැංවීම සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුය. ඊට අමතරව, නිදහස් අධ්‍යාපන පහසුකම ලබා දෙනු ලැබුව ද, ඉහළ ආදායම් ලාභීන්ට වඩා දිළිඳු ආර්ථික පසුබිමක් සහිත පුද්ගලයන් අධ්‍යාපනය ලබන වසර ගණන අඩු අතර, ග්‍රාමීය පළාත්වල ජීවත්වන ජනතාව හා දුගී ජනතාව ලබන අධ්‍යාපනයෙහි සහ පුහුණුවෙහි සැලකිය යුතු විෂමතාව පෙන්නුම් කරමින්, එවැනි ප්‍රදේශවල ජීවත්වන පුද්ගලයන් විසින් ලබන අධ්‍යාපනයේ ගුණාත්මකභාවය පහළ මට්ටමක පවතින බව අධ්‍යයන මගින් අනාවරණය වී ඇත. තවද, රජයේ පාසල් මගින් සේවා සැපයීමේ අසමානතාව හේතුකොටගෙන ජනප්‍රිය පාසල් සඳහා ඉහළ ඉල්ලුමක් පවතින අතර, අනෙකුත් පාසල් ඌන උපයෝජනයකට ලක් වී ඇත. ජනප්‍රිය නොවන යැයි සැලකෙන පාසල් ඉලක්ක කරගෙන ඒවායෙහි තත්ත්වය හා ආකර්ෂණීයත්වය ප්‍රවර්ධනය සඳහා ගෙන ඇති මෑතකාලීන රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රශංසනීය වන අතර, එවැනි ප්‍රතිපත්තිවල සාර්ථකත්වය ඉදිරියේ දී දැක ගැනීමට හැකි වනු ඇත. තවද, නගර ආශ්‍රිත පාසල් සඳහා ඉහළ යන ඉල්ලුම සපුරාලීම සඳහා පෞද්ගලික පාසල්වල දායකත්වය ලබා ගැනීම සඳහා පහසුකම් සැපයිය යුතු අතර, එම පාසල්වලින් බහුතරයක් නියාමන රාමුවකට යටත් නොවන හෙයින් එම සේවා සැපයුමේ ප්‍රමිතිය සහ ඒකීයත්වය සහතික කිරීම ද අවශ්‍ය වේ. ප්‍රශස්ථ මට්ටමේ නොපවතින අධ්‍යාපන ආයතන ක්‍රියාත්මක වීම තුළින්, සැලකිය යුතු මූල්‍ය පිරිවැයක් දැරීම මධ්‍යයේ වුව ද, ජනගහනයේ එක්තරා කොටසක් සිය සමකාලීනයන්ට සාපේක්ෂව පසුගාමී තත්ත්වයක පසුවිය හැකිය.

**ආර්ථිකයේ අවශ්‍යතා හා උසස් අධ්‍යාපන පද්ධතිය මගින් ආර්ථිකයට එක් කරන ශ්‍රම සැපයුම අතර ඇති නොගැලපීම දිගින් දිගටම පවතින තත්ත්වයක් තුළ වුව ද, රාජ්‍ය අංශයේ ඉහළ දායකත්වයක් සහිත උසස් අධ්‍යාපනය සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් ගැටලු රාශියක් පැනනැඟී ඇත.** පවතින සීමිත ඉඩ පහසුකම් හේතුවෙන් අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් සුදුසුකම් ලබන සියලු සිසුන් රාජ්‍ය විශ්වවිද්‍යාල වෙත ඇතුළත් කර ගැනීමට නොහැකි වී ඇත. 2016 වසරේ දී සිසුන් 155,550 ක් රජයේ විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීමට සුදුසුකම් ලබා සිටිය ද, රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළත් කර ගැනුනේ එයින් සියයට 18.6 ක් පමණි. උසස් අධ්‍යාපනය සඳහා දේශීය වශයෙන් ප්‍රමාණවත් අවස්ථා නොලැබීමේ ගැටලුව රටේ සංවර්ධනයට මෙන් ම රටේ අනාගතය සඳහා අවශ්‍ය වන මානව සම්පත භාවිත කිරීම සම්බන්ධයෙන් බාධා ඇති කරයි. රාජ්‍ය මූල්‍ය අවකාශය සීමාසහිත වීම මධ්‍යයේ රාජ්‍ය අධ්‍යාපනය පුළුල් කිරීමට අවහිරතා මතුව ඇති අවස්ථාවක සිය සේවා සැපයුම පුළුල් කිරීම සඳහා පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන දිරි ගැන්වීම ඉතා වැදගත් වේ. දේශීය වශයෙන් උසස් අධ්‍යාපන අවස්ථා අහිමි වන මූල්‍ය හැකියාව ඇති සිසුන්ගෙන් සැලකිය යුතු කොටසක් මෙරට ආර්ථිකය මත සැලකිය යුතු විදේශ විනිමය පිරිවැයක් ඇති කරමින් උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා විදේශගත වන බැවින්, පෞද්ගලික අංශයේ සහභාගිත්වය තුළින් උසස් අධ්‍යාපන ප්‍රවේශය සැපයීමේ දී අසමානතා ඇති කරනු ඇතැයි සිතිය නොහැකිය. පෞද්ගලික අධ්‍යාපන ආයතනවල සහභාගිත්වය වැඩි කිරීම සැපයුම් පරතරය පියවීමට අත්‍යවශ්‍ය වන අතරම, එවැනි ආයතන විසින් සපයන අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ද අඩු මට්ටමක නොපැවතිය යුතුය. මෙම තත්ත්වය තුළ, රජයේ හා පෞද්ගලික අංශයේ උසස් අධ්‍යාපනය ආවරණය වන පරිදි උසස් අධ්‍යාපනයට අදාළ තත්ත්ව සහතිකකරණ සහ පිළිගැනීම් ක්‍රමවේදය ශක්තිමත් කිරීම එවැනි ආයතන විසින් සපයන සේවා ප්‍රමිතියට ලක් කිරීමේ දී සැලකිය යුතු කාර්යභාරයක් සිදු කරනු ඇති අතර, සියලු ප්‍රතිලාභීන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීමේ හැකියාව ද සහතික කෙරෙනු ඇත. අනාගතයේ දී ලොව පිළිගත් විශ්වවිද්‍යාල බවට පත්වීමට අවස්ථාව සලසමින් උසස් අධ්‍යාපන ආයතන අතර යහපත් ආකාරයේ තරගකාරිත්වයක් දිරිගැන්වීමට ද මෙය හේතුවනු ඇත. වඩා ප්‍රායෝගික ප්‍රවේශයක් පදනම් කර ගනිමින් අධ්‍යාපන ප්‍රතිපත්තිය රාජ්‍ය, පෞද්ගලික සහ රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයම මිශ්‍ර වූ අධ්‍යාපනය සැපයීමක් වෙත යොමු වීම වැදගත්ය. මේ අතර, සාධක පදනම් කරගත් සංවර්ධනයක සිට කාර්යක්ෂමතාව පදනම් කරගත් සංවර්ධනයක් කරා පරිවර්තනය කිරීමේ දී, ශ්‍රී ලංකාවේ තරගකාරිත්වය උසස් අධ්‍යාපනය සහ පුහුණු අංශය මත විශාල වශයෙන් රඳා පවතී. ප්‍රධාන ක්ෂේත්‍රවල පුහුණු ශ්‍රමයේ හිඟකම සහ නොගැළපීම් හේතුවෙන් ඵලදායීතාව අඩු වනු ඇති අතර, ආර්ථික වර්ධනය

සඳහා වන ඉදිරි අපේක්ෂා ද දුර්වල කරනු ඇත. විවිධ ක්ෂේත්‍රවල නිපුණතා ඇගයීම් තුළින් උපාධිධාරීන්ගේ දැනුම්, තාක්ෂණික හා මෘදු කුසලතා ප්‍රමාණවත් මට්ටමක නොමැති බව අවධාරණය කර ඇති අතර, එය රැකියාවක නියුක්ත වීමට ඔවුන්ගේ ඇති හැකියාව සඳහා පමණක් නොව ඌන සේවා නියුක්තියට ද හේතු වේ. ප්‍රථම උපාධි සහ තාක්ෂණික අධ්‍යාපන වැඩසටහන්වල ගුණාත්මකභාවය හා අදාළතාව වැඩිදියුණු කිරීම අරමුණු කර ගත් මැදිහත්වීම් අවශ්‍ය වන අතර, එමගින් ආර්ථිකයේ ප්‍රධාන පෙළේ කර්මාන්තවල පවතින නිපුණතා පරතරය පියවීමට හැකිවනු ඇත. මේ අතර, පර්යේෂණ හා සංවර්ධන සඳහා වන අඩු ආයෝජන සැලකිල්ලට ගැනීමේ දී, කර්මාන්තවල අවශ්‍යතා හා ගැළපෙන පරිදි තවදුරටත් පර්යේෂණ සහ සංවර්ධන සිදු කිරීම සඳහා පෞද්ගලික අංශය හා එක්ව ඉදිරි දැක්මකින් යුතු කාර්යභාරයක් කිරීමට තෘතීයික ආයතනවලට හැකියාව ඇත. පුළුල් විෂය පරාසයක් කරා පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් ශක්තිමත් කිරීම ද පර්යේෂණ හා සංවර්ධන ප්‍රවර්ධනය කිරීම තුළින් උපකාරී වනු ඇති අතර, එය දේශීය තෘතීයික අධ්‍යාපන ආයතනවලට ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා ගැනීමට සහාය වනු ඇත. ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් ආර්ථිකයක් කරා ගෙන යන ඉතා නිපුණ හා කාර්යක්ෂම ශ්‍රම බලකායක් ගොඩනැගීම සඳහා උසස් අධ්‍යාපන අංශය ඉහළ තලයකට ගෙන ඒමට පැහැදිලි ප්‍රතිපත්ති දිශානතියක් පැවතීමේ අවශ්‍යතාව මෙමගින් පෙන්නුම් කරයි.

**නිදහස් සෞඛ්‍ය සේවාවක් පැවැතිය ද, රෝග ව්‍යාප්තියේ සිදුවෙමින් පවතින වෙනස්කම් හේතුවෙන් සෞඛ්‍ය සේවාවට විවිධ අභියෝගවලට මුහුණදීමට සිදු වී ඇති අතර, තිරසාර පදනමින් සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීමේ උපායමාර්ග සංවර්ධනය කිරීම තුළින් ඒ සඳහා විසඳුම් සෙවිය යුතුය.** බලයට පත් සියලු රජයන් විසින් නිදහස් සෞඛ්‍ය සේවාවක් පවත්වාගෙන යෑමට කැප වී කටයුතු කිරීම හේතුවෙන් සහස්‍ර සංවර්ධන අභිමතාර්ථවල දක්වා ඇති සෞඛ්‍ය දර්ශක කිහිපයක් ළඟා කර ගැනීම මගින් සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය. කෙසේ වෙතත්, ජනගහන විකාශනයේ හා ආර්ථිකයේ සිදුවෙමින් පවතින පරිවර්තන හේතුවෙන් නව අභියෝග කිහිපයක් නිර්මාණය වී ඇත. සාමාන්‍ය ආයු අපේක්ෂාව ඉහළ යෑම, දැඩි නාගරීකරණය සහ ව්‍යායාමවලින් තොර ජීවන රටා වෙත නැඹුරු වීම හේතුවෙන් මෙරට රෝග සඳහා ඉහළ ම දායකත්වයක් දක්වන බෝ-නොවන රෝග වෙත ජනතාව ගොදුරුවීමේ අවදානම ඉහළ යයි. බෝ-නොවන රෝගවල නිධන්ගත ස්වභාවය හේතුවෙන් ඒවා සුව කිරීම සඳහා සාපේක්ෂව විශාල වියදමක් දැරීමට සිදුවන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, විශේෂයෙන් ම බෝ-නොවන රෝග හා සම්බන්ධ සේවා විශාල ප්‍රමාණයක් දිළිඳු පුද්ගලයන් හට ඉතා විශාල පීඩනයක් ඇති කරමින් පෞද්ගලික මුදල් මගින් තම සෞඛ්‍ය සඳහා දරන වියදම් පියවා ගැනීමට සිදු වේ. මේ අතර, ශීඝ්‍රයෙන් වියපත්වන ජනගහනය සඳහා මිල අධික, දීර්ඝකාලීන ප්‍රතිකාර අවශ්‍ය වන බැවින් ඒ සඳහා ද රජයට විශාල වියදමක් දැරීමට සිදුවේ. ජනගහනයේ අනෙක් අන්තය ගත් කල, නීරක්තිය, අඩු බර දරු උපත් සහ වයසට සරිලන උස නොමැතිවීම හා උසට සරිලන බර නොමැතිවීම ඇතුළත් ළමුන්ගේ අඩු බර අනුපාත වැනි සම්මත දර්ශක රැසකට අදාළව ළමුන්ගේ පෝෂණය හා සම්බන්ධ වූ සැලකිය යුතු ගැටලු ප්‍රමාණයකට ශ්‍රී ලංකාව මුහුණ දෙයි. ළදරුවකුගේ ජීවිතයේ පළමු දින 1,000 තුළ පවතින පෝෂණ මට්ටම්, ඔවුන්ගේ බුද්ධි මට්ටම පිළිබඳ වැදගත් නිර්ණායක වේ. පූර්ව හා පශ්චාත් ප්‍රසූති මව්වරුන් සහ ඔවුන්ගේ ළදරුවන් සඳහා මනා පෝෂණයක් ලබා දීමට වැඩි අවධානය යොමු කළ යුතු බව මෙමගින් පෙන්වා දෙයි. සැමට සමාන ලෙස ව්‍යාප්ත වූ සෞඛ්‍ය සේවාවක් පැවැතිය ද, රජයේ සෞඛ්‍ය සේවා සැපයුමේ පවතින ප්‍රාදේශීය විෂමතා හේතුවෙන් රට පුරා සෞඛ්‍ය සේවාවල අසමානතා දැකිය හැකිය. එබැවින්, "නිදහස් සෞඛ්‍ය සේවාව" අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා ආර්ථිකමය වශයෙන් පසුගාමී ප්‍රදේශවලට අවශ්‍ය සහාය ලබාදීම සහ රජයේ සේවා සැපයුම ශක්තිමත් කිරීම සඳහා බහුවිධ ප්‍රවේශයක් අනුගමනය කළ යුතු වේ. රජයේ හා පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවා සපයන්නන් සඳහා වන පිළිගැනීමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම කෙරෙහි රජයේ අවධානය යොමු විය යුතු අතර, එතුළින් සෞඛ්‍ය සේවා සපයන ආයතනවල ගුණාත්මකභාවය, කාර්යක්ෂමතාව හා ඵලදායීතාව වැඩිදියුණු වනු ඇත.

**ශ්‍රී ලංකාවේ සිදුවන ශීඝ්‍ර නාගරීකරණය සමග අපද්‍රව්‍ය කළමනාකරණය වඩාත් අභියෝගාත්මක වී ඇති අතර, මේ සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය ද සහිතව පරිසරයට අවම බලපෑමක් ඇති කරන සහ අඩු පිරිවැයකින් යුතු විසඳුම් හඳුන්වා දීම අවශ්‍යව ඇත.** අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සිදු කරන ආයෝජන හේතුවෙන් යටිතල පහසුකම් ව්‍යාපෘති අතර ඉහළ ප්‍රතිලාභ අනුපාතිකයක් ලැබිය හැකි බව යටිතල පහසුකම් සේවා පිළිබඳව මෑතක දී සිදු කළ ලෝක බැංකු අධ්‍යයනයක් මගින් සොයා ගෙන ඇත. වර්තමානයේ දී, මහ නගර සභා ප්‍රදේශවලින් දෛනිකව සැලකිය යුතු ඝන අපද්‍රව්‍ය ප්‍රමාණයක් උත්පාදනය වන අතර, රට තුළ නිපදවෙන ඝන අපද්‍රව්‍යවලින් විශාල ප්‍රමාණයක් බස්නාහිර පළාත තුළ නිපදවේ.

අපද්‍රව්‍ය අවම කිරීමේ, නැවත භාවිත කිරීමේ සහ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ අවශ්‍යතාව පිළිබඳව අවධාරණය කරන අතර ම, සම්පත් ප්‍රකෘති ස්වභාවයට පත්කිරීම, දහනය කිරීම සහ භූමි ගොඩකිරීම ආදී ක්‍රමවේද මගින් සිදු කෙරෙන අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳව කල්පනාකාරීව අවධානය යොමු කළ යුතුය. විවෘතව සිදුවන කසළ අපහරණය, ප්‍රතිචක්‍රීකරණය කිරීම, කොම්පෝස්ට් බවට පත්කිරීම සහ මහා පරිමාණ පිරිසැකසුම් බවට පරිවර්තනය කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දී තිබුණ ද, දිනපතා සැලකිය යුතු අපද්‍රව්‍ය ප්‍රමාණයක් ගොඩකරන බිම් වෙත මුදා හැරේ. පවතින සීමිත භූමි ප්‍රමාණය සැලකීමේ දී, ශ්‍රී ලංකාව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට පවතින වෙනත් විකල්ප පිළිබඳව සොයා බැලීම අවශ්‍ය වේ. බලශක්තිය සඳහා අපද්‍රව්‍ය යනු, අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ ප්‍රාථමික ක්‍රමවේද තුළින් විදුලිබලය සහ තාපය ලෙස බලශක්තිය ජනනය කිරීම වන අතර, මෙය අන්තරායකාරී නොවන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියේ අංගයක් වේ. මෙම ක්‍රියාවලිය මගින් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් නිර්මාණය කරනවා පමණක් නොව, පොසිල මූලාශ්‍රවලින් උත්පාදනය කෙරෙන බලශක්ති අවශ්‍යතාව පිරිමැසීම තුළින් කාබන් විමෝචනය අඩු කිරීම සහ අපද්‍රව්‍ය ගොඩකිරීම තුළින් සිදුවන මීතේන් උත්පාදනය ද අඩු කෙරෙයි. තවද, මෙම ක්‍රියාවලියෙන් උත්පාදනය වන තාපය පිරිමැසුම්දායී ලෙස ආර්ථික කටයුතු සඳහා නැවත උපයෝගී කරගත හැකිය. ඝන අපද්‍රව්‍ය භූමියක ගොඩකර තැබීම තුළින් නිපදවෙන මීතේන් වායු ප්‍රමාණය හා සැසඳීමේ දී බලශක්තිය සඳහා අපද්‍රව්‍ය දහනය කිරීමේ ක්‍රියාවලියේ දී විමෝචනය වන කාබන් ඩයොක්සයිඩ් වායු ප්‍රමාණය අඩු මට්ටමක පවතී. මෙයට අමතරව, මෙම දහන ක්‍රියාවලියෙන් ශේෂ වන අළු, බැර ලෝහවලින් පොහොසත් වන අතර, යකඩ, ඇලුමිනියම්, තඹ, සින්ක් සහ අනෙකුත් ලෝහ ආදී ද්විතීයික සම්පත් මෙම ශේෂ වන ද්‍රව්‍යවලින් නිස්සාරණය කරගත හැකිය. එක්සත් ජනපද බලශක්ති තොරතුරු පරිපාලන ආයතනයේ දත්තවලට අනුව, නාගරික ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් එකක් භාවිතයෙන් සාමාන්‍යයෙන් කි.වො.පැ. 481 ක විදුලිබලය උත්පාදනය කළ හැකි අතර, මෙම අගය සාමාන්‍යයෙන් දිනකට ශ්‍රී ලංකාවේ ගෘහ ඒකක 200 ක් මගින් පරිභෝජනය කරනු ලබන විදුලිබලයට සමාන වේ. එබැවින්, අපද්‍රව්‍ය බලශක්තිය බවට පරිවර්තනය කිරීමේ ඉඩප්‍රස්ථා පිළිබඳව සොයාබැලීම, නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා සහාය වනවා මෙන්ම එමගින් විකල්ප බලශක්ති ප්‍රභවයක් ද නිර්මාණය කෙරෙනු ඇත.

**සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ කරා ළඟා වීමේ දී ශ්‍රී ලංකාව තම කලාපීය රටවල්වලට වඩා ඉදිරියෙන් සිටිය ද, ඉහළ වර්ධන මාවතක් කරා ගමන් කරමින් 2030 වසර වනවිට සපුරාලිය යුතු වඩා පුළුල් වූ තිරසාර සංවර්ධන අභිමතාර්ථ වෙත ළඟා වීමේ දී නව අභියෝග රැසකට මුහුණ දීමට සිදුවන බව අපේක්ෂා කෙරේ.** සහස්‍ර සංවර්ධන අභිමතාර්ථවලට ඇතුළත් වූ අන්ත දිළිඳුකම, ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සහ සැමට ප්‍රාථමික අධ්‍යාපනය ලබාදීම වැනි ගැටලුවලට අමතරව තිරසාර සංවර්ධන අභිමතාර්ථ මගින් මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන දේශගුණික විපර්යාස, ජෛව විවිධත්වයට හානි වීම, පාලන තන්ත්‍රයේ දුර්වලතා සහ දූෂණය වැනි නවීන ලෝකයේ අභියෝගයන්ට විසඳුම් සෙවීමට උත්සාහ දරයි. එබැවින්, සාමකාමී සහ සියලු දෙනා අන්තර්ගත සමාජයක් මගින් සම්පත් තිරසාර ලෙස යොදා ගනිමින් සංවර්ධන ක්‍රියාවලියක් නිර්මාණය කිරීම වටා කේන්ද්‍රගත වී ඇති බැවින්, මෙම සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ, පශ්චාත් යුද සමය තුළ ඉහළ වර්ධන වේගයක් කරා යන ශ්‍රී ලංකාවට විශේෂයෙන් වැදගත් වේ. මීට අමතරව, සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ සාර්ථකව සපුරා ගත්ත ද, සැමට අධ්‍යාපනය හා සෞඛ්‍ය, ඉහළ සාක්ෂරතා මට්ටමක් සහ ස්ත්‍රී-පුරුෂ සමානත්මතාව ළඟා කර ගැනීමේ ක්‍රියාවලියේ දී විශාල ලෙස රජයේ මැදිහත්වීම සිදු වුව ද, ප්‍රාදේශීය මට්ටමේ පවතින අසමතුලිතතා සහ ආදායම් මට්ටම්වල විෂමතා තවදුරටත් සංවර්ධන අභියෝග ලෙස පවතී. මෙම සන්දර්භය තුළ, සංවර්ධන ප්‍රතිපත්ති තිරසාර සංවර්ධන අභිමතාර්ථ හා ගැළපීම රටෙහි සංවර්ධන ක්‍රියාවලියට ප්‍රයෝජනවත් විය හැකි අතර, ඉහළ යන ආදායම, වෙනස් වන පාරිභෝගික රටාවන්, නාගරීකරණය සහ භූගෝලීය හා ආදායම් ආශ්‍රිත විෂමතා සහ පාරිසරික සංරක්ෂණය වැනි දෑ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ඉහළ මැදි ආදායම් රටක් බවට සංක්‍රමණය වීමේ දී ඇතිවන අභියෝග ජය ගැනීමට උපකාරී වේ. තිරසාර සංවර්ධන අභිමතාර්ථ ළඟාකර ගැනීම කරා යන ගමනේ දී පුළුල් සමාජ ආර්ථික සහභාගිත්වය සහ සර්ව සහභාගිත්වයක් සහිත සංවර්ධන ක්‍රියාවලියක් නිර්මාණය කිරීම හරහා ආර්ථික නිදහස වැඩිදියුණු කිරීමේ රජයේ ස්ථාවරයට අනුබලයක් සපයන අතර ම, එමගින් සියලු ම පාර්ශ්වකරුවන්ට සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රතිලාභ සැලසෙනවා පමණක් නොව, ඒ සඳහා සක්‍රීයව දායක වීමට ද හැකියාව ලැබේ. (ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2015, විශේෂ සටහන 02 : '*ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය, ආදායම් විෂමතාව සහ ළමා පෝෂණ ඌනතා සම්බන්ධයෙන් වන සමාජ-ආර්ථික අභියෝග*' බලන්න)

**ඉහත සඳහන් කළ කරුණු ද ඇතුළත්ව ශ්‍රී ලංකා ආර්ථිකය මුහුණ දී ඇති ව්‍යුහාත්මක අභියෝග පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව පසුගිය වාර්ෂික වාර්තා මගින් මෙන්ම රජය වෙත ඉදිරිපත් කරන ලද වාර්තා මගින් අවධාරණය කර ඇති අතර, ආර්ථික පර්යේෂණවල නියැළෙන්නන් සහ අන්තර්ජාතික සංවර්ධන නියෝජිත ආයතන විසින් ද විවිධ අවස්ථාවල දී අවධාරණය කර ඇත.** රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු කිරීම සහ ඉදිරි දැක්මකින් යුතු මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් ඔස්සේ සාර්ව ආර්ථික මූලධර්ම ශක්තිමත් කරමින්, මෙම ව්‍යුහාත්මක ගැටලු සඳහා පුළුල් මහජන එකඟතාවකට අනුව නොපමාව විසඳුම් සෙවිය යුතු අතර, ආර්ථිකය තිරසාර හා ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ සියලු පුරවැසියන් වෙත ගලායන වර්ධන මාවතක ගමන් කිරීමේ දී මෙවැනි අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ සිදු කිරීම තවදුරටත් ප්‍රමාද කිරීම සිදු නොකළ යුතුය.